ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

2023 ජනවාරි 11 වන බදාදා
3 කාණ්ඩය 06 කලාපය
මිල රු. 80 යි

ධරණී

සතුටින් ජීවිතය දරන්නී

මව ඇඟ විකුණා හරිහම්බ කළ මුදලින් වෛද්‍යවරියක වූ දුවකගේ කතාව

අනුරාධපුරයට යන පාරේ මළවුන්ට පණ දෙන සංජීවනී

මහත්තයාගේ පැටිකිරිය යාළුවෝ ඉස්සරහා දිගහරින්න කලින් දෙපාරක් හිතන්න නෝනේ

විශේෂ අතිරේකයක් නොමිලේ

ඡායාරූප
සමන් අබේසිරිවර්ධන

නීතිඥ
සාරංගා රත්නායක
ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංස්ථාවේ සභාපතිනි

කේරල මනාලියක් ලෙසින් හැඩවෙන්න කැමතිද?

අද 'ධරණී මනාලිය' තුළින් ඉදිරිපත් කරන්නේ සාම්ප්‍රදායික කේරල ක්‍රමයට හැඩගැන්වූ මනාලියක්. මේ මනාලිය හැඩගන්වලා තියෙන්නේ හෝමාගම සැලෝන් නදී රූපලාවණ්‍ය ආයතනයේ නදීරා ගුණවර්ධන විසින්.

"මේ සීයට සීයක්ම කේරල ක්‍රමයට හැඩගැන්වූ සාම්ප්‍රදායික මනාලියක්. විශේෂයෙන් දෙමළ අයත් මේ ක්‍රමයට හැඩවෙන්න ආසයි. සාරිය සඳහා භාවිතා කරලා තියෙන්නේ කොටින් රෙද්දක්. කෙට්ටු සිරුරක් ඇති යුවතියකට තමයි මේ සාරිය වඩාත් ගැලපෙන්නේ.

සාරියේ වර්ණය විදියට ඕෆ් වයිට් තෝරගෙන තියෙනවා. සාරියේ සුන්දරත්වය වැඩි කරන්න ගෝල්ඩ් බෝඩරයක් දලා තියෙනවා. පැහැපත් සමක් ඇති යුවතියකට මේ සාරිය වඩාත් ලස්සනයි.

ඉන්දියානු යුවතියන් ආභරණවලට වඩාත් කැමති නිසා ආභරණවලින් මනාලියගේ පැහැය තවත් වැඩිකළා. සාම්ප්‍රදායික හින්දු ආභරණ කට්ටලයක් තමා භාවිතා කරලා තියෙන්නේ.

ඒ වගේම කොණ්ඩා මෝස්තරයත් සාම්ප්‍රදායික හින්දු ආකාරයට යොදලා තියෙනවා. හින්දු මනාලියන් වැඩි වශයෙන් කැමැත්තක් දක්වන කුඩා මල් බොකේ එකක් ඇයගේ අතට දීලා තියෙනවා.

කේරල මනාලියක් ලෙස හැඩවෙන්න කැමති යුවතියකට මේ මනාලිය බොහෝ සෙයින් වැදගත් වේවි."

හැඩගැන්වීම - නදීරා ගුණවර්ධන
(සැලෝන් නදී)
ඡායාරූප - සඳරුවන් ජයකොඩි
(Creative Eye Photography)
සම්බන්ධීකරණය - ක්‍රිෂාන්ත පුෂ්පකුමාර

ධරණී

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07.
දුරකථන
0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672801
0112672603
ෆැක්ස්
0112 673 451

ධරණී

පුවත් පත නිවසටම ගෙන්වාගන්න අමතන්න
076 1367 623

දැන්වීම් සඳහා අමතන්න
0112 672 601
0112 672 603

අම්මා අපිට මොනවද බොන්න දුන්නා ඊට පස්සේ අම්මයි අක්කයි දෙන්නම බිම ඇදගෙන වැටුණා

මව දුන් වහ පානය කළ පේෂාන් පුතු අවසන් වරට කීවේ ඒ වචන ටිකද?

නාල්ල, ලෝලුවාගොඩ ගමට උඩින් අහස අඳුරට හැරී තිබුණි. වැහිළිහිණින් එකා දෙන්නා තටු සලන්නට වූයේ වැස්ස ළඟ ළඟම එන බව කියන්නටය. එහෙත් ඒ වැස්සට කලින් ගම්මුන්ට අහන්නට ලැබුණේ හිත කීරිගස්වන, කඳුළු වැස්සක් වස්සන දුක්බර කතාවකි.

මේ කතාවේ කතා නායිකාව ධම්මිකායි. ඇයගේ දියණිය අට හැවිරිදි මනුකි දහම්සා ය. සුරතල් පුතු පේෂාන් සවින්ත පස් හැවිරිදිය. සැමියාත් දරු දෙදෙනාත් සමඟ නාල්ල තලාහේන, ලෝලුවාගොඩ ගමේ ජීවත් වූ ඔවුනට මහා යසඉසුරු නොවූවත් අනුන්ට අතනොපා ජීවත්වන්නට හැකි පරිසරයක් තිබුණි. එහෙත් කොරෝනා සමඟින් ඒ ජීවන චක්‍රය වෙනස්විණි. අනතුරුව රට පුරා ඇතිවූ ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් කටයුතුද නැවතුණෙන් ටයිල් ඇල්ලීමේ රැකියාව කළ ධම්මිකාගේ සැමියාටද තාවකාලිකව රැකියාව අහිමි වුණි. එසේ පවුලේ එකම ආදායම් මාර්ගය ඇනහිටියෙන් දරුවන් පාසල් යැවීම, ඔවුනට පොත්පත්, කෑමබීම අරන්දීම ආදී ගැටලුවලට දෙන්නා දෙමහල්ලන්ටද මුහුණදෙන්නට සිදුවිය.

මුලදි මුලදි නෑ හිත මිතුරන් අසල්වාසීන්ගෙන් අඩුපාඩුවක් ඉල්ලාගත්තද එය එකදිගට කරන්නට හැකි දෙයක් නොවුණි. දන්නා කියන අයගෙන් මුදල් ණයට ඉල්ලාගෙන පවුලේ අඩුපාඩු පිරිමසාගන්නවා හැරෙන්නට ධම්මිකාට කළ හැකි යමක්ද නොවුණි. සැමියාට යළි රැකියාව ලැබී, ආදායමක් උපයාගන්නට හැකි වුවද ණය බරින් ඒ වනවිට ඔවුන් කරවටටම ගිලී සිටි බව කියති. 2022 දෙසැම්බරය වනවිට ඇගේ ගෙම්දුලටම පැමිණි ණය හිමියන් ඇයට කෑගසා යන තැනටම පැමිණ තිබුණි. එහෙත් ඇය මෙතරම් ණය වූ බවක්, සැමියාවත් දැනසිටියේ නැතිබවයි දැනගන්නට ලැබුණේ. ඔහු ගෙදර ආ දිනක ඇය නෝක්කාඩු කීවත්, ලැබෙන මුදලින් ජීවත්වෙමු යැයි කියනවා හැරෙන්නට ඔහු වැඩිපුර වාද විවාද කරන අයෙකුද නොවීය.

"මටනම් දැන් මේ කතා අහලා ඇතිවෙලා. ලබන අවුරුද්දේ පුතාව ඉස්කෝලේ යවන්න ඕන.... මං ණයවෙලා" ධම්මිකා කීවාය.

"ණයවෙන්නේ මොකටද? තියෙන හැටියට කාලා බීලා ඉමු."

ඒ සැමියාගේ වදන්ය. ණය වන්නට වූ කාරණාවන් ඔහු දැනසිටියේ නැත. එහෙත්, ඔහු නිවසින් ගිය පසු දරුවන්ගේ කෑමබීමේ සිට තවත් බොහෝ දෑ ඔහු තබාගිය මුදලින් කරන්නට සිදුව තිබුණි. පුතුගේ පෙරපාසල් ගාස්තුද ගෙවිය යුතු විය. දියණියගේ පාසල් අවශ්‍යතාද එහෙම්මමය. තවත් ඕනෑවපාකම් දහසකි. දෙසැම්බර් මාසයේ ඇය පෙරපාසල් ගාස්තු ගෙව්වේ පුතුගේ පෙරපාසලේ හිතවත් මවකගෙන් අතමාරුවක් ඉල්ලාගෙනය.

මේ සියල්ල මැද 2023ට රටම සූදානම් වෙද්දී, ධම්මිකාගේ හිත තිබුණේ වෙනත් සිතිවිල්ලකය. එය වරින්වර ඇගේ සිතට එමින් යමින් තිබූ සිතිවිල්ලක් නමුදු, ඒ ගැන කිසිවකුත් දැන සිටියේ නැත. දරුවන් කුඩා කාලයේ සිට පැණි රස කෑමට කැමති මුත් අරගෙන දෙන්නට නොහැකි අවස්ථා ඇයට එන්න එන්නම වැඩිවිණි.

මේ අතර කොතරම් අගහිඟකම් තිබුණත් එළැඹෙන අලුත් අවුරුද්ද පිළිගන්නට රටම කටයුතු කරද්දී, ධම්මිකා දැඩි තීරණයක් ගෙන තිබුණි. ඒ දරුවන්ටත් වස දී, තමාත් වස පානය කරන්නටය.

ඒ අවාසනාවන්ත මොහොත එළැඹියේ ඉකුත් 28දය. ඇය වස කුප්පි තුනක් සකසාගෙන දරුවන් ළඟට ගන්නේ ඔවුන් තනිකර දමා තමාට පමණක් ඒ ගමන යන්නට බැහැයි සිතුණ නිසාද? අහිංසක දරුවන් දෙදෙනා වස කුප්පි දෙක අතට ගන්නට ඇත්තේ ඒ බඩේ අමාරුවට දෙන බෙහෙතක් හෝ පැණි රස බීමක් යැයි සිතා වන්නට ඇත. **"ඕක බොන්න"** යැයි ඇය දරුවන්ට කියන්නේ ඇයද එය බොන ගමන්ය. පුතු අම්මා අනුව වස කුප්පියම පානය කළ අතර, දියණිය ඉන් බාගයක් බීවාය.

පේෂාන් පුතුට දැනුණ තිත්ත රසය සමඟ, අම්මා දෙස බලද්දී, ඇය බිම ඇදවැටෙනු දුටුවේය. අක්කාද වේදනාවෙන් කෙඳිරිගාමින් බිම ඇද වැටෙද්දී, පුංචි වුණත් ඒ පුතුට යමක් තේරෙන්නට ඇත. ඔහු අසල්වැසි නිවසක් වෙත දිව ගියේය. අම්මා මොනවාද බොන්න දුන් බවත්, දැන් අම්මාත් අක්කාත් බිම වැටී සිටින බවත් පුංචි පේෂාන් කීවේය.

අසල්වැසියන් කිහිපදෙනෙකු එම නිවසට දිවගියේ සැනෙකිනි. සිදුවූයේ කුමක්දැයි අසද්දී, ධම්මිකා කීවේ දරුවන්ටද වස දී තමන්ද වස පානය කළ බවයි. පේෂාන් පුතුද ඒ වනවිට සිටියේ අපහසුවෙනි. ඔහුද ටික වේලාවකින් සිහිසුන් වූයේන්, අසල්වැසියන් එක්ව තිදෙනා මීරිගම මූලික රෝහලට ඇතුළත් කළෝය. ඔවුන් බරපතළ තත්ත්වයෙන් සිටි බැවින් මව චතුපිටිවල මූලික රෝහලටත්, දරු දෙදෙනා කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලටත් මාරුකර යැවිනි. පේෂාන් පුතු ඉකුත් පළමුවනදා ජීවිතය හැරයන්නේ ඔහුගේ ජීවිතය බේරාගැනීමට වෛද්‍යවරුන් දැරූ සියලු උත්සාහයන් ව්‍යර්ථ කරමිනි.

"මේ අම්මා විවිධ පුද්ගලයින්ගෙන් ණයට මුදල් ලබාගෙන, ඒවා ගෙවාගන්න විදියක් නැතුව කණගාටුවෙන් කණස්සල්ලෙන් ඉඳලා තියෙනවා. හැබැයි ඇය ණයවුණු බවක් සැමියා දැනගෙන ඉඳලා නැහැ. ඔහු පිට

අද මවත් සිඟිති පුතුත් මෙලොව නැහැ

දියණිය තවමත් අසාධ්‍ය තත්ත්වයෙන් රෝහලේ

පළාත්වල රැකියාව කරමින් තමයි මේ පවුල නඩත්තු කරලා තියෙන්නේ. ඔහු කියන්නේ අගහිඟකම් තිබුණත් මෙහෙම දෙයක් ඔහු බලාපොරොත්තු නොවුණු බවයි. දරු දෙදෙනාට තමන් වාගේම බිරිඳද සෙනෙහස දැක්වූ බව ඔහුගේ කටඋත්තරයේ සඳහන් වෙනවා."

ඒ නාල්ල පොලිසියේ නිලධාරියෙකු අප ඒ ගැන කළ විමසුමකදී කී දේය. පේෂාන් පුතුගේ අවසන් කටයුතු සිදුව දින දෙකකින් ඒ අම්මාද දෑස් පියාගත්තාය.

"ඇත්තටම මේ මිනිස්සු කාටවත් කරදරයක් නැතුව ජීවත්වුණ අය. අද හැමෝටම ජීවත්වෙන්න අමාරු කාලයක් තමයි මේ. ඒත් ඇයට ඉවසන්න තිබුණා. මේ අම්මා ගොඩක් තැන්වලට ණයවෙලා කියලා කියනවා. ඒ කතාවල ඇත්ත නැත්ත කොහොම වුණත් මේ අහිංසක දරුවෝ දෙන්නගේ ජීවිත ගැන හැමෝම කම්පාවෙනවා."

ඒ ධම්මිකා දන්නා හඳුනන අසල්වැසි කාන්තාවකි. හිත දවන ප්‍රශ්න කොතෙක් තිබුණද ධම්මිකා ගත්තේ 'අම්මා' කෙනෙකු නොගත යුතු තීරණයකි. ඒ දසමසක් කුස දරා ආදරයෙන් ළයට තුරුළුකොට සිප සැනසූ දරු කැකුළු පරලොව යවන්නට තරම් 'අම්මා' කෙනෙකුට නොහැකිය. ඒ සුරලොව සිට අත පා දරුවන්ගේ දුක් කඳුළු නිවන්නට ඉන්නේ අම්මා බැවිනි.

ජීවිතය අතහැරෙන, ජීවිතය අතහරින්නට සිතෙන කවර මොහොතක වුව අම්මා කෙනෙක් ධෛර්යය ලබන්නේද දරු සෙනෙහසිනි. ධම්මිකාගේ බිඳුණු හිතට මේ කිසිවක් නොපෙණුනත්, ජීවිතය අතහැරෙන්නට නොදී ඇයටද ඒ දරු සිහින අල්ලාගන්නට තිබිණි. දැන් සිදුවූ දෙය සිදුවී අහවරය. ලෝකයට මෙය ඉක්මනින් අමතක වී යනු ඇත. එහෙත් දහම්සා දුව සුවවී නිවසට පැමිණෙද්දී, අම්මාත්, මල්ලීත් නැති අඩුව කෙසේ විඳ දරා ගනු ඇද්දැයි සිතාගත නොහැකිය.

■ දීපා වසන්ති එදිරිසිංහ

ඡායාරූප - මනෝජ් එදිරිසිංහ

මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩහිටපු කාලේ වතාවක් අනාථපිණ්ඩික සිටුතුමාගේ ආරාධනයකට එතුමාගේ සිටුමැදුරට වැඩම කරලා තියෙනවා. ඒ වෙලාවේ උන්වහන්සේට දුර තියාම සිටුමැදුරෙ ඉඳන් කාන්තාවක් යටිගිරියෙන් කෑගහන සද්දෙ ඇහුණලු. ඇහුණත් වගේම සිටුමැදුර ඇතුළට යනකොට එතැන එකම ගාලගෝට්ටියක්ලු. අර කාන්තාව කෑගහන සද්දෙට වඩා ඉහළින් සිටුමැදුරේ සේවකයොත් කෑගහනවලු. ඔය අලකලංචි අස්සේ කන් දෙකේ ඇඟිලි ගහගෙන හිටපු අනාථපිණ්ඩික සිටුතුමා බුදු හාමුදුරුවෝ ඉස්සරහට ඇවිල්ලා කිව්වලු "අනේ භාග්‍යවතුන් වහන්ස මට වෙච්ච වින්නැහියක් බලන්නකෝ" කියලා.

ඒ වෙලාවේ බුදුන් වහන්සේ සිටුතුමාට කියලා තියෙනවා "ගෘහපතියනි, අද ඔබේ සිටුමැදුර මසුන් විකුණන තැනක් වගේ" කියලා. ඒ විතරක් නෙවෙයි "අර සිටුමැදුර ඇතුළෙ මසුන් විකුණන කාන්තාවක් වගේ යටිගිරියෙන් කෑගහන කාන්තාව කවුද?" කියලත් ඇහුවලු.

බුදු හාමුදුරුවෝ විතරක් නෙවෙයිනෙ, මහ හයියෙක් කෑකොස්සන් ගහන මිනිස්සු ඉන්න තැනකට ගියාම "අපෝ එතැන නම් මාළු කඩේ වගේ" කියලා අපිත් කියනවනේ. හැබැයි අනාථපිණ්ඩික සිටුතුමාට වෙලා තිබුණේ වෙනම වින්නැහියක්.

"අනේ ස්වාමීනි, මේ ළඟදි මම ධනංජය සිටුතුමාගේ බාල දුව සුජාතාව කරකාර බැඳලා කැන්දගෙන ආවා. බැන්දට පස්සේ තමයි උන්දැගෙ කටේ තරම ගැන දැනගත්තේ. එයා මට විතරක් නෙවෙයි මගේ අම්මට තාත්තට පවා ගහනවා බනිනවා. ඒ විතරක් නෙවෙයි අපේ සිටු පවුලෙ සියලුම ධනය, භවභෝග ඇය ඇගේ පාලනයට අරන්. මේ උන්දැගෙ කරදර ඉවසගන්න බැරිම තැන දැන් සේවකයොත් එක්කෙනා දෙන්නා සිටු මාලිගාව අතෑරලා යන්න පටන් අරන්. අනේ ස්වාමීනි මට අනුකම්පාවෙන් ඇයව යහපත් මාර්ගයට අරන් දෙන්න" කියලා කිව්වලු.

ඊටපස්සෙ සුජාතාව කැඳවපු බුදුන් වහන්සේ ඇයට සත්භාර්යා සූත්‍රය දේශනා කරලා තියෙනවා. බුදු බණ අහලා එදා ඉඳන් කරුණු කාරණා අවබෝධ කරගත්තු සුජාතා සිටු දේවිය යහපත් භාර්යාවක් විදියට කුලගෙයි ජීවත්වුණා කියලයි ජාතක පොතේ සඳහන් වෙන්නේ.

සුජාතාව වගේ නොවුණත් යශෝදරා මහරහත් තෙරණින් වහන්සේත් දවසක් බුදුන් වහන්සේ ළඟට ගිහිල්ලා සප්ත භාර්යාවෝ ගැන මේ විදියට කතා කළා කියලා පූජාවලියේ තිස්එක්වැනි පරිච්ඡේදයේ සඳහන් වෙනවා. එතුමිය පිරිනිවන් පාන්න සූදානම් වෙලා බුදුන් වහන්සේ ළඟට ගිහින් මෙන්න මේ විදියට කිව්වලු.

"ස්වාමීනි, මම මේ සසර ගමනේ අනන්ත අප්‍රමාණ කාලයක් ඔබගේ මාතෘ භාර්යාව විදියට ජීවත් වුණා. ඒ විතරක් නෙවෙයි සකී, භගිනි වගේම දෑසි භාර්යාව විදියටත් ජීවත් වුණා. මම කවදාවත් ඔබ වහන්සේට චෞර, ආර්ය භාර්යාවක් වුණේ නෑ. මේ සසර ගමනේ කිසිම ආත්මභවයක ඔබට වදකභාරියක් වුණේ නෑ. හැමදාමත් ඔබට කීකරුව අවනතව කටයුතු කළා. කවදාවත් මම ඔබේ අවසරයකින් තොරව යමක් කරලා නෑ. එහෙම එකට සසරේ ආපු අපි මුණගැහෙන අන්තිම ආත්මභවය තමයි මේ. අදත් සමුගන්න මට ඔබේ අවසරය ලැබේවා" කියලා ඉල්ලීමක් කළාලු.

යශෝදරාව ගැනයි, සුජාතාව ගැනයි ඔය කතා දෙක මුලින්ම කියලා හිටියේ අද අපි කතා කරන්නේ සප්ත භාර්යාවන් වර්තමාන පවුල් ජීවිතවලට ගැලපෙන්නේ කොහොමද කියන කාරණාව ගැන නිසා.

සුජාතාවට සත් භාර්යා සූත්‍රය දේශනා කරන වෙලාවෙදි වධක භාර්යාව, චෞර භාර්යාව, ආර්ය භාර්යාව, මාතෘ ආර්යාව, භගිනි භාර්යාව, සකී භාර්යාව සහ දෑසි භාර්යාව කියලා භාර්යාවන් සත්දෙනෙකු ගැන බුදුන් වහන්සේ දේශනා කරලා තියෙනවා.

වධක භාර්යාව කියලා කියන්නේ සැමියාට හිතවත් නැති, දයාවක් නැති සහ අන් පුරුෂයන්ට ඇලුම් කරන භාර්යාවට. ඒ වගේම සැමියාගේ වස්තුවෙන් කොටසක් සඟවාගන්නා භාර්යාව චෞරිසම භාර්යාවක්. ගෙදර වැඩක්පලක් නොකරන, සැමියාව යටත් කරගෙන ආර්යාවක් වගේ ඉන්න භාර්යාවට කිව්වේ ආර්යසම භාර්යාව කියලා. ඊළඟට සැමියාට හිතවත්ව අනුකම්පාවෙන් අම්මා කෙනෙක් වගේ ඔහුව රකින භාර්යාව තමයි මාතෘසම භාර්යාව. නංගි කෙනෙක් වගේ සැමියා ඉදිරියෙත් ලැජ්ජාව බය රැකගෙන කීකරුව ඉන්නවා කිව්වේ භගිනිසම භාර්යාව. දෘසිසම භාර්යාව කිව්වේ තමන්ගේ සැමියාගෙන් විල්ලවෙන තාඩන පීඩනවලට තරහා නොගෙන, ඔහුගේ වැරදි ඉවසගෙන ඉන්න පුළුවන් භාර්යාවට. ඊළඟට තමන්ගේ සැමියාව දැක්කම යෙහෙළියක් වගේ සතුටු වෙන, සිල්වත්, කුලවත්, පවිත්‍ර භාර්යාව බුදුන් වහන්සේ හැඳින්වුවේ සකී භාර්යාව කියලා. මේ සත් භාර්යාවන්ගෙන් සාර්ථක පවුල් ජීවිතයකට ගැලපෙන හොඳම භාර්යාව කවුද?

ඒ ගැන මේ කතාබහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අත්තනායක එම් හේරත් මහතා සමඟින්.

තාත්තා නොබී ඉන්න අම්මා ඒකට ඉඩ

"මේ කතාව පටන්ගන්නකොට සත් භාර්යාවෝ කියන්නෙ කවුද කියලා වෙන වෙනම පැහැදිලි කරලා තියෙන නිසා මම ආපහු ඒ ගැන සඳහන් කරන්න යන්නෙ නෑ. හැබැයි බුදුන්ගේ කාලේ ඉඳලා අද මේ මොහොත වෙනකම්ම අපේ කාන්තාවන්ගෙන් 40%ක් තාමත් යන්නේ එදා යශෝදරාව ගිය අඩිපාරේ. ඒ කිව්වේ ඒ අය 40% තාමත් ජීවත්වෙන්නේ මාතෘ, සකී, භගිනි කියන භාර්යාවෝ විදියට. හැබැයි ඉතින් මොකක්දෝ අවාසනාවකට ඉතුරු 60% කටයුතු කරන්නේ අර සුජාතාව විවාහ වෙලා මුල් කාලෙදි කටයුතු කරපු විදියට. ඒ කිව්වේ අර කලින් කියපු චෞර, ආර්ය සහ වධකභාරියෝ විදියට.

මේ පහුගිය දවසක මට අවුරුදු 45ක විතර නාඳුනන පිරිමි කෙනෙක් දුරකතනයෙන් කතා කරලා හරිම දුක හිතෙන කතාවක් කිව්වා. ඔහු කියනවා 'අනේ බුදු මහත්තයෝ මම කසාඳ බැඳපු දවසෙ ඉඳන් දරුවෝ නිසා පුදුම දුකක් විඳගෙන මගේ නෝනා එක්ක පවුල් කන්නෙ' කියලා. 'දරුවෝ නැත්නම් මේ වෙනකොට දහස් වාරයක් නෝනව දික්කසාද කරලා ඉවරයි' කියලා. ඊටපස්සේ මම ඇහැව්වා එහෙම කියන්න හේතුව මොකක්ද කියලා. පස්සේ ඔහු ඉතාමත් බයාදු ස්වරයෙන් මට කිව්වා 'අනේ මහත්තයෝ කවුරුවත් කිව්වට විශ්වාස කරන්නෙ නෑ මගේ නෝනා මට හරියට ගහනවා' කියලා. 'පොඩි වරදක් වුණත් මට අතේ තියෙන පොල්කටු හැන්දෙන් පවා දමලා ගහනවා' කියලා. එක දවසක් රැකියාවට ගිහිල්ලා ගෙදර එන්න පොඩ්ඩක් ප්‍රමාද වුණා කියලා ගෙට ගොඩවුණ හැටියේ බිත්තියට තියලා තද කරලා බෙල්ල මිරිකගෙන හිටියැයි කියලත් කිව්වා. පඩි දවසට පඩි පැකට් එකෙන් එක රුපියල් පන්සීයක් දෙකක් හරි අඩුව දුන්නොත් නිදහසේ බත් කටක්වත් කන්න දෙන්නෙ නැතිලු. අනික ඔහුගේ හැම දේපළකින්ම කොටසක අයිතිය රණ්ඩු කරලා බලහත්කාරයෙන් ඇගේ නමට පවරගෙන තියෙනවා.

ඔය කතාව විතරක් නෙවෙයි ඕකට මම තවත් හොඳ උදාහරණයක් කියන්නම්. මම විශ්වවිද්‍යාලයේ උගන්වපු කාලේ මගෙන් ඉගෙනගත්තු දක්ෂ සිසුවියක් හිටියා සමාධි කියලා. ඇයගේ පියා ඉතාමත් අධික විදියට බීමත්කමට ඇබ්බැහි වෙලා හිටපු පුද්ගලයෙක්. දවසක් ඔය දැරිය මාත් එක්ක කතාබහ කරපු වෙලාවක මම නිකමට වගේ ඇගෙන් ඇහුවා 'දැන් කොහොමද දුව තාත්තගේ වෙනසක් නැද්ද?' කියලා. පස්සේ ඇය ඉතාමත් කණගාටුවෙන් මට කිව්වා 'මොන පිස්සුද සර් තාත්තා බොන එක නතර කරන්නෙත් නෑ. තාත්තා අමාරුවෙන් හරි නොබී ඉන්න උත්සාහ කළත් අපේ අම්මා, තාත්තට ඒකට ඉඩ දෙන්නෙත් නෑ' කියලා. අම්මා, තාත්තට නොබී ඉන්න දෙන්නෙ නැහැයි කියපු කතාවක් මම ඔය ඇහුවමයි. ඒ නිසා මම ඒ දුවගෙන් ඒ කතාවේ තේරුම මොකක්ද කියලා ඇහුවා.

එතකොට ඒ දුව මට කිව්වා 'සර් අපේ අම්මා හැමදාම තාත්තා බීලා එනකල් බලන් ඉන්නේ තාත්තගේ සාක්කුවෙන් රුපියල් පන්සීයක් දහක් හොරකම් කරගන්න. එකපාරක් තාත්තා හොඳටම බීලා ආපු දවසක තාත්තගේ අතේ තිබුණු බ්‍රේස්ලට් එක අම්මා ගලවගෙන. අන්තිමට පහුවදා උදේ අම්මම තාත්තාට බැන්නලු කනමදයා වගේ බීගෙන අතේ කරේ තියෙන ඒවත් වට්ටගෙන ගෙදර එන්නේ' කියලා.

ඉතින් බලන්න මම ඔය කියපු කතා දෙකේම හිටපු බිරින්දෑවරු දෙන්නා ළඟම ස්වාමියාගේ දේ හොරකම් කරන චෞර භාර්යාවගෙත්, සැමියා ගැන කිසිම දයාවක් අනුකම්පාවක් නැති වධක භාර්යාගෙ වගේම සැමියාව යටත් කරගෙන ජීවත්වෙන ආර්ය භාර්යාවගෙත් ගති ලක්ෂණ කොයිතරම් තියෙනවද කියලා. ඉතින් ඔහොම බිරින්දෑවරු එක්ක ජීවත්වෙලා ස්වාමි පුරුෂයෙකුට මැරෙනතුරාවට සුගතියක්, සතුටක්, සැනසීමක් තියෙයිද? ඔය කතාවට කියපු බිරින්දෑවරු දෙන්නා විතරක් නෙවෙයි අද සමාජයේ සමහර කාන්තාවෝ ස්වාමියාට වඩා රැකියාවෙන්, නිලයෙන්, බලයෙන් වගේම උගත්කමෙන් ඉහළට ගියාමත් තමන්ගේ ස්වාමිපුරුෂයාව යටත් කරගෙන ඉන්න බලනවා."

එතැනින් පස්සේ දෑසි භාර්යාව, මාතෘ භාර්යාව වගේම සකී භාර්යාව ගැනත් අත්තනායක මහතා කිව්වේ මේ විදියේ කතාවක්.

"අපි අතරේ ඉන්න කාන්තාවෝ දිහා වෙන වෙනම බැලුවම ඔය භාර්යාවෝ හත්දෙනාගේ ගොඩට වෙනම වැටෙන අයව දවසකට ඕනතරම් මුණගැහෙනවා. ඒ ගැන කතා කරනවා නම් ඕනතරම් උදාහරණ තියෙනවා කියන්න. ඒ නිසා ඔය දෑසි, මාතෘ, සකී කියන ගොඩට වැටෙන භාර්යාවෝ ගැනත් මම මටම අහන්න දකින්න ලැබුණු අත්දැකීම් දෙක තුනකින් පැහැදිලි කරන්නම්.

මම ජීවත්වෙන මහනුවර පළාතේ මම දන්න කියන පවුලක් හිටියා. ඒ අය හරිම දුප්පත්. දරු තුන්දෙනෙකුත් හිටියා. සැමියයි බිරිඳයි බොහෝම අමාරුවෙන් තමයි ඒ අයට ඉගැන්නුවේ. ඒ ප්‍රශ්න සේරම අස්සේ මේ ගෙදර මනුස්සයා පුදුම විදියට අර බිරිඳව සැක කරනවා. ඒ මනුස්සයට නොකියා රෑකට හදිසියකට දෙට්ට පිලකට ගියත් තෝ මට හොරෙන් හොර මිනිහට දෙර ඇරියද කියලා අහලා ගහනවා. මම ඔය ගැන හොඳටම දන්නවා. මොකද ඔය ජෝඩුව මහ

කොල්ලො, කෙල්ලො කසාද බඳින්න ඕන තමන්ගේ හොඳම යාළුවාව. මාතෘ භාර්යාවෝ අද කාලෙට ගැලපෙන්නෙ නෑ

හැදුවත් දෙන්නෙ නෑ

රෑට හට්ටි මුට්ටි පොළොවේ ගහගෙන ගහ මරාගන්නකොට අර පොඩි උන් මරලතෝනි දෙනවා. එතකොට අහල පහල ගෙවල්වල අපි තමයි වලි බේරන්න යන්නේ. හැබැයි ඉතින් අපි ගිහින් අර මනුස්සයට දෙකක් දීලා පැත්තකට ඇදලා ගන්න හදනකොට අර ගෑනු මනුස්සයා මහ හයියෙන් වැලහින්නි වගේ අඬනවා 'අනේ මහත්තයෝ මට කොච්චර ගැහුවත් මගේ මිනිහට ගහන්න එපා. වී මගේ දරුවන්ගේ තාත්තා' කියලා. අනේ ඉතින් මුන් දෙන්නා රෑට ගහ මරාගෙන උදේට මොකුත් නොවුණ ගානට අත් බැඳගෙන ජෝඩු දලා පාරෙත් බැහැලා යනවා.

දැන් මම ඔය කතාව කියනකොට කෙනෙකුට හිතෙන්න පුළුවන් අන්න නියම දෘඩ භාර්යාවක් කියලා. කතාව ඇත්ත. සැමියා කොයිතරම් ගැහුවත් බැන්නත් වී'වා අමතක කරලා ඔහුට සමාව දෙන ඇය දෘඩ භාර්යාවක් තමයි. නමුත් අපේ මහත්තුරු ඔය දෘඩ භාර්යාව අල්ලගෙන තියෙන්නේ නැට්ටෙන්. මොකද බුදුන් වහන්සේ වී කාලේ දෘඩ භාර්යාව කිව්වේ ගහන්න ගහන්න වඳින ගෑනිට නෙවෙයි. ඔහුගේ ආර්ථික ප්‍රශ්න නිසා සිදුවන සුළු සුළු අඩුපාඩු පුළුවන් තරම් ඉවසගෙන ඉන්න භාර්යාවට. අන්න වී නිසා මේ දෘඩ භාර්යාව වගේ අනවශ්‍ය විදියට ඔලුව නවාගෙන ඉන්න භාර්යාවො අද සමාජෙට කොහෙත්ම ගැලපෙන්නේ නෑ.

ඊළඟට ඔය කියන මාතෘ භාර්යාවත් අද සමාජයට ප්‍රායෝගිකව ගැලපෙන්නෙ නෑ කියලයි මට හිතෙන්නේ. මොකද සමහර ගෑනු උදවිය ඉන්නවා මහත්තයා උදේට ගෙදරින් යනකොටත් කුස්සිඅම්මා වගේ දැලි පෙරාගෙන කුස්සියේ. රෑට ගෙට ගොඩවෙනකොටත් අර ඇඳුම පිටින්ම මූණකටවත් හෝදන්නෙ නැතුව කුස්සියේ. ඊළඟට මහත්තයට ආසාවකටවත් යාළුවෙක් හම්බවෙන්න යන්න දෙන්නෙ නෑ, කැමති දෙයක් කන්න බොන්න දෙන්නෙ නෑ, කැමති ඇඳුමක් අඳින්න දෙන්නෙ නෑ, වී වගේම රාජකාරි වැඩකටවත් ගෑනු කෙනෙක් එක්ක වැඩිපුර කතාබහ කළොත් එදට ගෙදර මහ විනාසයක්. ඉතින් එහෙව් ගැහැනුන්ගෙන් පිරිමියෙක් සුන්දර බිරිඳක්, ප්‍රේමවන්තියක් දකින්නෙ කොහොමද? මොකද සාර්ථක පවුල් ජීවිතයකට වීක අත්‍යවශ්‍යයි. වී අය හරියට හැසිරෙන්නේ අර අපි පුංචි කාලේ අම්මලා වේවැලක් අරගෙන හරි වැරදි කියාදිදී පස්සෙන් පැන්නුවා වගේ. අන්තිමට වෙන්නෙ අම්මට ගෙදර ඉන්න කියලා අර මනුස්සයා ආදරේ කරන්න පිටින් කෙල්ලෙක් හොයාගෙන යන එක. මොකද අම්මගෙ ආදරෙයි, බිරිඳගෙ ආදරෙයි අතර ලොකු වෙනසක් පිරිමියෙකුට දැනෙන නිසා. ඊටපස්සේ ඉතින් මං මෙච්චර කඹුරලත් මුගෙ වනචරකමට මූ වෙන ගෑනු හොයන් ගියාය කියලා දේවාල ගානේ ගිහිල්ලා අර මනුස්සයාට පලි ගහනවා.

ඊළඟට සැමියට නංගි කෙනෙක් වගේ ජීවත්වෙන භගිනි භාර්යාවත් අද කාලෙට ගැලපෙන්නේ නෑ. මොකද කොයිවෙලාවෙත් එයා මෙයාට අයියා ගානවා. මෙයා අරයාට සුදු නංගියා ගානවා. ඉතින් පැත්තක ඉන්න අපිට හිතාගන්න බෑ මුන් දෙන්නා ගෑනියි මිනිහයිද, එක කුස උපන් උන්ද කියලා. නමුත් මේ භගිනි භාර්යාවත් අද වෙනකොට අර දෘඩ භාර්යාවට වගේ අපේ උදවිය නැට්ටෙන් අල්ලගෙන ඉන්නේ. මොකද බුදුන් වහන්සේ සැමියට නංගි කෙනෙක් වගේ ඉන්න කියලා කිව්වේ ඔහුට ජ්‍යේෂ්ඨ සහෝදරයෙකුට වගේ ගරුබුහුමන් දක්වන්න කියන එකට මිසක් මගේ අයියා, මගේ නංගි කියලා ලොකු හාට් එකක් දලා ෆෝන් එකේ නොම්මරේ සේව් කරගන්න එකටවත්, මගේ සුදු නංගියා කියලා අතේ පයේ පච්චයක් කොටාගන්න එකටවත් නෙවෙයි."

වී නිසා මේ භාර්යාවෝ හත්දෙනාගෙන් සාර්ථක පවුල් ජීවිතයකට හොඳටම ගැලපෙන්නේ තමන්ගේ ස්වාමියා එක්ක මිතුරියක් විදියට කටයුතු කරන්න පුළුවන් සකී භාර්යාවට කියලයි මහාචාර්යවරයා කිව්වේ.

"මං එහෙම කියන්නේ මොකද දන්නවද? බිරිඳක් තමන්ගේ ස්වාමියාට මිතුරියක් වගේ වුණහම මිතුරියක් ඇතුළේ ප්‍රේමවන්තියක්ව අමුතුවෙන් අඹන්න ඕනෙ නැති නිසා. එතකොට හොඳ ප්‍රේමවන්තියක් ඇතුළේ අමුතුවෙන් දයාබර බිරිඳක්ව අඹලාගන්න අවශ්‍ය වෙන්නෙත් නෑ. එහෙම වුණාම අවශ්‍ය වෙලාවට අම්මා කෙනෙක් වගේ තමන්ගේ සැමියාව රැකබලාගන්නත්, හොඳ නරක කියලා දෙන්නත්, ඕනෙම දෙයක් කියලා කරලා විහිළුවෙන් තහළුවෙන් ඔහුව සතුටින් තියන්නත් ඇයට පුළුවන්කම තියෙනවා. අනික බිරිඳක් හොඳ මිතුරියක් වුණහම ඕනෙම දෙයක් ඇයට කියන්න කිසිම ස්වාමි පුරුෂයෙක් දෙපාරක් හිතන්නේ නෑ. එතකොට සැමියා බිරිඳටවත්, බිරිඳ සැමියාටවත් අනවශ්‍ය විදියට බයවෙන්න අවශ්‍ය නෑ. වී වගේම හොරබොරුව කියන එක පවුල් ජීවිතෙන් ඉබේටම නැතිවෙලා යනවා. අනික දෙන්නා දෙමහල්ලෝ යාළුවෝ වගේ ඉන්නකොට එයා මෙයාගෙවත්, මෙයා එයාගෙවත් දේවල් හොරකම් කරන්නෙ, ගහමරාගන්නෙ නෑ. වී නිසා මට නම් හිතෙන්නේ ස්වාමි පුරුෂයෙකුට තැනේ හැටියට අවශ්‍ය විදියට ආදරේ කරන්න පුළුවන් හොඳම භාර්යාව සකී භාර්යාව කියලා. මොකද ඇගෙන් බිරිඳ අවශ්‍ය වෙලාවට බිරිඳත්, ප්‍රේමවන්තිය දකින්න කැමති වෙලාවට ප්‍රේමවන්තියවත්, හරි වැරැද්ද කියලා දෙන, දයාව, සෙනෙහස අවශ්‍ය වෙලාවට අම්මා කෙනෙක්වත් එළියට ගන්න පුළුවන්.

අන්න වී නිසා අද මම අපේ පුතාලට කියන්නේ උඹලා කසාදයක් කරගන්නකොට යාළුවෙක් විදියට ඉන්න පුළුවන් කෙල්ලෙක්ව තෝරගනිල්ලා. උඹලගෙ හොඳම යාළුවා කෙල්ලෙක් නම් ගිහින් වී'කිගෙන් බය නැතුව යාළුවෙන්න අහපල්ලා. මොකද කසාද බඳින්න කලින් යාළුවෝ විදියට ඉන්න උන්ට බැන්දට පස්සේ උන්ගේ අඩුවැඩිය කවුරුත් ඇවිල්ලා අමුතුවෙන් කියලා දෙන්න ඕනෙ නෑ කියලයි මට හිතෙන්නේ. කාලයක් යාළුවෝ විදියට ඉඳලා තියෙන නිසා උන් උන්ගේ අඩුවැඩි ගැන ඔය කොයිකාටත් වඩා හොඳට දන්නවා. හොඳ බිරිඳකට යාළුවෙක් වෙන්න බැරි වුණත්, හොඳ යාළුවෙකුට අනිවාර්යයෙන්ම හොඳ බිරිඳක් වෙන්න පුළුවන් කියලා අර කතාවටත් කියන්නේ අන්න වීකයි."

■ **ලිහිණි මධුෂිකා**

මැහුම් පංති

2023 සඳහා ජනවාරි මාසයේදී නව පංති ආරම්භ වේ. රශිකා කාර්යකරුවන මහත්මිය විසින්ම පාඨමාලා සියල්ල මෙහෙයවනු ලබයි.

- ★ ටේලරින් මැහුම් හා මෝස්තර සහිත ඇඳුම් මැසීමේ ඩිප්ලෝමා පාඨමාලාව NVQ Level 3,4 මට්ටම සඳහා ඉදිරිපත් විය හැක.
- ★ පැටර්න් මේකර් ඇන්ඩ් ෆැෂන් ඩිසයිනින්ග් පාඨමාලාව (Pattern Maker and Fashion Design Course) NVQ Level 3,4 මට්ටම සඳහා ඉදිරිපත් විය හැක.
- ★ සාරි හැට්ට හා මංගල ඇඳුම් මැසීමේ පාඨමාලාව
- ★ ළමා ඇඳුම් හා කාන්තා ඩිසයිනින්ග් ඇඳුම් සඳහා පැටර්න් සෑදීම හා එම මෝස්තර මැසීමේ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සාප්පුවල විකිණීමට ඇඳුම් මැසීමේදී හැදෑරිය යුතු පාඨමාලාවකි)

නුගේගොඩ, මීගමුව, ගම්පහ යන මධ්‍යස්ථාන වලදී පැවැත්වේ. වැඩි විස්තර සඳහා දැන්වීම් නැරඹීමට Rashika Kariyakarawana Official Face Book වෙත පිවිසෙන්න.

0766508228 / 0775416929 / 0712978194

මහතයි කියලා කතා හදපු අයට කෙට්ටු වෙලා පෙන්නුවා

කළුයි කියලා ප්‍රතික්ෂේප කරපු අයට සුදු වෙලා පෙන්නුවා

විශ්වනී විලෝචනා

“කවදාකහරි ලොකු සල්ලිකාරයෙක් වෙලා අම්මට සලකන්නයි මට ඕන වුණේ. ඒත් මිනිස්සු හැමවෙලේම මගේ ඇඟට හිනාවෙනවා. ඒක මට තවත් ඉවසන්න බැහැ අම්මේ...”

ඉන්දියානු ජාතික ප්‍රියංකා ගුප්තා අවුරුදු 20ක තරුණියක්. ස්ථූලතාවය නිසා ඇය නිතරම වගේ අනිත් අයගේ සමච්චලේට ලක්වුණා. ප්‍රියංකාගේ අම්මා දවසක් මහ පච්කාර දසුනක් දැක්කා. ඒ කාමරේ සිවිලිමේ එල්ලෙන ප්‍රියංකාගේ මිනිය. ඇය අම්මට ලියාපු ඔය ලිපිය ලැබිලා තියෙන්නේ එතැනම බිම තිබිලා.

ඉසබෙලා ටෙචනෝර් ජීවත්වුණේ ඇමෙරිකාවේ. කෙල්ලට දහයයි. පංතියේ හිටපු කළුම ළමයා ඉසබෙලා. සමේ පාට නිසා ඇය හැමදෑම වගේ හිරිහැරවලට ලක්වුණා. ඉසබෙලාගෙ අම්මා මේ සම්බන්ධයෙන් ඇගේ ගුරුවරුන් දැනුවත් කළත් ඔවුන් නෙමෙයි ඒකට මොකුත් කළේ. ඉතින් දවසක් ඇගේ ගෙදර ගාව ඇලකින්ම සියදිවිහානි කරගත්තු ඉසබෙලාගේ ප්‍රාණසුන් සිරුර හමුවුණා.

ඒ විතරක් නෙමෙයි පහුගිය දවසක තමිල්නාඩුවේ කල්කුරිච්චි දිස්ත්‍රික්කයේ පාසලක දරුවෙක් තමන්ගේ මහත ඇඟට විහිළු කරාපු තමන්ගේ හොඳම යාළුවව උල් පිහියකින් ඇනලා මරල දලා තිබුණා. මහතයි, කළුයි කියන්නේ කැතයි කියන එකට නෙමෙයි. හැම මනුස්සයෙක්ටම තමන්ට ආවේණික ලස්සනක් තියෙනවා. හැබැයි ඒ ලස්සන නොදකින කැත ඇස් වැඩියි. ඒ නිසා ටිකක් මහත කළු අයව සමච්චිලයට ලක්කරන එක සමාජ පුරුද්දක් වෙලා.

ඕකෙන් බේරෙන්න ඔය ඉහතින් කිව්ව අය වගේ සමහරු මැරෙනවා, නැත්තම් මරනවා. සෑම සියදිවි නසාගැනීම් දහයකින් එකකට හේතු වෙන්නේ ශරීරය ලැජ්ජාවට පත්කිරීම (Body Shaming) කියලයි යුරෝපා සංගමය පෙන්වලා දෙන්නේ. හැබැයි පෙනුමට කරපු විහිළු හිතට හයියක් කරගත්තු උදවියත් ඉන්නවා.

අපේ කතා නායිකාව විශ්වනී විලෝචනාත් එහෙම කෙනෙක්. අපි ඇගේ කතාවෙන් කියන්නේ ක්‍රීම් ගාලා හරි පැහැපත් වෙයල්ලා කියන එක එහෙම නෙමෙයි. හිතුවොත් මැරෙන්නෙවත්, මරන්නෙවත් නැතුව පෙනුම වුණත් වෙනස් කරගන්න පුළුවන් කියන එකයි.

“මට අවුරුදු 21යි. පෞද්ගලික විශ්වවිද්‍යාලයක උසස් අධ්‍යාපනය හදාරනවා. පොඩි කාලේ මට තිබුණේ සාමාන්‍ය පෙනුමක්. වැඩිය මහතත් නෑ. තළෙලූයි. වැඩිවිය පැමිනුණාට පස්සේ හෝර්මෝන වෙනස්වීමත් එක්ක මට කෑම ගැන ලොකු ආසාවක් ඇතිවුණා. ඒ කාලේ මගේ වැඩේම කන එක. කාලා කාලා මම ගොඩක් මහත් වුණා. ඒත් එක්කම මගේ හමත් තිබුණට වඩා කළු වුණා. ඊටපස්සේ තමයි මිනිස්සු මට විහිළු කරන්න ගත්තේ.”

‘නුඹේ අම්මා ඉතා කළුයි, නුඹේ අප්පත් ඉතා කළුයි, නුඹේ සීයා ටිකක් සුදුයි, නුඹ විතරක් තලවළලුයි’ කළු පාට කැත පාටක් කියලා පුංචි ඈයොන්ගේ ඔලුවට වැටෙන්නේ ඔය වගේ කවි අහලා නැලවෙන හිච්චි කාලෙදිමයි. “බලන්නකෝ ගෙදර අනිත් අය සුදුයි. ඔයා විතරක් කළුයි. ඔයාව කාණුවෙන් ඇහිදන් ඇවිල්ලද කොහෙද්ලෝ.” සමහර වැඩිහිටියෝ දුරදිග නොහිතා දරුවන්ට ඔහොම විහිළු කරනවත් අපි අහලා තියෙනවා.

“ඉස්සර පාරේ යද්දි මිනිස්සු මගේ දිහා බලාගෙන ඉන්නවා කියලා මට තේරෙනවා. මගේ අම්මා පැහැපත්. ඉතින් අම්මා එක්ක කොහෙහරි ගියහම ‘අපෝ මේ ඔයාගේ දුවද?’ කියලා මිනිස්සු අම්මගෙන් අහනවා. දවසක් එක ඇන්ටි කෙනෙක් ‘මෙයා අරන් හදාගත්තු කෙනෙක්ද?’ කියලා අම්මගෙන් ඇහුවා. අම්මා අදටත් ඒ ගෑනු කෙනා එක්ක කතා කරන්නේ නෑ.”

සාමාන්‍ය පෙළට ටියුෂන් පංති යන්න පටන්ගත්තයින් පස්සේ විශ්වනීට වුණු වාචික හිරිහැර තවත් වැඩිවෙන්න වුණාලු.

“මම පංතිවලට යනකොට ළමයි ‘අපෝ ඔන්න බතලි එනෝ... තාර බැරල්’ කිය කියා මහා හයියෙන් කෑගහනවා. මගේ ළඟින් යන්නත් අප්පිරියාවයි කියලා කියපු අය හිටියා. සමහරු හූ කියනවා. මට අඬන්න තරම් දුකයි. ඉතින් මම ගෙදර ගිහිල්ලා පංති යන්න බෑ කියලා හැමදම අඬනවා.”

ඒ කාලේ ‘ඔයා කැතයි, කළුයි’ කියලා කනට නෑහුණු දවසක් ගැන විශ්වනීගේ මතකයේ නැතිලු.

“මිනිස්සුන්ගේ පාට, ශරීරය සොබාවය ඒ අයම තීරණය කළ එකක් නෙමෙයි. ඒක ඇත්ත. හැබැයි මම මහත් වුණොත්, පාට වෙනස් වුණොත් මගේම වරදින්. ඉතින් මිනිස්සු කියන එව්වාට හැමදම අඬ අඬා ඉන්නේ නැතිව නරක පුරුදු අතඇරලා පෙනුම වෙනස් කරගන්න ඕනේ කියලා මට හිතුණා.”

සමේ පාටවත්, ඇඟේ බරවත් කෙනෙක්ගේ සාර්ථකත්වය මනින සාධක නෙමෙයි. ඔප්රා වින්ෆ්‍රි, ලුපිතා නයෝන්ග්, වාරිස් ඩයිරි, සෙරීනා විලියම්ස් වගේ ගෑනු ඒක ඔප්පු කරලා ඉවරයි. හැබැයි අපිට ලැබිලා තියෙන රූපය අපි ජීවත් වෙනතාක් ලස්සනට තියාගන්න ඕනේ. උගුර ගාවට කෑම කාලා කම්මැලිකමට හිටියොත් ඒක පෙනුමට වගේම නීරෝගීකමටත් බලපානවා කියන එකටත් විශ්වනීගේ කතාව උදාහරණයක්.

“මුලින්ම මම ජිම් යන්න පටන්ගත්තා. හැබැයි අධ්‍යාපන වැඩ නිසා ඒක හරියට වුණේ නැහැ. ඒ නිසා ගෙදරම ව්‍යායාම කරන්න ගත්තා. දවසටම කෑවේ එක වේලයි. සීනි, ලුණු, පිටි, තෙල් කන එක නතර කළා. ගෙදර අය පීසා ගෙනල්ලා කද්දි මම අහක බලාගෙන හිටියා. එව්වා වෙනුවට ප්‍රෝටීන වැඩි කෑම කන්න පටන්ගත්තා. දවසට වතුර ලීටර හතරක් බිව්වා. ඔහොම කරද්දි කිලෝ එකසිය තිහට හිටපු මම කිලෝ හැත්තෑවට බැස්සා. සම පැහැපත් කරන්න ප්‍රමිතිගත ක්‍රීම් ගෑවා. විටමින් C, ඔමේගා 3 වගේ අතිරේක එහෙමත් ගත්තා.”

මාස හය හතක් මේ දේවල් කරද්දි විශ්වනීගේ පෙනුම වෙනස් වුණාලු.

“පෙනුම වෙනස් කරගන්න පුළුවන් කියන විශ්වාසයත් මගේ හිතේ තිබුණා. ඒකට මම ගොඩක් කැපකිරීම් කළා. බර අඩු වුණු නිසා දැන් නම් දවසට වේල් දෙකක් කනවා. ගොඩක් අය මේ වගේ ප්‍රශ්න නිසා පීඩා විඳිනවා. මම වෙනස් වුණේ කොහොමද කියල අහලා දවසට මැසේජ් දහ පහළොවක් එනවා. ඒ නිසාම මම කරපු සත්කාර ගැන යූ ටියුබ් චැනල් එකක් හරහා අනිත් අයටත් කියාදෙනවා.”

දවසක් එක ඇන්ටි කෙනෙක් ‘මෙයා අරන් හදාගත්තු කෙනෙක්ද?’ කියලා අම්මගෙන් ඇහුවා. අම්මා අදටත් ඒ ගෑනු කෙනා එක්ක කතා කරන්නේ නෑ

පෙනුම වෙනස් වුණාට පස්සේ ඉස්සර ඇයව ආශ්‍රය නොකළ අයත් ඇයව ආශ්‍රය කරන්න පොර කනවලු. ඉතින් එහෙමයි කියලා විශ්වනීට වෙච්චි වාචික හිරිහැර ඉවරයි කියලද හිතුවේ? නැහැ. දැන් ඇයට මිනිස්සු කියන්නේ වෙන කතාවක්ලු.

“මම සුදු වුණේ ඉන්පෙක්ෂන් ගහලා කියලයි දැන් එයාලා කියන්නේ. ‘ඉන්පෙක්ෂන් ගහලා පොත්ත සුදු වුණාට උපන් කැත යවන්න බැහැ’ කියලා සමහරු කියනවා. මම මහතට, කළුවට ඉද්දි මිනිස්සු මට අර විදියේ කතා කිව්වා. මම අමාරුවෙන් මහන්සි වෙලා පෙනුම වෙනස් කරගත්තහම දැන් කියන්නේ වෙන කතාවක්. හැබැයි ඒකෙන් මම ලොකු පාඩමක් ඉගෙනගත්තා.

ඉස්සර මම අනිත් අය කියන ඒවා අහලා හිත රිද්දද ගත්තා. තව කෙනෙක් සතුටින් ඉන්නවට ගොඩක් අය කැමති නැහැ. එයලා හොයන්නෙම මනුස්සයෙක්ගේ හිත රිද්දන්න හේතු. එහෙම අය කියන දේවල් අහලා හිත් රිද්දවගන්නවා කියන්නෙ මෝඩ වැඩක්. අපි අනිත් මිනිස්සුන්ට ඕන විදියට ඉන්න ඕනේ නැහැ කියන එක දැන් මට තේරෙනවා.”

‘ධරණී’ කියවන ඔබ වෙනුවෙන් ඇය කිව්වේ මෙහෙම දෙයක්.

“පළවැනි දේ මහතයි, කළුයි කියලා කාවවත් කොන් කරන්න එපා. මිනිස්සුන්ට මිනිස්සුන්ට වගේ සලකමු. ඉස්කෝලෙක වුණත් නැටුමකට තියා පංතිය ඉස්සරහටවත් ඒ අයව ගන්නේ නැහැ. පුංචි කාලෙදිම එහෙම කළාම ළමයි මානසිකව වැටෙනවා. මම ඒක හොඳටම විඳපු කෙනෙක්.”

ඊළඟට උත්සාහය, කැපවීම තියෙනවා නම් අපිට මේ ලෝකේ කරන්න බැරි දෙයක් නැහැ. හැබැයි එහෙමයි කියලා ලස්සන වෙන්න දකින දකින දේ කරන්න යන්නත් එපා. කාලයක් මමත් එහෙම කළා. කෙට්ටු වෙන්න ටැබ්ලට්, ග්‍රීන් ටී, පිටි වර්ග ඔය හැම එකම පාවිච්චි කළා. ඒවා සේරම බොරු. කෑම පාලනය කරලා ව්‍යායාම කළාම ඇති. ලස්සන වෙන්න සුදු වෙන්නම ඕනේ නැහැ. හැබැයි ඇඟ පාලනය කරන එක නීරෝගීකමටත් හොඳයිනේ. ඒ නිසා ඒ දේවල් ගැන හිතන්න.”

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

AMDCC

සියලුම මානසික රෝගවලට ලක්වූවන් සහ වැඩිහිටි පුද්ගලයන් සඳහා

වෛද්‍ය ප්‍රතිකාර - පහසුකම් සහිත නේවාසිකාගාර - මානසික වර්ධන ක්‍රියාකාරකම්

අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය - නොඃ 59, ගලබඩයාවත්ත පාර, මතුගම.

රජයේ ලි.ප. ආයතනය W.H.M 1696

අපේක්ෂා මානසික පුනරුත්තාපන හා උපදේශන මධ්‍යස්ථානය | විමසීම්: 0756046535 / 0715531404

රස්සාවල්වලට යන අම්මලාට කිරි එරෙන්නේ නෑ කියන්නේ ඇත්තද?

එකෙන් ලැබෙන සැලරි එකෙන් බාගෙට බාගයක් යනවා. ඉතින් කොහොමද... ඉතින් කොහොමද " කියාගෙන යද්දී ප්‍රියංකාගේ මුව ගොළු විණි.

"ඔයා මොකද්ද මේ කියන්න හදන්නේ?" මද වෙලාවකින් නැවතත් ප්‍රියංකාම අසනතුරු සංදීප නිහඬව බලා සිටියේය.

"ඔයාලගේ අම්මයි, තාත්තයි දෙන්නම රස්සා කරපු නිසා ඔයාගේ ළමා කාලේ සැපවත්ව ගෙවුණා නේද? තාත්තා විතරක් හම්බ කළා නම් සමහරවිට ඔයාට ඒ වගේ සැපවත් ළමා කාලයක් නොලැබෙන්නත් ඉඩ තිබ්බා. ඔයාගෙයි අපේ දූගෙයි වෙනස මොකද්ද දන්නවද? අපේ කෙල්ලව බලාගන්නේ මැණිකා නැන්ද. ඒ මනුස්සයා කවදවත් දුවගේ ඔලුවට විස පුරවන්නේ නැහැ. හැබැයි ඔයා පොඩි කාලේ ඔයාව බලාගත්තේ ඔයාගේ තාත්තගේ අම්මලා, අක්කලා. ඒ මිනිස්සු ඔයාගේ ඔලුවට පොඩි කාලේ ඉඳන් විස පුරවන්න ඇති අම්මා ගැන වැරදි කියලා." සංදීප කියද්දී ප්‍රියංකා තිගැස්සී ගියාය.

"පොඩ්ඩක් කල්පනා කරලා බලන්නකෝ ප්‍රියංකා. ඔයා අම්මා ගැන ඔය හිතන විදිය ඇත්තටම ඔයාට දැනුණු විදියද? නැත්නම් ඔයාගේ ආච්චිලා නැන්දලා ඔයාගේ ඔලුවට දපු දේවල්ද කියලා." කියූ සංදීප ප්‍රියංකාගේ හිස පිරිමදින්නට පටන්ගත්තාය.

"අනේ පව් මේ අහිංසක දරුවා. අර මහ ගෑනිට රස්සාව ලොකුයිනේ. කෙල්ලව තනි කරලා සල්ලි පස්සේ යනවා."

"කට කැඩෙනකම් කිව්වත් රස්සාව නවත්තන්න කියලා මේ ගෑනි අහන්නේ නැහැනේ. තමන්ගේ දරුවට වඩා සල්ලි ලොකුයිනේ ඒ ගෑනිට."

තමන්ගේ ආච්චි සහ නැන්දලා දෙදෙනා වරින් වර කියූ සැටි චිත්‍රයක් සේ ප්‍රියංකාගේ දෑස් ඉදිරියේ ඇඳෙන්නට විණි.

"සංදීප " ප්‍රියංකා හඬ අවදි කළේ වේදනාවෙනි.

"ඇත්තටම අම්මා ඔයාට ආදරෙන් හිටිය අවස්ථා ඔයාට මතක නැද්ද ප්‍රියංකා? අම්මා වැඩ ඇරිලා ආවම, සෙනසුරාදු ඉරිදු දවස් දෙක ඔයා වෙනුවෙන් වෙන්කළේම නැද්ද?" සංදීප අසද්දී ප්‍රියංකාගේ දෙනෙත්වලට කඳුළු ගලාගෙන ආවේ සැණෙකිනි.

"අම්මා වැඩ ඇරිලා එද්දී මට ටොපි ගේනවා. මාව තුරුළු කරන් කතන්දර කියලා දෙනවා මට නින්ද යනකම්. සෙනසුරාදු ඉරිදු මට බත් කවන්න හදනවා, මා එක්ක සෙල්ලම් කරන්න හදනවා. අනේ ඒත්, සෙනසුරාදු ඉරිදු අම්මා මට කොච්චර ආදරෙන් ඉන්න හැදුවත් මම උදේ නැගිට්ට ගමන් ආච්චිලාගේ ගෙදර දුවනවා. අම්මා එක්ක ඉන්නවට වඩා මම ආස වුණේ ඒ දවස් දෙකත් ආච්චිලා එක්ක ඉන්න. ඇත්තටම මම ඒ දවස්වලත් හිතාගෙන හිටියේ අම්මාට වඩා ආච්චියි, නැන්දලයි මට ආදරෙයි කියලා. අනේ අම්මා මට ආදරේ කරන්න ඇති. ඇයි මට මේක කලින් තේරුණේ නැත්තේ?" ප්‍රියංකා විමසුවේ වෙව්ලන හඬකිනි.

"ඒක ඔයාගේ වරදක් නෙවේ ප්‍රියංකා. ඔයා පොඩි දරුවෙක් වෙලා ඉන්න කාලේ හැමෝම ඔයාට කිව්වා ඔයාගේ අම්මා ඔයාට ආදරේ නැහැ කියලා. අම්මා කෙනෙක් රස්සාවට යන එක මහ පවක් කියලා එයාලා කිව්වා. අම්මට, ඔයාට වඩා සල්ලි ලොකු වෙලා කියලා එයාලා ඔයාගේ හිතට ඇතුල් කළා. ඒත් ඇත්ත ඒක නෙවෙයි ප්‍රියංකා. මට ඔය දේ තේරුණේ ටික ටික. ඇත්තටම ඔයාගේ අම්මගේ වරදක් නැහැ. එයා ඔයාට ආදරේ කළා. හැබැයි ඒ ආදරේ ඔයාට දැනෙන එක ඔයාගේ ආච්චිලා, නැන්දලා වළක්වලා දැම්මා." සංදීප කියද්දී ප්‍රියංකා සිටියේ කඳුළු පිස දමමිනි.

ලංකාවේ මිනිස්සු කරන භයානක වරදක් මේ. දරුවා අඬනවා නම්, දරුවා කිරි බොන්නේ නැත්නම්, අම්මා පොඩි වෙලාවකට නිදගත්තොත්, අම්මා වෙනසකට ෆෝන් එක දිහා බැලුවොත්, වැරදීමකින් දරුවා වැටුණොත්, අම්මා දරුවාව day care දලා, එහෙම නැත්නම් විශ්වාසවන්ත කෙනෙක් ගාව තියලා රස්සාවට යනවා නම් මිනිස්සු බලාගෙන ඉන්නේ අම්මා ළමයට ආදරේ නැහැ කියලා

"අපේ අම්මලා ඉතින් අපිට ආදරේ කරපු මිනිස්සු නෙවේනේ. අපිට ආදරේ ඕනේ කාලේ සල්ලි පස්සේ ගිහින් දැන් මිනිබිරි බලන්න එන්න දඟලනවා" කී ප්‍රියංකා මුව ඇද කරමින් සිනාසුණාය.

ප්‍රියංකාගේ උකුලේ හිස තබාගෙන සිටි සංදීප ප්‍රියංකා දෙස බැලුවේ විමසුම් සහගතවය.

ප්‍රියංකා පෙම්වතියක්ව සිටි කාලයේ සිටම ඇය සහ අම්මා අතර බැඳීම අඩුබව සංදීපට වැටහී තිබුණි. ප්‍රියංකාගේ ජීවිතයේ වීරයා තාත්තාය. ඇය සැමදෑ අම්මා ගැන පැවසුවේ ඔවැනි කතාය.

"අම්මා සල්ලි පස්සේ ගියා අපිව අමතක කරලා." ප්‍රියංකා ඔය ලෙස කියන්නේ අම්මා කළ වරදකට නොවන බව සංදීපට දැන් දැන් වැටහේ.

සංදීප ප්‍රියංකාගේ උකුලෙන් හිස ඔසවා නැගිට ගත්තාය.

"අපේ දූ කොහෙද ප්‍රියංකා?" සංදීප විමසුවේ කතාවට ආරම්භයක් ගන්නටය.

"මැණිකා නැන්ද එක්ක දෙයි කෙල්ල." ප්‍රියංකා කිවේ සෙනෙහසිනි.

"මැණිකා නැන්ද ඉන්න එක නම් ලොකු දෙයක් නේද? ඔයාට හිතේ සැනසිල්ලේ පොබ් එකට යන්න වුණත් පුළුවන් මැණිකා නැන්ද වගේ කෙනෙක් අපිට ලැබුණු නිසානේ." සංදීප පැවසුවේ සෙමිනි.

"අනේ ඔව්. නැත්නම් මම කොහොමද මේ රස්සාව කරගන්නේ? කෙල්ල කා ගාව තියලා යන්නද?" ප්‍රියංකා කිවේ ඊට උත්තර ලෙසය.

"ඒක නෙවෙයි ප්‍රියංකා... අපේ දූ හදිසියෙවත් අනාගතේදී කියයිද අම්මයි තාත්තයි සල්ලි පස්සේ ගියා. මාව බැලුවේ මැණිකා නැන්ද කියලා?" සංදීප කියද්දී ප්‍රියංකාගේ දෙනෙත් පුදුමයෙන් මහත් විණි.

"පිස්සුද සංදීප? අපි හම්බ කරන නිසානේ කෙල්ල සැපෙන් ඉන්නේ. අනික මැණිකා නැන්දට පඩි ගෙවන්න මට ඔෆිස්

සෑම නිවසකම ඉසිවර ඔසුව

රාවණා රෝලෙක්ස් ඔයිල්

(හන්දි වාත තෙලය)



ඔසුසල් හා ෆාමසි වලින්

077 588 5446

දිවයින පුරා බෙදාහැරීම් නියෝජිතයන් බඳවා ගැනේ

සී.ස. රාවණා ලංකා හර්බල්ස් පුද්. සමාගම, වැලිවත්ත, බලගොඩ, පෝද්දල

Gov.Reg.No. G/2/3058/Ayu.Dept.Reg.No. 6/2/1/04/18/ PV-00226316

සමාධි ඛයස්

මහත්තයාගෙ පැටිකිරිය යාලුවො ඉස්සරා දිගහරින්න කලින් දෙපාරක් හිතන්න නෝනේ

■ හෂිණී මනමේන්ද්‍ර

මගේ වැරදි, අඩුපාඩු, මගහැරුණු අතපසු වුණු දේවල් සහ ඒවා මගේ පවුල් ජීවිතේට බලපෑවේ කොහොමද කියලයි මං නිතරම ලියන්නේ. දවස ගානේ මගේ ළඟ තියෙන පුංචිම වැරැද්දක් හරි අඳුනගෙන ඒක නිවැරදි කරගන්න ලැබෙනවා කියන්නේ මට සතුටක්. එහෙම දේවල් වුණාම ඉස්සර වගේ ඇයි මටම මෙහෙම වෙන්නේ කියලා මං දැන් හිතන්නේ නෑ. මෙහෙම වුණේ හොඳට, ඒකයි මට ඒ දේවල් තේරුම්ගන්න ලැබුණේ කියලා විතරයි මං හිතන්නේ.

මේ කියන්න යන්නෙත් ඒ වගේ සිදුවීමක් ගැන කතාවක්. ඔයාලගේ අතිනුත් මේ දේ වෙලා ඇති, සමහරවිට තාමත් වෙනවා ඇති, නැත්තම් ඉස්සරහට වේවි. එහෙම නොවෙන්න, මං තේරුම්ගත්ත දේ ඔයාලටත් තේරුම්ගන්න ලැබේවා කියන ප්‍රාර්ථනාවෙනුයි මේක ලියන්නේ.

එක කාලයක් මං බොහොම අපහසුතාවයෙන්, අධික පීඩනයකින් ඉන්නකොට මගේ මහත්තයාගේ වැරදි, මිතුරියන් කීපදෙනෙක් එක්ක කිව්වා. ඒ අය මං ළඟින්ම ඇසුරු කරපු නිසා විශ්වාසය නිසයි කිව්වේ. හැබැයි මං ඒ කියපු දේවල් ඒ අයගෙන් පිට අය දැනගෙන, ඒ අයගෙන් මං ජීවිතේට නොදැකපු නොදන්න අය පවා දැනගෙන තිබුණා. හැබැයි මට ආපස්සට ඒවා දැනගන්න ලැබෙද්දී කාලයක් ගිහින්. කාගෙන්ද ඒවා පිටවුණේ, කවුද එහෙම කිව්වේ කියලා දන්නවා වුණත්, අද වෙනකල් ඇයි එහෙම කළේ කියලා මං එයාලගෙන් ප්‍රශ්න කරලා නෑ. මොකද වැරැද්ද ඒ අයගේ නෙවෙයි මගේ නිසා. මගේ මහත්තයගේ වැරදි වෙන අය එක්ක කියපු එකම මගේ වැරැද්දක් කියලා මම තේරුම්ගත්තා.

මගේ ප්‍රශ්න රහසක් විදියට රකිනවා වෙනුවට තව අය එක්ක කියලා රස විඳින අය ඉන්න බව දැනගන්න ලැබුණනේ කියලා හිතලා මම සතුටු වුණා. ඒ අය ගැන මගේ හිතේ උපන් කේන්තියත් පාලනය කරගත්තා. හැබැයි මට පුංචි පසුතැවීමක් තිබුණා. ඒ මගේ මහත්තයගේ වැරදි වෙන අය එක්ක කියන්න කලින් මට හිතන්න තිබුණනේ කියන පසුතැවීම. ඒ නිසා කාටවත් දෝෂාරෝපණය නොකර මං දෝෂාරෝපණය කරගත්තේ මටමයි. කොච්චර කේන්ති ගියත්, දුක හිතුණත් ආවේශශීලී වෙලා නොසුදුසු දේවල් නොසුදුසු අය එක්ක කියන්න හොඳ නෑ කියලා මං තේරුම්ගත්තා. අනික මං තේරුම්ගත්තා මට කවුරුම හරි අතිශය පෞද්ගලික දෙයක් කියද්දි ඒ කෙනා එක්ක අමනාප වුණත් පෞද්ගලික දේ රහසක් විදියටම රැකගන්න ඕනේ කියලා.

මේ සිදුවීම නිසා ඇතිවුණු මගේ පසුතැවීම අඩු කරගන්න පස්සේ කාලෙක මට මගේ මහත්තයාටම කතාකරන්න වුණා. "වුණ දේ ගැන, වෙච්ච දේ ගැන පසුතැවෙන්න එපා. ඒක හදන්න බෑනේ. මේ වෙච්ච දෙයින් ඔයා තේරුම්ගත්ත දෙයක් තියෙනවානේ. ඒ ඇති." එහෙම කියලා එයා මාව සැනසුවා. මං මගේ හිත සුවපත් කරගත්තේ ලොකු සටනක් දීලා. ඇත්තටම මං දහම්ගේ වැරදි මගේ මිතුරියන් එක්ක කිව්වේ, මගෙන් සිද්ධවෙමින් තිබුණු වැරැද්දක් වහගන්න. ඒත් මගේ වැරදි හදාගෙන මාව ගොඩ නගාගන්න මට උදව් කළේ මගේ මහත්තයා මිසක් යාළුවො නෙවෙයි. ඒ හින්දම මට ඒ පසුතැවීමෙන් ගොඩ එන්න කාලයක් ගියා. එතැනින් ගොඩ එන්න උදව් කළෙත් දහම්ම තමයි.

ඒ අමාරුම කාලය ගෙවිලා ගිහින් අද වෙද්දි මගේ හිත හරිම සැහැල්ලුයි. අද මට කවුරුම හරි ඒ අයගේ අතිශය පෞද්ගලික දෙයක් කියද්දි මේක කාටවත් කියන්න එපා කියලා කිව්වත්, නොකිව්වත් මං දන්නවා මෙච්චර දෙයක් මට කියන්නේ මාව විශ්වාස කරලා, මගේ කටින් කෙළ බිඳක් මේ ගැන පිටවෙන්න හොඳ නෑ කියලා. අනික මං තේරුම්ගත්ත වටිනම දේ පවුල ජීවිතේ ඇතුළේ සාකච්ඡා කරලා විසඳගන්න බැරි දෙයක් නෑ. කලබල නොවී කේන්ති අරගන්නේ නැතුව හිටියොත් ඕනෑම ගැටලුවකට විසඳුම් හොයාගන්න බිරිඳට වගේම සැමියාටත් පුළුවන්. එහෙමත් අමාරු වුණ තැනකදි සුදුසුම දේ තමයි පවුල් උපදේශනයකට යන එක.

ඉවසන්න, උත්සාහ කරන්න. එත් බැරිනම් පවුල් උපදේශනයට යොමුවෙන්න. හැබැයි යාළුවො එක්ක මොන ප්‍රශ්න බෙදාගත්තත් පවුල් ප්‍රශ්න ඒ අයට නොදී ඉන්න

කිසිම වෙලාවක බිරිඳ සැමියාගෙවත්, සැමියා බිරිඳගෙවත් වැරදි පිට අය එක්ක කියන එක මම නම් අනුමත කරන්නේ නෑ. විශ්වාසවන්ත මිතුරන් මිතුරියන් හිටියත් ගෙදර ප්‍රශ්න ගෙයිම විසඳගන්න පුළුවන්තරම් උත්සහ කරන්න ඕනේ. ප්‍රශ්න පිටට දුන්නට පස්සේ ඒ ප්‍රශ්න විසඳිලා දෙන්නා හොඳින් ඉන්න දවසක් ආවම අනිත් අය අපිට හිනාවෙන්න පුළුවන්. ඊටත් වඩා "උන් හොඳ වුණා, උදව් කරපු අපි නරක් වුණා" වගේ කතා අහගන්නත් වෙනවා. සමහරවිට දැනටමත් මෙහෙම අත්දැකීම්වලට ඔබ මුහුණ දීලා ඇති.

ඒ නිසා දුක හිතුණාම, කේන්ති ගියාම සැමියා හෝ බිරිඳ එක්ක ඒ මොහොතේම කතාකරලා විසඳගන්න අමාරුනම් ටිකක් වෙලාව අරගෙන නිහඬව ඉන්න. නිහඬව ඉන්න කාලය තුළ තමන්ගේ ප්‍රශ්නෙ පිටස්තරයින් එක්ක කියන්න හිතුණත් ඒ සිතිවිල්ල පාලනය කරගන්න. මොකද ප්‍රශ්නේ විසඳෙනකල් තවත් කෙනෙක් එක්ක කතා කරද්දී නොදැනුවත්වම නෝනගේ හෝ මහත්තයගේ වැරදි ගැන කියැවෙන එක සාමාන්‍ය දෙයක්. ඒ නිසා හොඳම දේ තමයි තියන ගැටලුවක් දෙන්නා කතාබහ කරලා විසඳගන්න එක.

ගැහැනු විදියට අපි නොහිතන ලොකු ශක්තියක්, දරාගැනීමේ හැකියාවක් අපිට උපතින්ම ලැබිලා තියෙනවා. ඒ සහජ හැකියාව පාවිච්චි කරලා දුක නිවාගන්න, කේන්තිය සුවපත් කරගන්න උත්සාහ කරන්න. එහෙම කළොත් ගොඩක් ප්‍රශ්න අඩුවෙයි, හතුරෝ නැතිවෙයි, ප්‍රශ්නවලට මූණදෙන්න ශක්තිය ලැබෙයි, ඔයාගේ ගෑනුකම ගැන ඔයාටම ආඩම්බර වෙන්න පුළුවන් දවසකුත් ඒවි.



මදත් කිපිලා දණත් ගැහුවට පස්සෙ නිදි කරවන්න හිතන්න එපා මහත්තයෝ

මේ සියල්ල මගේ යහපතට නොවේදැයි සාලියට සිතුණා විය හැකිය. එනිසාමදෝ ස්ව කැමැත්තෙන්ම බිම වැතිරී ප්‍රතිකාර ලබාදීමට හෙතෙම ඉඩ දුන්නේය. එය සාලියට මෙන්ම ඇත්ගොව්වාට සහ පශු වෛද්‍යවරයාටද පහසුවක් විය. දළඳ පෙරහරේ හෝ වෙනත් පෙරහරවලට සම්බන්ධ වී තේජසින් ගමන් කරද්දී සාලිය යනු මෙවැන්නකු බව කිසිවකු හෝ නොසිතන්නට ඇත. එක අතකින් තමාගේ සායම දිය නොවන ලෙස ජනතාව ඉදිරියේ හැසිරීම සාලිය හොඳින්ම ප්‍රගුණ කර තිබෙනවා විය හැකිය.

තොරතුරු - පශු වෛද්‍ය **තරිඳු විජේකෝන්**

(ශ්‍රී දළඳ මාලිගාව, Millennium Elephant Foundation සහ Vetcare සත්ව රෝහල)

රජනිකා ලියනගේ

කිරිවෙහෙරේ මල් කෙල්ලක පස්සේ වැටුණු සාලිය විසේකාරයෙකු වුණාට මහියංගනය ඇත් පන්තියට අයත් සාලිය ඊට වෙනස්ය. හේ කේන්තිකාරයෙකි. ඒ නිසා ඇතැම් කාලවලදී නාහෙට නාහන ගති පෙන්වයි. මද කිපෙන කාලයටනම් සාලියට කිසිවකු රුස්සන්නේ නැත.

සෑම වසරකම සැප්තැම්බරයේදී සාලියගේ මද කිපෙයි. එම කාලය මාස හතරක් පහක් පවතී. මද කිපීමත් සමඟ අලි ඇතුන්ගේ චර්යා වෙනස් වේ. හීලෑ අලි කියා එහි වෙනසක් නැත. ඒ කාලයට බොහෝ සත්තු ඇත්ගොව්වාටද අවනත නොවෙති. එනිසා ඔවුන් සමඟ ගනුදෙනු කිරීම පහසු නැත. කොරේ පිටට මරේ කියන්නාක් මෙන් මද කාලය ගත කරන සාලිය තවත් අකරතැබ්බයකට මුහුණ දුන්නේය. ඒ, දත් පොල්ලක නොවිසේනම් දලක ඇතිවූ තුවාලයකි. මෙය නොසලකා හැරිය නොහැකිය. එසේ වුවහොත් තුවාලය නරක අතට හැරීමට ඉඩ තිබේ. එහෙත් සාලියට කිට්ටු වීමටද අසීරුය. ඒ මදිවාට මේ හාදයා ඇත්ගොව්වා කියන කිසිවක් ගණන් ගන්නේද නැත. එසේ කියා ප්‍රතිකාර කිරීම නැවතීමද සුදුසු නොවේ.

ඕන එකක් වෙච්චාවේ කියා පශු වෛද්‍ය තරිඳු විජේකෝන් ඇත්ගොව්වාද සමඟ රාජකාරියට බැස්සේය. කේන්තිකාරයාගේ අත් දම්වැලින් තදකර ප්‍රතිකාර ආරම්භ කෙරිණ. “අලියා දණ” කියා විධාන කළ විට ඕනෑවට එපාවට සාලිය දණ බිම ගසයි. දණ ගසනවාට වඩා අලියා නිදි කරවා ගැනීම වැඩේට පහසුය. ඒ සඳහා විධානය “අලියා හිඳ” යනුවෙනි. සාලියගේ කේන්තිය අසූහාරදහසට නගින්නේ ඒ අණටයි. සද්දන්තයෙක් වෙච්චි මං මුන්ගේ අණට නිදියන්න ඕනේදැයි අසන්නාක් මෙන් හෙතෙම පශු වෛද්‍ය තරිඳුටත් හස්තිපාලකවරයාටත් රවා බලයි. එතැනින් නවතින්නේද නැත. පහරදීමටද පනී.

නැවත නැවත කිහිප වතාවක් එයම විය. අලියා නිදි කරවනවා බොරුය. එනිසා ඒ සැලසුම සාලියට යොදගැනීම කිසිසේත් කළ නොහැකි බව පෙනේ. එබැවින් යන්තමට දණ ගස්සවා සාලියට බෙහෙත් කිරීමට පශු වෛද්‍ය තරිඳු පියවර ගත්තේය. අපහසුතාව නොබලා කිහිප වතාවක්ම ප්‍රතිකාර කෙරිණ. එහි ප්‍රතිඵලයක් ලෙස තුවාලය සුව වෙන්නට විය. ටිකෙන් ටික වේදනාව අඩුව යද්දී සාලිය චණ්ඩිකම් පසෙක ලා තරමක් නිහතමානී වූයේය.

අත්තනායක
එම්. හේරත්

අම්මා ඇඟ විකුණලා හරිහම්බ කරපු මුදලින් ඒ දුව වෛද්‍යවරියක් වුණා

දුවගෙ තාත්තා තමයි බදුල්ලේ ඔරලෝසු කණුව ගාවින් හවසට කවුරුහරි පිරිමියෙක් එක්කගෙන ගෙදරට යන්නේ. අම්මා, ඒ මනුස්සයා එක්ක ගනුදෙනුව ඉවර කරනකන් මේ දුව, තාත්තා එක්ක එළියට වෙලා ඉන්නවා

රත්තරන් දුවේ

පාඩියේ ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් මම ගෙදරට වෙලා ඉඳපු කාලෙ තමයි මේ සිදුවීම වුණේ. කිසිම ආදයමක් නැති නිසා අතිරේක පංතියක්වත් පවත්වන්න ඕන කියලා මමත් මගේ මිතුරනුත් තීරණය කළා. ඊටපස්සේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ ශාලාවක් සොයාගෙන අපි හය වසරේ සිට පංති පැවැත්වීම ආරම්භ කළා. අපේ පංති ගාස්තුව ඉතාම සුළු මුදලක් වීම නිසා අපේ පංතිය ඉක්මනින් ජනප්‍රිය වුණා. 'මහගම සේකරයන්' ලියූ 'ප්‍රබුද්ධ' කාව්‍යය මම මගේ දේශනවලට නිතර නිතර යොදාගත්තා. මගේ අදහස්වලින් සමාජය විවරණය කරනවාට වඩා සේකරගේ කවියෙන් දරුවන් අස්වැසිය හැකි බව මං තීරණය කළා. දවසක් මෙන්න මේ කවිය මං දරුවන්ට කියා දුන්නා.

'තම්බා බතල දලු
ලුණු දියර ඉස
පොල් හා මුසුකොට කවා
බඩගිනි නිවූ අම්මා ඔබය

උයා උදයෙන් නැගිට කඩයප්පන්
තබා තේ කඩයෙහි
ලබා ඉන් ලැබෙන සුළු වට්ටම
ජංගි ඇන්දූ අම්මා ඔබය

ගල්වා ඉසෙහි තෙල් යහමින්
එල්ලා කරෙහි පංචායුධය
අල්ලාගෙන අතින් මා
පාසැලට එක්ක ගිය අම්මා ඔබ ය

ඇවිද ලඳු දෙණි කැලෑ බිම්වල
රැගෙන විත් තුන්හිරිය පන්කොළ
යොදූ කුකුළු සායම් රතු හා කොළ
වියා නෙක් විසිතුරු රටා පැදුරු
රටාවක් බව මේ මහා විශ්වය
කුඩා කල සිටම මට කියා දුන්
අම්මා ඔබ ය'

-ප්‍රබුද්ධ - 32 පිටුව-

අකුරු නූගත් අම්මාවරුන් දරුවන් ඉගෙනීමට උනන්දු කළ ආකාරය ගැන මේ කවිය පාදක කරගෙන මම ඉගැන්නුවා. බදුල්ලෙ ඉතාම දුප්පත් දරුවන් සිටි මගේ පංතියේ ඇතැම් දරුවන් මේ කවිය කියවද්දි පාඩම අතරතුර හෙමින් අඬනවා මං දැක්කා. මගේ 'අම්මාත්' සේකර ලියූ අම්මාම බව මං ඒ දරුවන්ට කියා දුන්නා. කොහොමටත් බදුල්ලෙම හැදුන වැඩුන ඒ දරුවෝ මගේ දුප්පත් අම්මාත් මේ වගේම බව දැනගෙන හිටියා. මම පංතිය ඉවර කරලා ළමයින්ට සමුදෙනකොට එක දුවෙක් මට කිට්ටු වෙලා කිව්වා, **"සර් මං දන්න යාළුවෙක් ඉන්නවා ඔය වගේම අසරණ අම්මා කෙනෙක්ගේ. සර් කියන කවි කතා මං එයාට කිව්වම, එයාටත් ආසයි පංතියට එන්න. හැබැයි පංති ගාස්තුව ගෙවාගන්න බැහැ සර්."** මං දෙවරක් කල්පනා නොකර **"ඒ දුව එක්කරගෙන එන්න, අපි ඒ දුවට උගන්වමු කියලා"** කිව්වා. ඊට පසුද බදුල්ල Y.M.C.K. ආයතනයේ අපේ පංතියට ඒ දුව එක්කරගෙන ඇවිල්ලා මට හඳුන්වා දුන්නා. ඒ දුවගේ ගම බදුල්ලේ කන්දෙගෙදර. දැන් ඒ දුව අපේ පංතියේ ඉගෙනගන්නවා.

මේ අතර කන්දෙගෙදර ඉඳලා අපේ පංතියට ඉගැන්වීමට එන මගේ මිත්‍ර ගුරුවරයෙක් දවසක් මගෙන් ඇහුවා **"අර ළමයා සල්ලි දීලද ඉගෙනගන්නේ?"** මං නෑ කිව්වා. ඊටපස්සේ මගේ යාළුවා කිව්වා **"ඒක ඉතාම හොඳයි. ඔය දුව ඉතාම අසරණ දුවෙක්. අම්මා තාත්තා ඉතාම දුප්පත්. ඔය දුව විතරයි ඉන්නෙ. පුංචි පැල්පතක, තාත්තා ලෙඩෙක්."** ඉතින් ඔය තාත්තා හැමදම හවසට බදුල්ලෙ ඔරලෝසු කණුව ළඟ ඉන්නවා. කවුරුහරි මිනිහෙක් එක්කරගෙන ගෙදරට යනවා. ඒ එක්කරගෙන යන මනුස්සයට ඇඟ විකුණලා ඒ අම්මා මේ දුවටයි තාත්තටයි කන්න දෙනවා. ඔහු එක්තරා දවසක මේ තාත්තව මට පෙන්නුවා. ඉතා කෙසඟ, අහිංසක, දුප්පත් මිනිහෙක් මං දැක්කා. ඉතින් දුවේ එදා පටන් අපි ඒ දුවට නොමිලයේම ඉගැන්නුවා. නවයේ පංතියට ආව ඒ දුව සාමාන්‍ය පෙළ ලියනකල්ම අපි ඒ දුවට ඉගැන්නුවා. ඒ අතරතුර මම විශ්වවිද්‍යාලට පත්ව ආවා. ඒ දුව මගේ මතක ගබඩාවෙන් ඉවත්ව ගියා.

මං විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙක් වෙලා, නුවරින් විවාහවෙලා, නුවරම පදිංචි වුණා. දවසක් දුවේ මගේ දෙවැනි දරුවට අසනීපයක් හැදිලා මං ඒ දරුවත් අරන් මහනුවර රෝහලට ගියා. OPD එකේ හිටියේ දෙස්තරවරියක්. මම ඇයට මගේ පුතාව පෙන්නුවා. මගේ කටහඬ ඇසුව ගමන් ඇය පුටුවෙන් නැගිටලා මට දණ ගහලා වැන්දෙ. **"සර් අවුරුදු කීයකට පස්සෙද මං සර්ව දැක්කේ."** දෙස්තර දියණියගේ ඇස්වලින් කඳුළු වැක්කෙරෙනවා. ඒ වෙන කවුරුවත් නෙවෙයි එදා මං නොමිලයේම ඉගැන්වූ සදදර දියණියයි. ඇය මගේ පුතාව පරීක්ෂා කිරීමට පෙර මහගම සේකරගේ 'ප්‍රබුද්ධ' කවිපොත මට පෙන්නුවා.

"සර් අපේ තාත්තා පිළිකාවක් හැදිලා ඒ දවස්වලම මැරුණා. අපේ අම්මා සර් 'සේකරගේ අම්මටත් වඩා දුක් වින්ද. කොහොමහරි මම වෛද්‍ය විද්‍යාලයට ආවා. සර් දැන් මගේ අම්මා මගේ ළඟ. කන්දෙගෙදර සියල්ල අතහැරලා මං අම්මා එක්ක මෙහේ ආවා. සර්ගේ 'අමාදහර' අපේ අම්මා බලන්නෙ අඬ අඬා. අනේ සර් දවසක එන්නකො අපේ අම්මව බලන්න."

"හොඳයි මං එන්නම්. දුව විවාහ වුණේ නැද්ද?" කියලා මම ඇහුවා.

"තවම නැහැ සර්. මට අම්මා තරම් උතුම් වස්තුවක් නැහැ." මගේ පුතාටත් ඇඟෙන් බෙහෙත් රැගෙන මම ගෙදර ආවේ මං එදා කළ පින්කම ගැන කල්පනා කරමින්. මට 'මහගම සේකර' ගැනත් නිදහස් අධ්‍යාපන ක්‍රමය ගැනත් කියා නිමකළ නොහැකි ආදරයක්, භක්තියක් දැනුණා. ඉතින් මේ සමාජය වෙනස් කිරීමට කලින් ඉගෙනගන්න දුවේ, අර දුව ඉගෙන නොගත්තා නම් ඇයට කුමක් සිදුවේද? සේකරගේ 'ප්‍රබුද්ධ' මාව වෙනස් කළා වගේම ඒ දුවගෙත් දෛවය වෙනස්කරලා. මගෙන් 'මහගම සේකරව' හැදෑරූ ඇය තම අම්මා ඇඟ විකුණා ලබාගත් මුදලින් වෛද්‍යවරියක් වුණා. අම්මා දුවට ජීවිතය කියලා දුන්නා. මට ඇයව මහරෝහලේදී හමුවනවිටත් ඇය විවාහවෙලා හිටියෙ නැහැ. ජීවිතය කියන්නෙ දුවේ විවාහයම නොවේ. අවුරුදු 15 වෙනකොටම අපේ දුවලා විවාහ වෙන්න දඟලන රටක් මේක. ඇයට දිවි නසාගන්න ඕනතරම් හේතු තිබුණා. අම්මා වෙනත් මිනිසුන් එක්ක පුංචි පැලේ නිදියනවිට මේ දුව තාත්තා එක්ක එළියේ. ඉතින් ඒ දුව කන්දෙගෙදර අතහැරලා අම්මා එක්ක නුවර ආවේ සී.ඩබ්.ඩබ්.කන්නන්ගර උතුමාගේ නිදහස් අධ්‍යාපන ක්‍රමයට පින්සිදු වෙන්න. ඇය ගමට ගියා නම් ගම්මු මඩ ගහන බව ඇය දැනගෙන හිටියා. ඇය පළාතම අතහැරලා නුවරට ආවා. ඇය 'මඩට' බය වුණෙත් නැහැ. ඇය ඒ 'මඩවලින්' පොකුණක් හදාගත්තා. ඒ පොකුණේ ඇය 'නෙළුම්' හිටෙව්වා. ඇයට මඩ ගහපු අයත් ඒ 'නෙළුම් මල්' නෙළන්න දැන් එයා ළඟට එනවා.

'හතර වටින් මඩ ගහනා විට — රිසි සේ
ඒ මඩවලින් පොකුණක් සාදමු — සිත් සේ
නෙළුමක් පිපී එන විට සුවඳින් — පොකුණේ
මඩ ගැසු කෙනත් මල් නෙළනට එයි — රහසේ

ඒ නිසා දුවේ අපට ගහන ගල්වලින් අපි ගෙයක් හදමු. මඩවලින් පොකුණක් හදමු. මගේ දුව වෛද්‍යවරියක වෙලා ඔබට කිව්වේ අන්න ඒ රහසයි.

අත්තනායක එම්. හේරත්

කටට රසට බයිට් එකයි සම්බෝලෙයි

චිකන් සම්බෝල

අවශ්‍ය ද්‍රව්‍ය

- කටු රහිත කුකුල් මස් ග්‍රෑම් 150
  (එය ලුණු කුඩු, ගම්මිරිස් කුඩු හා දෙහි යුෂ සමඟ පදම් කර පැයක පමණ කාලයක් ශීතකරණයේ තබන්න.)

සම්බෝලය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

- පොල් බෑයක පොල් (ගාගත්)
- කෑලිමිරිස් මේස හැඳි 1 1/2
- සුදුලූනු බික් 2
- රතුලූනු ගෙඩි 4/5
- ලුණු කුඩු අවශ්‍ය පමණට
- ගම්මිරිස් ඇට 6/7

සාදන ක්‍රමය

- මෙය ගලේ අඹරා හෝ වංගෙඩියේ, බ්ලෙන්ඩරයේ කොටා රසවත් සම්බෝලයක් ලෙස සාදාගන්න. (ඊට දෙහි ඇඹුල් වික් නොකරන්න.)
- දැන් සීසන් කරගත් කුකුල් මස් ශීතකරණයෙන් ගෙන ගැඹුරු තෙලේ බැදගන්න.
- එසේ බැදගත් චිකන් කැබලි අතින් ඉරා බඳුනකට දමාගන්න.
- බී ලූනු ගෙඩියක් ගෙන සිහින්ව ලියාගන්න.
- අමුමිරිස් කරල් 2/3ක් ගෙන සිහින්ව කපාගන්න.
- සුදුලූනු බික් 2ක්ද ගෙන ඒ ලෙසම කපාගන්න.
- තක්කාලි ගෙඩියක් ගෙන කොටු හැඩයට කපාගන්න.
- දැන් තෙල් ස්වල්පයක් චික්කළ භාජනයක් ලිප තබා එය රත්වනවිට ඊට රම්පේ, කරපිංචා, කපාගත් සුදුලූනු චික්කොට රන්පැහැ වනතෙක් බැදගන්න.
- අනතුරුව එයට කපාගත් ලොකු ලූනු ගෙඩිය හා අමුමිරිස් චික්කරගන්න.
- එය බැදුනු පසු ඊට තක්කාලි, මිරිස්කුඩු ස්වල්පයක් දමා රස අනුව ලුණු චික්කරගන්න.
- අනතුරුව අතින් ඉරාගත් කුකුල් මස් ඊට චික්කර කලවම් කරගන්න. (එය විනාඩියක් පමණ පියනකින් වසා උයාගන්න.)
- අනතුරුව පොල් සම්බෝලය ඊට චික්කර මද ගින්දරේ තවත් වේලාවක් පිස ලිපෙන් බාගන්න.
- දැන් දෙහි යුෂ ස්වල්පයක් චික්කර හොඳින් කලවම් කර කෑම මේසයට යවන්න.

කොස් සිවිඩි මිශ්‍ර බැදුම

අවශ්‍ය ද්‍රව්‍ය

- සෝඳ පිරිසිදු කරගත් කොස් සිවිඩි 50
- හාල්මැස්සන් ග්‍රෑම් 50
- කඩල පරිප්පු ග්‍රෑම් 50
- නූඩ්ල්ස් ග්‍රෑම් 50
- වියළි මිරිස් කරල් 4/5
- කරපිංචා ඉති 2/3
- බැදගැනීමට තෙල්
- මිරිස් කුඩු ස්වල්පයක්
- රස අනුව ලුණු හා සීනි ස්වල්පයක්

සාදන ක්‍රමය

- කොස් සිවිඩි ටික හොඳින් සෝදා ජලය ඉවත්කර, ගැඹුරු තෙලේ බැදගන්න.
- සෝදා පිරිසිදු කරගත් හාල්මැස්සන්ද තෙලේ බැදගන්න.
- කඩල පරිප්පු පැයක් පමණ පෙඟෙන්නට තබා බැදගන්න. (කැමතිනම් කඩල පරිප්පු වෙනුවට රටකජු ගන්න.)
- දැන් නූඩ්ල්ස් ටිකද ගැඹුරු තෙලේ රන්වන් පැහැයට බැදගන්න.
- කරපිංචා හා වියළි මිරිස් කරල් ටිකද වෙන වෙනම බැදගන්න.
- මෙසේ බැදගත් වියළි මිරිස් කරල් කුඩා කැබලිවලට කපාගන්න.
- දැන් ඉහත බැදගත් සියල්ල තෙල් බේරෙන්නට හැර ඉඩකඩ ඇති බඳුනකට දමා කලවම් කරගන්න.
- ඊට රස අනුව මිරිස්කුඩු සහ ලුණු කුඩු චික්කර දෙහි ඇඹුල් ස්වල්පයක්ද චික්කර හොඳින් කලවම් කරන්න.
- මෙය වැඩිපුර තිබේනම් සුළං නොවදින සේ වීදුරු බෝතලයක අසුරා තබන්න.

ආහාර වට්ටෝරු ඉදිරිපත් කිරීම
නිරෝෂි දොළමුල්ල

දැන්වීමකි

සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් ඔබ්බට ගොස් කෘෂි ආර්ථිකය නගාසිටුවීම කාලීන අවශ්‍යතාවයකි

අතීතයේ සිටම කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ අදටත් බොහෝ පිරිසකගේ ජීවනෝපාය වන්නේ ගොවිතැනයි. ලෝකයේ වෙනත් රටවල් කෘෂිකර්මාන්තය තුළින් විශාල ආදායම් උපයන අතර ඊට ප්‍රධානතම හේතුව ඔවුන් නවීන කෘෂි තාක්ෂණයන් සහ නව ක්‍රමෝපායන් භාවිතා කරමින් යාවත්කාලීන වීමයි. පරම්පරාවෙන් උරුම වූ සම්ප්‍රදායික කෘෂිකාර්මික දැනුම, පිළිවෙත් සහ භාවිතයන් මත පමණක් පදනම් වෙමින් ගොවිතැන් කටයුතු කරන ගොවි ප්‍රජාව වෙත ඉහළ වෙළෙඳපළ වටිනාකමක් ඇති නව බෝග හඳුන්වාදෙමින්, නවීන කෘෂි යෙදවුම් සහ තාක්ෂණයන් පිළිබඳ දැනුම ලබා දීම කාලීන අවශ්‍යතාවයකි.

බෝග අස්වනු අලෙවියේදී ගොවියාට වඩා අතරමැදියා වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම ගොවි ජනතාවට මුහුණදීමට සිදුවන ප්‍රධාන ගැටලුවක් වන අතර දැනට පවතින දැඩි අභියෝගාත්මක ආර්ථික පසුබිම සහ අර්බුදකාරී පොහොර ගැටලුව මධ්‍යයේ මෙරට ගොවි ප්‍රජාව තවදුරටත් දැඩි ලෙස පීඩාවට පත්ව ඇත. මෙම වාතාවරණය තුළ රටේම කුසගින්න නිවන ගොවි ජනතාව පිළිබඳ අවධානය යොමු කරමින් ඔවුන්ව සවිබල ගැන්වීම ජාතික වගකීමක් වන අතර එය වක්‍රාකාරව මෙරට දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීමට දායක වීමකි.

මේ පිළිබඳව තම අත්දැකීම් ගෙනහැර දක්වමින් ගොඩකවෙල, රන්වල, ගැමුණු ගොවි සංවිධානයේ සභාපති H.M. රත්නායක බණ්ඩාර මහතා නවීන කෘෂි යෙදවුම් සහ තාක්ෂණයන් භාවිතා කිරීමේ වැදගත්කම සහ ඒ තුළින් අත්වන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව අදහස් දැක්වූවේය.

"ඇත්තටම අපි පරම්පරාවෙන් ලැබුණු දැනුම තුළින් තමයි මෙච්චර කාලයක් ගොවිතැන කරගෙන ආවේ. අලුත් දැනුම සහ තාක්ෂණික ක්‍රම අපිට තිබුණේ නෑ. ඒ හැමදේමත් චික්ක පොහොර ගැටලුවකට වගේම ආර්ථික අර්බුදයකටත් මුහුණ දෙන්න අපිට සිද්ධ වුණා. මේ හැමදේමත් චික්ක ගොවිතැන් වලින් හොඳ ආදායමක් ලබා ගැනීම අපිට හීනයක් වෙලයි තිබුණෙ. නමුත් බිම් සකස් කරන තැන සිට ඵලදාව මිලදී ගන්නා තැන දක්වාම හේලීස් ඇග්‍රිකල්ච (Hayleys Agriculture) හි කෘෂි උපදේශක මහතුන් අපිට නව දැනුම සහ අවශ්‍ය සියලු සහය ලබාදෙමින් අපිට ලොකු ශක්තියක් වුණා. මහ කන්නයේ දී අපි වී වගාව සිදු කරන අතර අතිරේකව බතල, රටල, ඉන්නල වැනි සාම්ප්‍රදායික වගාවන් තමයි කාලයක් තිස්සේ කරගෙන ආවේ. දැනට වසර 25කට පමණ කලින් වීම වගාවෙන් මිදිලා වැඩි වශයෙන් ආර්ථික ප්‍රතිලාභ ලබාගන්න පුළුවන් කොළ කැකිරි වැනි නව බෝග වගාවන්ට අපිව යොමු කළේ හේලීස් ඇග්‍රිකල්ච ආයතනයයි."

සම්ප්‍රදායික බෝග වගාවන් වලින් සාමාන්‍යයෙන් මසකට අක්කරයකින් ලැබෙන්නේ රුපියල් 30,000ක් පමණ අමතර ආදායමක් වන අතර, කොළ කැකිරි වගාව හරහා මාස 2 2 1/2 බෝග වගා කාල සිමාවන් තුළදී, හිතකර තත්ත්ව යටතේ අක්කරයකින් රුපියල් 450,000ක් පමණ අමතර ආදායමක් උපයා ගැනීමට ගොවි මහතුන්ට හැකියාව ලැබී ඇත. මෙවැනි පීඩාකාරී ආර්ථියක් තුළ මුහුණ දීමට සිදුවන අභියෝග සාර්ථකව ජය ගැනීම සඳහා එය මනා පිටුවහලකි.

"හේලීස් ඇග්‍රිකල්ච ආයතනය කෘමි හානි පාලනය කරගනිමින් සහ වගාවට වැළඳෙන ලෙඩ රෝග අවම

කරගනිමින් සාර්ථක වගාවක් පවත්වාගෙන යෑමට අවශ්‍ය දැනුම අපිට ලබාදෙනවා. හේලීස් ඇග්‍රිකල්ච ආයතනය මඟින් පවත්වන ගොවි පුහුණු වැඩසටහන් හරහා ලබාදෙන දැනුම අපිට සාර්ථක ගොවි බිමක් පවත්වාගෙන යාමටත් හොඳ ඵලදාවක් සහ ඉහළ ආදායමක් ලබා ගැනීමත් උපකාරී වෙනවා. කෙතරම් ඉහළ අස්වැන්නක් ලබාගත්තත් අතරමැදි වෙළෙන්දන්ගේ මැදිහත් වීම නිසා එය සාධාරණ මිලකට අලෙවි කර ගැනීම අභියෝගාත්මක වෙනවා. ඊට පිළියමක් විදිහට හේලීස් ඇග්‍රිකල්ච ආයතනය අපේ අස්වැන්න ඉහළ මිලකට සෘජුවම මිලදීගෙන අපේ මහන්සියට වැඩි වටිනාකමක් ලබා දෙනවා.

මෙතරම් සාර්ථක ගමනක් වීමට අපට අවශ්‍ය උපදෙස් සහ සහය නිරතුරුවම ලබා දෙමින් වගේම ඵලදාව ඉහළ මිලකට මිලදී ගනිමින් අපට ශක්තියක් වන හේලීස් ඇග්‍රිකල්ච ආයතනයට අපි ස්තූතිවන්ත වෙනවා". යනුවෙන් රත්නායක මහතා පැවසුවේය.

මෙසේ මිලදී ගන්නා ඵළවළු, පලතුරු සහ කුළුබඩු, හේලීස් ඇග්‍රිකල්ච හි අනුබද්ධිත සමාගමක් වන HJS Condiments Limited මඟින් අගය එකතු කළ නිෂ්පාදන ලෙස ලෝකයේ රටවල් 52කට අධික සංඛ්‍යාවකට අපනයනය කරනු ලැබේ. නව්‍ය සහ පෙරළිකාර ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කළ අගය එකතු කළ පොළොස් නිෂ්පාදන සඳහා, මස් වෙනුවට ගන්නා ශාකමය ආදේශකයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපලෙහි ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. කාන්තාවන් විශාල පිරිසකට අමතර අදායම් මාර්ග උදාකරදෙමින්, දෙශීය කාන්තාවන් සවිබල ගැන්වීමට මෙම ව්‍යාපෘතිය හරහා හැකියාව ලැබී ඇත. ග්‍රාමීය ගොවීන් ගෝලීය සැපයුම් දාමයන්ට සම්බන්ධ කරමින්, මෙරටට විදේශ විනිමය ගෙන ඒමට ආයතනය දරන උත්සාහය විවිධ අවස්ථාවලදී දේශීයව සහ විදේශීයව සම්මාන රැසකින් ඇගයීමට ලක්වී ඇත.

1950 සිට අද දක්වා ගුණාත්මක කෘෂි යෙදවුම් සහ සේවා සපයමින්, නවීන කෘෂි තාක්ෂණයන් හඳුන්වා දෙමින්, මෙරට සුවහසක් ගොවි ජනතාවගේ පිවන තත්ත්වය නගාසිටුවීමටත්, ශ්‍රී ලංකාවේ තිරසර සහ හරිත කෘෂිකර්මාන්තයක් ඇතිකරවීමටත් හේලීස් ඇග්‍රිකල්ච (Hayleys Agriculture) ගන්නා උත්සාහය සහ කැපවීම බෙහෙවින් අගය කළ යුතුයි.

එංගලන්තයේ පැවති කිසිදු ටෙස්ට් ක්‍රිකට් තරඟයකදී, එංගලන්ත කණ්ඩායමක් පරාජය කිරීමට ඒ වනවිටත් ශ්‍රී ලංකා කණ්ඩායමකට හැකිවී තිබුණේ නැත. ඒ ක්‍රිකට් උපන් දේශය වූ එංගලන්තයේදී ඔවුන්ව පරාජය කිරීමට ඇති අසීරුකම නිසාය. නමුත් 2014 වසරේදී එංගලන්තයේ ලීඩ්ස්හි පැවති තීරණාත්මක ටෙස්ට් තරඟය ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව අපේ කණ්ඩායම ඒ වාර්තාවද බිඳ දැමුවේය.

එහිදී මුලින්ම පන්දුවට පහරදුන් ශ්‍රී ලංකා කණ්ඩායම පළමු ඉනිම වෙනුවෙන් ලකුණු 257ක් ලබාගත් අතර එංගලන්තය පළමු ඉනිමට ලකුණු 365ක් ලබාගත්තේ ශ්‍රී ලංකා මුල් ඉනිමට වඩා ලකුණු 108 ක වාසියක්ද සමඟිනි. අනතුරුව දෙවැනි ඉනිම ඇරඹූ ශ්‍රී ලංකා කණ්ඩායමේ කිසිවෙකුත් නොසිතූ අන්දමින් ලකුණු 277කට කඩුලු හයක් බිඳවැටුණි. එදා හත්වන පිතිකරුවා ලෙස ක්‍රීඩා පිටියට පැමිණියේ ධම්මික ප්‍රසාද් ය. පැමිණි සැනින්ම අනෙක් අන්තයේ උන් ඇන්ජිලෝ මැතිස්විගෙන් ඔහුට උපදෙසකි. ඒ ලකුණු නොගැසුවත් කඩුල්ල ආරක්ෂා කරගන්නා ලෙසයි. නමුත් අනපේක්ෂිත පහරක් එල්ලකරන්නට ගොස් ධම්මික මුල් පන්දුවෙන්ම දැවී ගියේය. එතැන් පටන් ඔහු සිටියේ පසුතැවීමෙනි. එහෙත් පිත්තෙන් කරන්නට බැරිවූ හපන්කම පන්දුවෙන් හෝ කරන්නට ධම්මික සිතාගත්තේය. අවසානයේ සිතූ දේ කර පෙන්වීය. ඒ එංගලන්ත ඉනිමේ ප්‍රබලම කඩුලු 5ක් දවාගනිමින් නොතිබූ ජයග්‍රහණයක් ශ්‍රී ලංකා කණ්ඩායම වෙත ගෙනඒමිනි. එකී ඓතිහාසික ජයග්‍රහණයට දැන් වසර 9කි. ඉතින් ඒ ජයග්‍රහණයට උරදුන් ඒ විශිෂ්ටයා සොයා පසුගියදා අපි ඔහුගේ නිවසට ගොඩවැදුනෙමු. ධම්මික වෙනුවට අපට මුණගැසුනේ ඔහුගේ ආදරණීය බිරිඳ නිහාරි ය.

ක්‍රිකට් නොගැහුවාට තාමත් පාරට බැස්සම සෙල්ෆියක් දෙකක් ගහන්න වෙනවා

ධම්මික ප්‍රසාද්ගේ බිරිඳ නිහාරි සිල්වා

මේ මැතක ඉඳන් එයා හොඳට කවි ලියනවා. ඒක කොහෙන් ආපු හැකියාවක්ද මන්දා

ධම්මිකගෙන් ආදර යෝජනාවක් ආවේ ඔබ හයේ පන්තියේ ඉන්නකොට කියන්නේ ඇත්තද?

(සිනාසෙමින්) ඇත්ත. මං හයේ පන්තියේ එයා දහය පන්තියේ. ඉතින් එයාට කොහොම වුණත් මට නම් ඒ වෙනකොට ආදරේ ගැන කිසිම තේරුමක් තිබුණේ නෑ. ඉතින් ධම්මික මගෙන් යාළුවෙන්න අහද්දි මං ගෙදර ගිහින් ඒක අම්මට කිව්වා.

එතකොට ඔය දෙන්නගේ ආදර කතාව පටන්ගන්නේ කොතැනින්ද?

මං උසස් පෙළ ලියලා සතියක් විතර ඉන්නකොට ධම්මික ආයෙත් මගෙන් ඇහුවා. මට හරි පුදුමයි එයා මං වෙනුවෙන් එච්චර ලොකු කාලයක් බලාගෙන හිටපු එකට. ඒකට නම් මට එයා ගැන ආදරේ හිතුණා. පස්සේ මං එයාට කිව්වා කෙළින්ම අපේ ගෙදරට ඇවිත් අම්මලාගෙන් අහන්න කියලා. ඉතින් එයා අපේ ගෙදර ඇවිත් ඇහුවා. මටවත් ගෙදර අයටවත් අකමැති වෙන්න හේතුවක් නෑ. ඒ විදියට අවුරුදු එකහමාරක් වගේ ආදරේ කරලා 2010 අවුරුද්දේ අපි විවාහ වුණා.

ධම්මිකගෙයි ඔබෙයි විවාහය සිද්ධවෙනකොට එයා ජාතික කණ්ඩායමට තේරිලා නේද හිටියේ?

ඔව්. ඒත් මට ඒ වෙනකොට ක්‍රිකට් ගැන තේරුමක් නෑ. ඒක නිසා ධම්මික ජාතික කණ්ඩායමේ හිටියා කියලා ලොකුවට දැනුණේ නෑ.

ධම්මික පන්දු යවන්නෙක් වුණේ එයාගේ පාසල් කණ්ඩායමේ පන්දු යවන්නෙක් හිටපු නැති හින්ද කියන්නේ ඇත්තද?

ඒක ඇත්තක්. දවසක් එයාලගේ ඉස්කෝලේ මැච් එකක් තිබිලා. එදා වේගපන්දු යවන්න කෙනෙක් ඉඳලා නෑ. පස්සේ පුහුණුකරු ධම්මිකට බෝල් දෙන්න කියලා. එයා හරි ආසයි අභියෝග බාරගන්න. අන්තිමේ එයා ඒ මැච් එකේ හොඳටම බෝල් කරලා. මැච් එක ඉවරවුණාට පස්සේ පුහුණුකරු කිව්වලු "ධම්මික ඔයා දිගටම බෝල් කරන්න" කියලා. ඉතින් එදා ඉඳන් ධම්මික බෝල් කරන්න පටන් අරන්. ඒ නැත්තම් එයා මුල්පෙළ පිතිකරුවෙක් විදියටයි පාසල් කණ්ඩායමේ ඉඳලා තියෙන්නේ.

සාමාන්‍යයෙන් ක්‍රිකට් ක්‍රීඩකයෝ කියන්නේ හරි කාර්යබහුල පිරිසක්නේ. විවාහයෙන් පස්සේ ඒක දැනුණේ කොයි විදියටද?

කොච්චර කාර්යබහුල වුණත් ඒක මට දැනෙන්න ධම්මික ඉඩ තිබ්බේ නෑ. මොකද එයා ගොඩාක් වෙලාවට මාවත් එක්ක තමයි පිටරට තරඟ සංචාරවලට එහෙම ගියේ. හැබැයි මට පළවැනි දරුවා ලැබෙද්දි නම් මං කොහෙවත් ගියේ නෑ. එතකොට නම් ධම්මික ළඟ නැති අඩුව දැනුණා. මං හිතන්නේ ලොකු දුව ලැබෙද්දි එයා පාකිස්තානු තරඟ සංචාරයකට සහභාගි වෙලා හිටියේ.

එතකොට ඒ කාලේ ධම්මික දිහා ලස්සන ලස්සන ගෑනු ළමයි එහෙම බලද්දි නිහාරිට මොකද හිතුණේ?

බැන්ද අලුත නම් මට ඒ දේවල් වැඩිය ඇල්ලුවේ නෑ. ඒත් පස්සේ පස්සේ ඒක සාමාන්‍ය දෙයක් වුණා. මොකද මං තේරුම්ගත්තා ධම්මික මගේ සැමියා වුණාට එයාට රටක්ම ආදරෙයි කියලා.

2014 වසරේ ශ්‍රී ලංකා කණ්ඩායම එංගලන්තයේදී ඓතිහාසික ජයග්‍රහණයක් ලබාගත්තා. ඒ කියන්නේ ඉතිහාසයේ පළමු වතාවට අපේ කණ්ඩායම එංගලන්තයේදී එංගලන්ත කණ්ඩායමක් පරාජය කළා. එද තරඟය නිහාරිට අමතක නැතුව ඇති?

කොහොම අමතක කරන්නද ඒක. එද ධම්මික කඩුලු පහක් අරන් ඒ ඓතිහාසික ජයග්‍රහණයේ ලොකු කොටස්කරුවෙක් වුණා. ඉතින් ඒකත් එක්ක ඒ තරඟය තාමත් මතකයි.

හැබැයි ඒ කඩුලු පහ පිටිපස්සේ ලොකු රහසකුත් තියෙනවා නේද?

(සිනාසෙමින්) ඔව් ඔව්. එදා තරඟේ අපේ කණ්ඩායමේ දෙවැනි ඉනිම පොඩ්ඩක් අවුල්වෙලා තිබුණේ. මොකද ලකුණු දෙසිය ගණනකට කඩුලු හයක් ගියානේ. එදා ධම්මික අංක හත පිතිකරුවා විදියට බැට් කරන්න යද්දි අනෙක් පැත්තේ ඇන්ජිලෝ මැතිව්ස් හිටියේ. ඉතින් මැතිව්ස් කිව්වලු "ධම්මික ඔයා විකට් එක තියාගෙන ඉන්න බලන්න, මං ගහන්නම්" කියලා. ඒක අහන්නැතුව මෙයා ගහන්න ගිහින් අවුට් වුණා. ඒකට ධම්මිකටත් අවුල්. ඒ වෙලාවේ තමයි එයාට හිතිලා තියෙන්නේ බැට් එකෙන් කරන්න බැරිවුණු දේ කොහොම හරි බෝලෙන් කරනවා කියලා. එහෙම හිතලා තමයි එදා කඩුලු පහක් ගත්තේ.

එතකොට ධම්මික කේන්තියෙන් වගේ ඉන්දියාවේ ඉෂාන්ට් ෂර්මා පිටිපස්සේ පන්නගෙන ගියපු තරඟය ඔබට මතකද?

(සිනාසෙමින්) වැඩේ කියන්නේ එදා මං මැච් එක බලන්න ගිහින් හිටියේ. මමත් බැලුවා මෙයා මේ මොකද කරන්නේ කියලා. ඇත්තටම වෙලා තියෙන්නේ එදා ඉෂාන්ට් ෂර්මා දිනේෂ් චන්දිමාල්ට මොකක් හරි කියලා. ඒකට ධම්මිකත් පැටලිලා. ඒ වෙලාවේ ඉෂාන්ට් ෂර්මා අවුට්වෙලා යනකොට ධම්මික එයාගේ පස්සෙන් පැන්නුවනේ. හැමෝම හිතුවේ ඒ යන්නේ ධම්මික ඉෂාන්ට් ෂර්මාට ගහන්න කියලා.

ඇත්තටම ඇයි එදා ධම්මික ඉෂාන්ට් ෂර්මාගේ පස්සෙන් පන්නලා තියෙන්නේ? ඒක අදටත් රහසක්?

මම නැති වෙලාවට එයා තමයි ගෙදර උයන්නේ

(සිනාසෙමින්) ධම්මික නම් කියනවා බලාගෙන ඉන්න අයට පේන්න පොඩි විහිලුවක් කළේ කියලා. තව වෙලාවකට කියනවා තේ එකක් බොන්න යමු කියන්නලු පන්නගෙන ගියේ. කොහොමහරි මමත් ඒ වෙලාවේ ඇඟේ ලේ නැතුව හිටියේ ධම්මික මොනවා කරගනියිද කියලා.

ධම්මික හොඳින්ම දස්කම් අතර සිටියදී තමයි ආබාධත් එක්ක එක්වරම ජාතික කණ්ඩායමට සමුදුන්නේ. තවත් කාලයක් ක්‍රීඩා කරන්න පුළුවන්කම තියෙද්දි එයා ගත්තු තීරණය ඔබට එදා දැනුණේ කොයි විදියටද?

එයාට ආබාධයක් ඇවිත් අවුරුදු එකහමාරක් විතර ක්‍රිකට් නවත්තන්න වුණානේ. වෛද්‍යවරු කියලා තිබුණේ ශල්‍යකර්මයක් කරන්න ඕන, ඒක කළාම ආයෙත් ක්‍රිකට් ගහන්න බැරිවෙයි කියලා. ඒත් එයාට ආයෙත් ක්‍රිකට් ගහන්න ලොකු ඕනකමක් තිබුණා. ශල්‍යකර්මයෙන් පස්සේ ක්ලබ් මැච්වල එහෙම හොඳින්ම ක්‍රීඩා කළා. ඒත් එයා එතැනදි දැකලා අලුත් පන්දු යවන්නෝ කණ්ඩායමට එන්න ඉන්න හැටි. පස්සේ එයාලට එන්න අවස්ථාවක් දීලා ධම්මික ක්‍රිකට්වලින් සමුගත්තා.

***ඔබට හිතෙන විදියට එයා ක්‍රිකට් නොගැහුවා නම් මොන වගේ පැත්තකින් ඉදිරියට යයිද?**

ඒක නම් හිතාගන්න බෑ. මොකද එයා කවුරුත් යටතේ ජොබ් එකක් කරන්න කැමති නෑ. ඒ නිසා මං හිතනවා එයා නළුවෙක් හරි ගායකයෙක් හරි වෙන්න ඉඩක් තිබුණා කියලා. මොකද ඒ දෙකටම එයා දක්ෂයි.

ධම්මික ක්‍රිකට්වලින් සමුගත්තට පස්සේ එදා තිබුණු ජනප්‍රියත්වය අදටත් එයාට ලැබෙනවද?

ඇත්තටම ලැබෙනවා. එයා ක්‍රිකට් ගහපු කාලෙටත් වඩා දැන් ඒක එයාට ලැබෙනවද කියලත් හිතෙනවා. ඒ ගැන අපි දෙන්නටම පුදුමයි. මොකද සාමාන්‍යයෙන් ක්‍රිකට්වලින් අයින්වුණාට පස්සේ ඒ තිබුණු ජනප්‍රියත්වය අඩුවෙන එකයි වෙන්නේ. ඒත් ධම්මිකට එහෙම වෙලා නෑ. අදටත් එයාට පාරේතොටේ යද්දි සෙල්ෆියක් දෙකක් නම් ගහන්නම වෙනවා.

ක්‍රිකට් ඇරුණම ධම්මික තව තව දේවල්වලටත් දක්ෂයි නේද?

මේ මෑතක ඉඳන් එයා හොඳට කවි ලියනවා. ඒක කොහෙන් ආපු හැකියාවක්ද මන්ද. අඩුතරමේ මං යාළුවෙලා ඉන්නකොටවත් එයා මට කවියක් ලිව්වේ නෑ. ඒත් දැන් ලියනවා. ඒ වගේමයි එයාට කටට රහට උයන්නත් පුළුවන්. කොවිඩ් කාලේ තමයි උයන්න නම් පුරුදුවුණේ. සමහර දවස්වලට මං වැඩවලට එළියට ගියාම කෑම කඩෙන් ගේන්නද කියලා ධම්මිකගෙන් අහනවා. ඒ වෙලාවට එයා මං කෑම හැදුවා කියලා කෑමවල ෆොටෝස් මට එවනවා.

අපි දකිනවා ධම්මික අසරණ මිනිස්සුන්ට වගේම පුංචි දරුවන්ට නිතරම උදව් උපකාර කරනවා. ඒක දැන් ධම්මිකගේ ජීවිතේ කොටසක්ද?

කිව්වත් වගේ දැන් ඒක එයා ජීවිතයේ කොටසක් කරගෙන තියෙන්නේ. එහෙම නැත්නම් පුරුද්දක් වෙලා. ඒකෙන් එයා ලොකු සතුටක් ලබනවා.

ටිකක් වයසට ගියත් ධම්මික තාමත් කොල්ලා වගේ. අවසාන වශයෙන් ඒකට රහස කියන්න පුළුවන්ද?

(සිනාසෙමින්) අනේ ගොඩාක් අය කියනවා ධම්මික එන්න එන්නම තරුණ වෙනවා කියලා. මං හිතන්නේ ඒකට එකම රහස එයාගේ හිත හොඳකම තමයි.

■ රුවන් එස්.සෙනවිරත්න

අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

මාසික අධ්‍යාපනික පුවත්පත්

6

පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත
පිංතූර පොත් දරුවන්ගේ
නිපුණතා වර්ධනය පෙන්වයි

අකුරු කරන්නට අලුතින්ම පාසලට පිය නැගූ පුංචි නංගිලා මල්ලිලාට

සිංහල ගණිතය පරිසරය ඉංග්‍රීසි දෙමළ පාඩම් සමඟින්

ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348

දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් මිලදී ගතහැක

මළවුන්ට පණ දෙන 'සංජීවනී' අනුරාධපුරේට යන පාරේ ඉන්නවලු

ආර්ථික ගැටලු මඟහරවා ජීවිතයට සතුට, සෞභාග්‍යය උදාකරන ශාක වර්ග කිහිපයක් අනුරාධපුරට යන ප්‍රධාන මාර්ගයක් අද්දර අලෙවිසැලක විකිණීමට ඇති බව මට කීවේ පසුගිය දිනෙක වන්දනාවේ ගිය විශ්‍රාමික පාසල් ගුරු මහත්මියකි.

අනුරාධපුර වන්දනාවේ යන්නවුන් හට රසකැවිලි ආදිය මිලට ගැනීමටත්, විවේකය ගත කිරීමටත් හැකි ලෙස සෑදූ ස්ථානයකට මදක් නොදුරින් එම පැළ අලෙවිසැල පවත්වාගෙන ගොස් තිබුණේ තරුණයන් කිහිපදෙනෙකු විසිනි.

"එතැන ඉස්සරහා එක එක ජාතියේ මල් පැළ, පෝච්චි දෙතුන් සීයක් වගේ තිබුණා. ඒත් ඒවා විකුණන තැන පිටිපස්සේ දැල් ගහලා ආරක්ෂා කරපු තැනක තමයි ඔය කියන විශේෂ පැළ වර්ග තිබුණේ. ඒ පැළයක් ගෙදරක තියෙනකල් ඒ ගෙදරට අගහිඟකම් දැනෙන්නෙත් නැතිලු, ගෙදර අය ලෙඩ වෙන්නෙත් නැතිලු, ගෙදරදෙරේ රණ්ඩු සරුවල් ඇතිවෙන්නෙත් නැතිලු. ඒවා විකුණන ළමයි ඔය වගේ මහලොකු හැල්ලක් කියාගෙන ගියා. අපිත් එක්ක වන්දනාවේ ගිය හත් අටදෙනෙක්ම ඒ පැළ ගත්තා. මම හිතන්නේ ඒ එක පැළයක් රුපියල් දෙදහේ ඉඳලා පන්දහ අතර ගණන්වලට තමයි විකුණුනේ. නමුත් මම නම් ඒ ළමයින්ගේ කතා එච්චර විශ්වාස කළේ නෑ." එම ගුරුතුමිය වැඩිදුරටත් කීවාය.

ඒ පැළයක් ගෙදරක තියෙනකල් අගහිඟකම් දැනෙන්නෙත් නැතිලු, ගෙදර අය ලෙඩ වෙන්නෙත් නැතිලු, රණ්ඩු සරුවල් ඇතිවෙන්නෙත් නැතිලු

"ඉතින් ඒ පැළ නම් වශයෙන් මොනවද කියලා එතැන හිටපු කවුරුවත් ඇහුවෙවත් නැද්ද?" ඇගේ එම කතාවෙන් හටගත් උනන්දුව මතින් මම ඇසීමි.

"එතැන ඔය කියන ජාතියේ පැළ වර්ග දහයක් දෙළහක් තිබුණා. ඒ අතරේ ඉර රාජ, සඳ රාජ, වන රාජ, ගුරුළු රාජ වගේ දුර්ලභ පැළත් තියෙනවා කිව්වා. ඒ එක්කම සංජීවනි කියන පැළයත් සෝම කියන පැළය එහෙමත් තියෙනවා කිව්වා. හැබැයි පැළ බලන්න එන අයට රහසින් වගේ ඒ පැළ ගැන විස්තර කියලා තමයි ඒ ළමයි පැළ බලන අයව පිටිපස්සට එක්ක ගියේ." එම ගුරු මහත්මිය කීවාය.

මා දන්නා අන්දමට සංජීවනී සහ සෝම යනුවෙන් ව්‍යාවහාර වන ශාක වර්ග මෙතෙක් නිසි හඳුනාගැනීමකට ලක්ව නැත. රාමායන ආදී පැරණි කෘතීන්හි සඳහන් වන අන්දමට සංජීවනී යනු මළවුන්ට පණ දෙන ඖෂධ පැළෑටියකි. සෝම යනු චන්ද්‍රයාගේ ඇතැයි කියන සියලුම ශක්තීන් (ඒ මොනවාදැයි මම නොදනිමි) උරාගෙන වැඩෙන මහා බලගතු ශාකයකි. එහෙත් මේවා මේ මිහිපිට කොතැනක හෝ ඇති බවට නිශ්චිතව හඳුනාගෙන නැත. එහෙත් ඉර රාජ, සඳ රාජ, වන රාජ සහ ගුරුළු රාජ යන පැළෑටි එසේ නොවේ. ඒවා අපගේ ලක් පොළොවේ වැවෙන ශාක විශේෂයන්ය. එබැවින් මම ඒ සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳව මනා හැදෑරීමක් කොට ඇති ප්‍රවීණ ආයුර්වේද වෛද්‍යවරයෙකු වන ඩැනිස්ටර් වල් පෙරේරා මහතාගෙන් අසා සිටියෙමි.

"ඔය ඉර රාජ, සඳ රාජ, ගුරුළු රාජ, වන රාජ කියන්නේ බොහොම වටිනා ඖෂධ පැළෑටි. ඒත් ඒවයේ ඔහොම හාස්කම් බලයක් තියෙනවා කියන එක නම් පට්ටපල් බොරුවක්. කවුද එහෙම කියන්නේ?" ඔහු ඇසීය.

"අනික ඔය කියන ශාක ඔක්කොම තෙත් කලාපීය දේශගුණයක් තුළ හැදෙන ඒවා. ඕවා ගලවාගෙන ගිහින් පෝච්චිවල හිටුවන්නත් බෑ. හැබැයි ඔතන මෙහෙම දේකුත් තියෙන්න පුළුවන්. දැන් අපේ රටේ ප්‍රාණජීව කියලා මහා හාස්කම් දනවන ශාකයක් ගැන කියැවෙනවානේ. පණ අදින මනුස්සයෙකුට ඒ ශාක යුෂ බින්දුවක් පෙව්වොත් පණ එනවා කියලත් කතාවක් තියෙනවා. නමුත් ඒ ශාකයට ප්‍රාණජීව කියන්නේ ඒ ගහේ පෙතිවල පණ තියෙන ගතියක් පේන හින්ද මිසක් ඔහොම හාස්කම් බලයක් තියෙන හින්ද නෙවෙයි. ඒ වගේම ඔය කියන ශාකවලට රාජ, කියන නමත් සම්බන්ධ නිසා තමයි ඔය වගේ කතා හැදිලා තියෙන්නේ. ඒත් මම නම් හිතන්නෙම ඔය වගේ තැන්වල ඒ නම් යොදාගෙන වෙන මොනවාහරි පැළ විකුණනවා ඇති. වන සත්ව සහ වෘක්ෂලතා පනත යටතේ ඔය කියන ශාක ඔක්කොම ආරක්ෂිත ශාක විදියටයි හැඳින්වෙන්නේ. ඕවා ඔය විදියට විකුණන එක සම්පූර්ණයෙන් තහනම්." වෛද්‍ය ඩැනිස්ටර් වල් පෙරේරා මහතා කීය.

පසුව මම ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු විමසීම පිණිස ප්‍රවීණ පරිසරවේදී සජීව චාමිකර මහතා ඇමතීමි.

"අපේ රටේ තියෙනවා දේශීය උඩවැඩියා විශේෂ එකසිය අනූඅටක්. වන සත්ව සහ වෘක්ෂලතා ආඥා පනත යටතේ ඒවා ඉවත් කිරීම, ප්‍රවාහනය, අලෙවිය ආදී හැමදෙයක්ම සපුරා තහනම්. ඒ වගේ දෙයක් කරන කෙනෙකුට රුපියල් දස දහසක දඩයක්, අවුරුදු දෙකක සිරදඬුවමක් කියන දෙකෙන් එකක් හරි ඒ දෙකම හරි නියම කිරීමේ බලයක් අධිකරණයට තියෙනවා. ඒ හින්ද ඔය කියන පැළ ඇත්තම උඩවැඩියා විශේෂ නම් විකුණන එක වගේම මිලදී ගන්න එකත් හරිම භයානකයි." සජීව චාමිකර මහතා කීය.

විකුණන එක වගේම මිලදී ගන්න එකත් වැරදියි

ඒ කෙසේ වුවද අද වනවිට අපේ රට මෑත භාගයේ සිදු නොවූ තරම් දරුණු ආර්ථික පරිහානියකට පත්ව තිබේ. එනිසා අද රටෙන් වැඩි පිරිසක් ආහාරපාන සපයාගැනීම ඇතුළු තම මූලික අවශ්‍යතා සපුරාගැනීම පිළිබඳ ප්‍රබල ගැටලුවකට මුහුණ දී සිටිති. එනිසාම යථාර්ථවාදී ලෙස නොහැකි නම් අද්භූතවාදී ක්‍රමයකින් හෝ මුදල් උපයාගැනීමට පෙළැඹීම අතිශය සාධාරණය. එමෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් දහතුන් දහස් පන්සිය අනූහතක් දැඩි ආහාර අනාරක්ෂිතභාවයෙන් පෙළෙන බවට අනුරාධපුර දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂවරයා අනාවරණය කොට ඇති පසුබිමකදී මෙවන් විස්මිත හාස්කම් ශාක වෙළඳපොළට ඒම අමරුමයක් නැත.

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

මොරටුමුල්ලේ රහටම කොත්තු දාන අක්කගෙයි නංගිගෙයි වලි කඩේ

'ගෑස් ලිපේ යකඩ තැටිය රත්වුණා බාස් ඇවිත් වැඩේ දෙන්න සෙට් වුණා ලුණු මිරිස් බිත්තර මස් කපාපු රොටි කෑලි ටකට ටකට රිදම් එකට ගාණට ඇදුනා...

ලට්ට පට්ට එකතු කරලා දවසේ ඉතුරු හරිය සද්ද බද්ද දලා හැදුව මේක කොත්තු රොටිය'

රාවතාවත්ත හන්දියෙන් මොරටුමුල්ල පාරට හැරෙද්දිම, මගේ මතකයට ආවේ මෑතකදී අප අතරින් වියෝ වූ නිහාල් නෙල්සන් මහතාගේ එම ගීතවත් හඬය. කොත්තු හදන සද්දයත්, පදමට දැනෙන කොත්තුවේ රසත් සමඟින් සද්දෙට නැටවෙන පිරිමි දෑතක් වෙනුවට, සුකොමල දෑතක් රස කොත්තුවක පදම ගනිමින් උන්නාය. ඒ 'අක්කගෙයි නංගිගෙයි කොත්තු කඩේ'ය. දැන් මේ කොත්තු කඩේ ගැන රටේ බොහෝදෙනා දන්නේය. ඒ මුහුණුපොත හරහායි. ඒ වාගේම ප්‍රදේශයේ බොහෝදෙනෙකු ඔවුන්ගේ 'රජරස' කේටරින්හි ආහාරපානවල රස බලා ඒ රසද හඳුනන්නෝය.

"ඇත්තටම අක්කගෙයි නංගිගෙයි කොත්තු කඩේ කිව්වට, දැන් නම් මේක අපි දෙන්නගෙ පුංචි වලි කඩේ වෙලා."

අක්කා අනුත්තරා හංසනී කීවේ නිමේෂා හර්ෂණී නැගනිය දෙස ආදරණීය බැල්මක් හෙලමිනි. අක්කා කොත්තුව සකසද්දී ඇයට ඕනෑ කරන අඩුම කුඩුම ටික ළංකර දෙන්නේ නංගි හර්ෂණීය. මේ දෙන්නාගෙන් සද්දෙට වගේම රසට කොත්තු හදන්නට පුළුවන් හංසනීටය. ඒ රස මාවත හංසනී සොයාගත්තේ, කඩේට එන කොත්තු බාස්ලා කිහිපදෙනෙකුම හිටිහැටියේ වැඩ මගහැර යාම සමඟිනි.

"අපි මේ කේටරින් සර්විස් එක මුලින්ම කළේ කහතුඩුවේ. එතකොට නංගිත් මමත් දෙන්නම කොත්තු දෑන එක, රයිස් දෑන එක එකදිගට කළේ නැහැ. ඒකට වෙනම බාස් කෙනෙක් හිටියා. ඒත් මෙහේ කඩේ දැම්මට පස්සේ ගත්ත කොත්තු බාස්ලා එනවා යනවා. සමහරු හොරකම් කරනවා. පිටි ටික අනලා දලා යනවා. සමහර වෙලාවට පිටි ටික එහෙම්මම අහක දාන්න වෙනවා. ඒ දේ හැමදම කරන්නත් බෑ. ඔය අතරේ මුස්ලිම් කොත්තු බාස් කෙනෙක් අපි ළඟ වැඩට ආවා. ඔහුගෙන් මම කොත්තු හදන හැටි ඉගෙනගත්තා. ඒ දැනුම උපයෝගී කරගෙන හදපු පළමු කොත්තුව බොහෝම රසට තිබුණා කියලා ඒ ගත් පාරිභෝගිකයා කිව්වා. ඒ ප්‍රතිචාරය වගේ හොඳ ප්‍රතිචාර අපට අද දක්වාම නොඅඩුව ලැබෙනවා. ඇත්තටම අපි කොත්තු, රයිස් දද්දි, ඒ දකින සමහර අය අපේ අම්මටත් ස්තුති කරනවා. අනේ මෙහෙම දුවලා දෙන්නෙක් ඉන්නෙක මොනතරම් දෙයක්ද කියලා බොහොම සතුටින් ඒ අය අපි ගැන කතා කරනවා." හංසනී කීවාය. දරුවන්ගේ දියුණුව ආදරණීය මවකගේ අපේක්ෂාවය. විටෙක ඔවුනට මගපෙන්වන්නීද ඇයයි. හංසනී සිය මව ප්‍රියංගිකා දමයන්ති දෙස බැලුවේ ඒ ගැන ලොකු කතාවක් කියන්නටය. වඩු කාර්මිකයෙකු ලෙස රැකියාව කරන පියා කරන්නේ ලී බඩු වෙළඳාමය.

"මම මුලදි හිතන් හිටියේ මම මොඩ්ලින්වලටත් කැමති නිසා සැලොන් එකක් දාගන්න. මම ආසියානු ලංකා හෝටල් පාසලෙන් පේස්ට්‍රි ඇන්ඩ් බේකරි පාඨමාලාවකුත් හැදෑරුවා. පරිගණක පාඨමාලා කළා. ඔය අතරේ අම්මා තමයි කිව්වේ අපි කෑම කඩයක් දමු කියලා. අම්මට රසට උයන්නත් පුළුවන් නිසා ඒ වැඩේ හරියට කරන්න පුළුවන් කියලත් ඇය කිව්වා. ඒකට මුදලුත් අවශ්‍යයි. මම ඒ වෙනකොට සුපිරි වෙළඳසැලක මුදල් අයකැමිවරියක් විදියටත්, පෞද්ගලික ආයතනයක කාර්යාල සේවයේත් රැකියා දෙකක් කරලා මුදල් ටිකක් ඉතිරි කරගෙනයි හිටියේ. ඉතින් අපි අන්තිමට හෝටලයක් දන්න තීරණය කළා. ඒ මීට අවුරුදු තුනකට කලින්. ඒ අනුව අම්මා බොහොම රසට කෑම හදලා පාරිභෝගිකයන්ට ලබාදුන්නා වගේම අපිටත් ඒ රසටම කෑම හදන්න පුළුවන්කම දැන් තියෙනවා. කොත්තු හදන චික දවස් දෙකක් ඇතුළත වගේ මම හරියටම ඉගෙනගත්තා. ඒ විතරක් නෙවෙයි නංගිටත් කොත්තු හදන්න ඉගැන්නුවා."

මේ අක්කා නගෝ යාළුවන් මෙනි. විටෙක ඔවුන්ගේ සොඳුරු නොක්කාඩුකම්ය. අක්කටත් වඩා හොඳින් නංගිට ෆ්‍රයිඩ් රයිස් වර්ග සාදන්නට හැකිය. ඒ ගැන කතා කරද්දි නම් කොත්තු කඩේ ඇතුළේ පුංචි පුංචි වලිය.

"ඉස්සර නම් නංගි ටිකක් කම්මැලියි වැඩ කරන්න. හැබැයි එයාගේ හීනය වුණේ සූපවේදිනියක් වෙන එක. පොඩි කාලේ ලොකු වුණාම කවුද වෙන්නේ කියලා ඇහුවමත් නංගි කියන්නේ චෙෆ් කෙනෙක් වෙනවා කියලයි. දැන් නම් නංගිත්, මමත්, අම්මත් හරි හරියට කඩේ වැඩ කරනවා. මොකද වෙනත් සේවකයෝ නැති නිසා. ඒත් දෙනිකව අපට පාරිභෝගිකයෝ ගොඩක් ඉන්නවා. පසුගිය ගෑස් අර්බුදය තිබුණු කාලෙවත්, අපි අපේ පාරිභෝගිකයන් අමතක කළේ නෑ. දර ලිපේ උයලා අපි ඔවුන්ට කෑම දුන්නා. ඒ විතරක් නෙවෙයි දර දෑන කොත්තු ලිපකුත් අලුතින් හැදුවා. මොකද මොන අර්බුදය ආවත්, අපිට ආපහු හැරෙන්න බැහැ. එහෙම වුණොත් බිස්නස් එක කඩා වැටෙනවා. වැඩ කරනකොට හිතේ තියෙන දුක් කරදරත් අමතක වෙනවා. "

හංසනී ආදරයෙන් ලැබූ පරාජය ගැනද කීවාය. ඒ පරාජය ගැන සිත සිතා දුක් වන්නට කඩේ වැඩ කන්දරාව ඇයට ඉඩ තැබුවේ නැත. අවංක නැති සිතක් අභිමුව හඬා වැළපෙනවාට වඩා ඉන් තමන්ම දුරස්ව යෑම හොඳ යැයි ඇය විසි තීරණය කළාය. ඒ තීරණයත් සමඟ ඇය කළේ වැඩිපුර වැඩ කිරීමය.

"මට මුලදි හිත හදගන්න බැරිවුණා. මං මගේ දිග කොණ්ඩෙත් කපලා දැම්මා. ඒත් ඊළඟට මට හිතුණා මම මගේ ජීවිතයෙන් පළිගන්නවා වෙනුවට ඒ ජීවිතය ජයගන්න."

හංසනීගේ අරමුණ කවදා හෝ තමාගේම ව්‍යාපාරික ස්ථානයක් ඉදිකරගෙන වඩාත් සිත්ගන්නා ලෙස මෙම ව්‍යාපාරය ඉදිරියටත් කරගෙන යාමය. නැහැයි, බැහැයි කියන්නට නොව, අමාරු පරිසරයක වුව උත්සාහයෙන් කැපවීමෙන් ජීවිතය දිනන්නට මේ අක්කා නගාලට ඇති අරමුණ තවත් ඕනෑම අයෙකු දිරිගන්වන සුළුය.

"මම දැන් හිතන්නේ අක්කා චක්ක මේ බිස්නස් එක දියුණු කරන්න. ඒත් ළඟදිම මම සූපශාස්ත්‍ර පාඨමාලාවක් හදාරන්න යනවා. ඊටපස්සේ, සූපවේදිනියක් විදියට ලොකු හෝටලයක වැඩ කරන්න බලාපොරොත්තුවකුත් තියෙනවා."

කොත්තු බාස්ලා පොලු තිබ්බ නිසාම රසට කොත්තු හදන්න ඉගෙනගත්තා

හංසනී හර්ෂනී

ගෑස් නැති කාලේ දර ලිපේ කොත්තු හැදුවා

ඒ හංසනීගේ නැගනිය හර්ෂනීගේ හඬයි.

මේ අතර දහවල් කෑමට තරමක් ප්‍රමාදව ආ කසුන්, සැලොන් එකක් පවත්වාගෙන යන තරුණයෙකි. කඩ කිහිපයක් පසු කරගෙන මෙහි එන්නේ, රසට වාගේම පිරිසිදුවටද කෑම ටික ලැබෙනා බැවින් යැයි ඔහු කීවේය. ඔහු මහත් අභිරුචියෙන් කෑම කන්නටද වූවේය.

"ඇත්තටම අපට පාරිභෝගිකයන්ගෙන් එන චෝදනා හරිම අඩුයි. මත්පැන් බීලා ආපු කෙනෙක් ප්‍රශ්නයක් දැම්මොත් හැරෙන්න අනෙක් එන හැමදෙනාම වගේ නංගිටයි, මටයි බොහොම ආදරෙන්, ගෞරවයෙන් සලකනවා. කෙල්ලෝ කියලා නෑ. මෙහෙම කෙල්ලෝ කොච්චර වටිනවද කියලා අම්මට කියලා යන අයත් ඉන්නවා. මං කියන්නේ රස්සා නෑ, ආදයම් නෑ කියලා දුක්වෙන්න එපා උත්සාහ කළොත්, ඕනම අභියෝගයක් අපට ජයගන්න පුළුවන්. මමම කොත්තු පිටි චික හදගන්නවා වගේම, බිත්තර රොටී, එළවලු රොටී, කොටින්ම කිව්වොත් රොටී බාස්ගේ ඔක්කොම වැඩ ටික මමම කරනවා."

හංසනී කතා කරන්නේ ඉදිරිය ගැන බලාපොරොත්තු සමඟිනි. ඒ අම්මාට තාත්තාට ඒ දූවරුන් ගැන සතුටුය. විසිහතර හැවිරිදි හංසනීගේ දෑතේ කරගැටය. කොත්තු වැඩිපුර හැදූ දැට උරහිස් රිදුම් දෙන බවද ඇය කියන්නීය.

එහෙත් ඒ සියල්ල දරාගනිමින් ඒවාට මුහුණදෙමින් මේ අක්කා නගෝ යන ගමන නම් බොහෝ ලස්සනය.

■ දීපා වසන්ති එදිරිසිංහ

හංසනී

කජු සංස්ථාව ලාභ ලබන ආයතනයක් කරන එක කජු කනවා තරම් ලේසි වැඩක් වුණේ නෑ

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සංස්ථාවේ සභාපතිනි
නීතීඥ සාරංගා රත්නායක

‘එක්කෝ ඔබට එය සිදුවනතුරු බලාසිටීමට හැකිය. නැතිනම් එය සිදුකිරීම සඳහා කොටස්කරුවෙකු වීමට හැකිය.’ මේ කැනඩාවේ දක්ෂ ව්‍යවසායකයකු මෙන්ම නව නිපැයුම්කරුවකු වන ඊලොන් මස්ක් (Elon Musk) වරක් සිදුකළ ප්‍රකාශයකි. ඔහු ඉන් අදහස් කළේ තවකෙනෙකු අතින් යම් කාර්යයක් ඉටුවනතුරු බලාසිටිනවාද, නැත්නම් එම කාර්යය වඩාත් හොඳින් නිම කරන්නට තමාගේ දායකත්වය ලබාදෙනවාද යන්න තීරණය කළ යුත්තේ තමන් බවයි.

එලෙස බලා නොසිට තමාගේ වගකීම් කොටස නිසිලෙස ඉටුකරමින් සාර්ථකත්වයට පත්වුණු තැනැත්තියකගෙන් මෙවර ‘ධරණී’ කවරය සරසන්නට අපි සිතුවෙමු. ඇය ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සභාපතිනි නීතීඥ සාරංගා රත්නායක මහත්මියයි.

"ලැබෙන අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන අපි වැඩ කරන්න ඕන. සැලසුම් සහගතව ඉදිරි ඉලක්ක දිහා බලන්න ඕන. කොළඹ ඔෆිස් කාමරේට වෙලා ඉඳගෙන විතරක් ඒ කාර්යය කරන්න බැහැ. මම ශ්‍රී ලංකා කජු සංස්ථාවට ඇවිත් මේ ගෙවෙන්නේ තුන්වැනි අවුරුද්ද. මේ වෙද්දි සංස්ථාවට අයත් සෑම කජු වත්තකම හතර මායිම් මම දන්නවා. සමහර වතුවලට මම දහ වතාවකට වඩා ගිහින් තියෙනවා. ඒ වතුවලට අදාළ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙද්දී කරන්න ඕන දේ, ගන්න ඕන තීරණය මොකක්ද කියලා ඒ නිසා කොළඹ හිටියත් මම දන්නවා."

කජු සංස්ථාවට අයත් සෑම කජු වත්තකම හතර මායිම මම දන්නවා

2023 වසරට ශ්‍රී ලංකා කජු සංස්ථාව පිහිටුවා වසර පනහකි. එදා මෙදා තුර එම සංස්ථා ඉතිහාසයේ සභාපති පුටුවට පත්වූ පළමු සභාපතිනිය වන්නේ ඇයයි.

“මම ඉපදුණේ හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් තිස්සමහාරාම කියන ගමේ. අම්මා රෙජිස්ට්‍රාර්වරියක්. තාත්තා කෘෂි උපදේශකවරයෙක්. අයියයි, නංගියි එක්ක අපේ පවුලේ පස්දෙනෙයි. අපේ ළමා කාලය බොහෝම ලස්සනයි. ගහකොළ එක්ක, ගමේ පරිසරය එක්ක යා වෙලයි එම කාලය ගෙවුණේ. තාත්තා කෘෂි උපදේශකවරයෙක් නිසා ඒ ආශ්‍රිතව මගේ දැනුමත් හොඳ මට්ටමක තිබුණා. මම පාසල් අධ්‍යාපනයෙන් පස්සේ, ලන්ඩන් එල්.එල්.බී. විභාගේ කළා. එහෙම විදේශ උපාධිය අරන් ලංකාවේ නීති විද්‍යාලයට ඇතුළත් වෙලා නීතිවේදී උපාධියක් ලබාගත්තා. නීතීඥවරියක් විදියට වසර අටක් විතර මම සේවය කළා.”

ඇය ජනාධිපති ලේකම් කාර්යාල නීති අංශයේ පත්වීමක් ලබන්නේ 2015 වසරේදීය. එසේ රාජකාරි කරගෙන යන අතරතුර තරුණයන්ට සංස්ථා මණ්ඩලවල තනතුරු දෙමින්, රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීමේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ වැඩපිළිවෙල යටතේ ඇයටද අවස්ථාවක් හිමිවුණි.

“මම කජු සංස්ථාවේ සභාපති තනතුරට පත්වෙද්දි සංස්ථාව තිබුණේ පාඩු ලබන තැනක. ඊළඟට පිටරටින් කජු ගෙන්වන තත්ත්වය හමුවේ කජු වගාවෙන් ගොවීන් ඈත්වෙමින් හිටියා. ඔවුන් වෙනත් භෝග වගාවන්ට යොමු වුණා. සමහර උදවිය කජු ගස් කපලා දරුවලට අරගෙන තිබුණා. මේ අතරේ කොරෝනා උවදුර ඇවිත් රටේ ආර්ථිකය තවත් අඩපණ කරන්න පටන්ගත්තා. ඒ කොහොම වුණත් මේ කර්මාන්තය වැටෙන්න නොදී ආරක්ෂා කරගැනීමේ වගකීම මම ඇතුළුව අපේ සංස්ථාවේ හැමදෙනාටම තිබුණා. නියෝජ්‍ය සභාපතිනිය, අධ්‍යක්ෂ මණ්ඩලය වගේම කාර්ය මණ්ඩලයේ හැමකෙනාටම ඊට උනන්දුවක් තිබුණා. ඉතින් මට තිබුණේ ඒ අයත් එක්ක කතාබහ කරලා අවශ්‍ය තීන්දු තීරණ අරගෙන වැඩ කරගෙන යන්නයි. පරිපාලන ක්ෂේත්‍රයේ වැඩ කරලා ලබපු අත්දැකීම් වගේම, කෘෂි කර්මාන්තය ගැනත් මම දැනගෙන හිටියා.”

ඒ දැනුම තවත් වැඩි කරගැනීමට ඇයට ඕනෑ විනි. කජු කර්මාන්තයෙන් යැපෙන පවුල් මුණගැසී ඒ අදහස්ද සලකමින්, විවිධ ප්‍රවර්ධන වැඩසටහන් කරන්නටද ඕ කටයුතු කළාය. අලුතින් කජු වගා කරන්නටත් ඒ ගැන උනන්දුවක් පවතින අයගේ උනන්දුව වැඩි කරන්නටත් ප්‍රාදේශීය කාර්යාල හරහා විවිධ වැඩසටහන් හඳුන්වාදීම සිදුවිය.

“සමහර අය අවුරුදු හය හතක් බලාගෙන ඉන්නවා කජු ගහකින් පලදාව ගන්න. එහෙම නොවී හොඳ ප්‍රභේද හඳුන්වා දුන්නොත් ඒ ලැබෙන ප්‍රතිඵලය මේ කර්මාන්තයට වැදගත් කියන කාරණය අපි සලකා බැලුවා. ඒ අනුව වයඹ විශ්වවිද්‍යාලයයි, කජු සංස්ථාවයි එක්වෙලා අධ්‍යයන කරලා අවුරුදු තුනකදී පලදාව ලබාගන්න පුළුවන් ප්‍රභේද හඳුන්වා දුන්නා. ඒ වගේම අපි මේ වෙනකොට අලුතින් කජු අක්කර දහතරදහක් විතර වගා කරලා තියෙනවා. තව අවුරුදු දෙකකින් වගේ ඒවායේ අස්වනු ලබාගන්න පුළුවන්. එතකොට අපට අපේම කජුවලින් රට ස්වයංපෝෂිත කරන්න පුළුවන්කම ලැබෙනවා. දැනට පවතින කජු මිල ගණනුත් යම් තරමකට අඩුවේවි. දැනටත් වෙනත් වෙළඳසැල් ආශ්‍රිතව ගනිද්දි සංස්ථා කජු මිල අඩුයි. අපි මේ විදියට බලාපොරොත්තු වෙන ඉලක්ක ජයගන්න අලුතින් කජු අක්කර තිස් පන්දහසක් පමණ වගා කිරීමටත් සැලසුම් කර තිබෙනවා.”

එසේ අලුතින් කජු වගා කරනවා සේම එම කජුවතු අද දක්වා ඇති තත්ත්වයට දියුණු කරන්නට පියවර කිහිපයක් ගැනිණි.

"ඇත්තටම මන්නාරම, කොණ්ඩච්චි කියන වත්ත තමයි සංස්ථාවේ හදවත හා සමාන වත්ත හැටියට සලකන්න පුළුවන්. එල්.ටී.ටී.ඊ. කාලේ ඔවුන් මේ වත්ත අල්ලගත්තා. ඊට කලින් එහි සේවකයෝ දෙදහසක් පමණ සේවය කළා. ඒ කාලේ ටොන් 200ක විතර කජු අස්වැන්නක් ලැබුණත්, යුද්දේ කාලේ ඒ සියල්ල විනාශ වුණා. කොහොමහරි දකුණු ආසියාවේ හොඳම පාර්ශ්වික පස තියෙන වත්ත විදියටත් සැලකුණේ අක්කර හයදහකින් යුත් මෙම වත්තයි. යුද්දේ නිමාවුණාට පසුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් එහි අක්කර එක්දහස් පන්සියයක් පමණ අලුතින් වගා

කරලා තිබුණා. මම පත්වුණාට පස්සේ අවශ්‍ය විදුලිය ඇතුළු පහසුකම් නංවන්න මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරගැනීම කළ යුතුව තිබුණා. වැවිලි කර්මාන්ත අමාත්‍ය රමේෂ් පතිරණ මහතා, උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධන ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාව කටයුතු කළ ජානක වක්කුඹුර මහතා ඒ අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර දුන්නා. ඒ අනුව අපිට තව අක්කර දහසක් පමණ අලුතින් වගා කරන්න අවස්ථාව ලැබුණා. මේ වගාවන් කරද්දී කජු පැළ දෙකක් අතර පරතරය අඩි විස්සක් පමණ තියෙන නිසා අතුරු භෝග වගාවකත් නියැලුණා. එහිදී එළවලු වගා කරලා අමතර ආදායමක් ලබන්න අවස්ථාව ලැබුණා."

එම ආදායම් වැඩිකර ගන්නට පියවර ගන්නවා සේම, එහිදී ගම්වාසීන්ටද නව රැකියා අවස්ථා ලැබිණි.

මේ අතර කිළිනොච්චි දිස්ත්‍රික්කයට අයත් වෙල්ලකුලම් කජුවත්තද එල්. ටී.ටී.ඊ. කාලයේ විනාශව ගොස් තිබූ එකකි. කොණ්ඩච්චි වත්තට මෙන් නොව මීට සංස්ථා නිලධාරීන්ට ඇතුළුවීමටද ගම්මුන්ගෙන් බාධා ඇතිවී තිබුණි. ඒ එම ඉඩම් ගම්මුන් අතර බෙදුදෙන බවට කවුරුන් හෝ ඇතිකළ වැරදි වැටහීමක් හේතුවෙනි. මෙම පසුබිම තුළ ජානක වක්කුඹුර අමාත්‍යවරයාත්, ගම්මුනුත් අතර සුහද හමුවක් ඇති කරමින් සාකච්ඡාමය විසඳුමක් සොයාගන්නට ඇය සමත් වූවාය.

පාඩු ලබමින් තිබුණු අවස්ථාවක සංස්ථාව භාරගැනීමට සිදුවුවත්, වසර නවයකට පසු රුපියල් පන්දහසක දිරි දීමනාවක් සේවකයන් වෙත ලබාදෙන්නටද ඇය සමත් වූවාය. පැය අටක් නොව පැය විසිහතරම දුරකතනය සක්‍රියව තබා ගනිමින්

2025 වෙද්දි පුංචිම මනුස්සයටත් කජු කන්න පුළුවන් වටපිටාවක් හදනවා

ඕනෑම ගැටලුකට විසඳුම් දීමට ඇය කාලය වෙන්කරගෙන තිබීම විශේෂයකි.

"මම එනකොට අපට තිබුණේ කජු අලෙවිසැල් දෙකයි. එය දැන් නවයක් දක්වා වැඩිවෙලා තියෙනවා. 2025 වෙද්දි අපිට ඉල්ලුමට සරිලන කජු සැපයුමක් ලබාදෙන්න වගේම පුංචිම මනුස්සයටත් කජු කන්න පුළුවන් වටපිටාවක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. කජු පුහුලම්වලින් වයින් සෑදීමේ ව්‍යාපෘතිය 2015 සිට නතරවෙලා තිබුණේ. දැන් එයත් ක්‍රියාවට නැංවෙමින් තියෙනවා. මාර්තු මාසේ වෙනකොට කජු අස්වැන්න ලැබෙනවා. එතකොට කජු පුහුලන් විශාල ප්‍රමාණයකුත් ලැබෙනවා. ඒ අනුව වයින් නිෂ්පාදනයත් අත්හදබැලීම් සමඟ යළි සිදුවෙනවා. ඒ වගේම ලංකාව පුරා තව අක්කර 35,000ක් විතර අලුතින් වගා කළොත් අපේ ඉලක්කයට යෑම අසීරු නැහැ."

ඇය කියන්නේ එම ඉලක්ක සපුරාගැනීම දුෂ්කර නැති බවය. ඊට ඇය සතුව ශක්තිමත් කණ්ඩායමක් සිටින බවත්, ඔවුන්ගේ සහයෝගය කැපවීම වැදගත් වන බවත් ඇය කියන්නීය. පසුගිය කාලයේ සංස්ථා කජු අලෙවිය සියයට එකසිය පනහකින් පමණ වැඩිවී ඇති බවද ඇය කියන්නීය.

"මම ආවේ වැඩ කරන්න නිසා මම ඒ කාර්යය කරනවා. කජු කර්මාන්තය හා එක්ව වැඩිපුරම ඉන්නේ කාන්තාවෝ. අද එයාලගෙත් බලාපොරොත්තු ඉහළ නැංවිලා තියෙනවා."

ඇය කජු සංස්ථාවේ සභාපතිනිය වී වසර තුනකි. එහෙත් ඇයට කජු ගැන ඇති දැනුම නිසාම ඇයගේ උපාධිය කජු සම්බන්ධ එකක්දැයි අසන්නන් හිඳී. ලංකාවේ කුඩාම කජුවතුවල වාගේම ලොකුම කජුවතුවලත් අලගිය මුලගිය තැන් දන්නා ඇය ඒ ගැන නොදන්නා දේ උගනින්නටද, ඒ උගනින දෙය නිර්මාණශීලීව කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් යොදාගන්නටද දක්ෂය. රාජකාරී ජීවිතයත් පෞද්ගලික ජීවිතයත් සමබරව පවත්වාගෙන යන ඇය අනිමුව ඇති ඉලක්ක කජු කනවා තරම් ලේසි නොවූවත්, ඒ අසීරුතා ජයගන්නට ඇය ශක්තිමත් බව නම් කිව හැකිය. ඒ සඳහා 'ධරණී' අපද ඇයට ශුභාශිංසන එක් කරන්නෙමු.

■ **දීපා වසන්ති එදිරිසිංහ**
ඡායාරූප - සමන් අබේසිරිවර්ධන

ගල්යුගයේ මිනිස්සුත් අව්කණ්ණාඩි දැම්මෙ පොෂ් වෙන්නද?

මැලේසියාව, අප්‍රිකාව, මාලදිවයින, පිලිපීනය, මැදපෙරදිග රටවල් වගේ රටවල්වලට බොහොම තදට හිරුඑළිය වැටෙනවා. ඉතින් මේ රටවල ගොඩක් උදවිය අව්වෙන් ඇස් බේරගන්න හිතාගෙන සන්ග්ලාසස් දානවා. හැමෝම වගේ සන්ග්ලාසස් දැන නිසා ඒක ඒ අයට අරුමයක් නෙමෙයි. ඉතින් එයාලා සන්ග්ලාස් දැන අය දිහා ඇස් වපර කරලා අමුතුවට බලන්නේ නෑ. "අර බලපන්කෝ අරකිගේ ෂෝ එක" කියලා අව්කණ්ණාඩි දෑපු අයට කෝචෝක් කරන්නේත් නැහැ. උඩ ඉඳලා යටට යනකල් බලලා කින්ඩියට වගේ හිනාවෙන්නෙත් නැහැ.

අපේ රටත් සමකාසන්න රටක්. ඉතින් අපිටත් බොහොම තදින් හිරුඑළිය වැටෙනවා. හැබැයි මෙහෙ හැමෝම සන්ග්ලාසස් දන්නේ නැහැ. යාන්තමට හරි කණ්ණාඩි කුට්ටමක් දන්නේ කාර්වල, මෝටර් සයිකල්වල යන අය විතරයි. ඇයි සාමාන්‍ය අයට අව්කණ්ණාඩි තහනම්ද?

කාලෙකට කලින් වුණු සිද්ධියක් මතක් වුණා. සන්ග්ලාසස් දෙකක් දගත්තු ලස්සන ගෑනු ළමයෙක් මම හිටපු බස් හෝල්ට් එකේම හිටගෙන හිටියා. එතැන හිටපු වැඩිමහල් කාන්තාවෝ කීපදෙනෙක් අර කාන්තාව ගැන කුටු කුටු ගගා මොනවදෝ කියවන්න ගත්තා. "බොරුවට කණ්ණාඩි දෙකකුත් දගෙන අන්ධයෙක් වගේ" ඔය කතාව මට වගේම අර ගෑනු ළමයටත් ඇහුණා. ඉතින් අව්කණ්ණාඩි දෙක ශේප් එකේ ගලෝලා බෑග් එකට ඔබාගත්තු එකයි ඇය කළේ.

අපි ඉන්නේ රස්නේ රටක. ඒ නිසා ගිනිගහන අව්වේ පාරට බැස්සහම ඇස්වලටයි, ඇස් වටේ සමටයි ලොකු හානියක් වෙනවා. ඉතින් ඇස් දෙකයි ලස්සනයි දෙකම රැකගන්න ඕනේ නම් අව්කණ්ණාඩි දැන්නම ඕනේ. අර කියාපු ගෑනු ළමයා වගේ අනිත් උන්දැලා කියන එව්වගෙන් හිත ගස්සගන්නේ නැති කෙනෙක් නම් විතරක් මේ ලිපිය කියවලා හෙට ඉඳලම සන්ග්ලාසස් දැන්න පටන්ගන්න.

මිනිස්සු අව්කණ්ණාඩි පාවිච්චි කරන්න පටන්ගත්තේ ගල්යුගයේ ඉඳලා. හැබැයි සන්ග්ලාසස් කියන්නේ නවීන ලෝකේ නාඩගමක් කියලා හිතන ඈයෝ ඒ බවක් දන්නේ නැහැ. ඇමරිකාවේ හිටපු එස්කිමෝවරු තමයි මුලින්ම අව්කණ්ණාඩි පාවිච්චි කරලා තියෙන්නේ. සත්ව කටුවලින් ෆ්‍රේම් එක හදපු මේ කණ්ණාඩි මැදට සීල් දත්වලින් හදපු කණ්ණාඩියක් පවා ඔබ්බවලා තියෙනවලු.

ගමේගොඩේ, පාරෙතොටේ, බස් හෝල්ට් එකේ අව්කණ්ණාඩි දාගෙන ඉන්න මිනිස්සු දිහා බලලා කුටු කුටු ගාන්න, ඇනුම්පද කියන්න එපා. ඉස්කෝලේ යන කාලෙ ඉඳලා දරුවන්ටත් අව්කණ්ණාඩි පුරුදු කරන්න

ඒ වගේම ක්‍රි.ව. 37-68 කාලේ රෝමය පාලනය කරපු නීරෝ කොලෝසියමේ ග්ලැඩියේටර සටන් නරඹන්න එමරල්ඩ් ගල්පතුරුවලින් හදපු සන්ග්ලාසස් පාවිච්චි කළාලු. එතකොට අද අපි පාවිච්චි කරන අව්කණ්ණාඩි හදලා තියෙන්නේ ඇමරිකාවේ සෑම් ෆෝස්ටර් 1919දී. පස්සේ මෙව්වා බොහොම ඉක්මනින් මිනිස්සු අතරට ගිහින්. මර්ලින් මොන්රෝ, ජැක් නිකලොස්, ජැකී කෙනෙඩි වගේ නිළියෝ අව්කණ්ණාඩි පාවිච්චි කරන්න ගත්තු නිසා මේක තරුණියන් අතරත් ජනප්‍රිය විලාසිතාවක් වුණාලු. සන්ග්ලාසස් දැම්මහම හොඳ පෙනුමක් ලැබෙනවා තමයි. හැබැයි ඊටත් වඩා ඇස් දෙකයි සැබෑ පෙනුමයි ආරක්ෂා කරගන්න අව්කණ්ණාඩි අපිට උදව් කරනවා.

හිරුකිරණේ පාරජම්බුල කිරණ (UV) කියලා අපේ ශරීරයට අහිතකර කිරණයක් තියෙනවා. රටකට වැටෙන හිරුඑළියේ ත්‍රීව්‍රතාවය එක්ක UV කිරණ මනින දර්ශකයක් තියෙනවා. අපේ රටේ UV ප්‍රමාණය තියෙන්නේ 8-12ත් අතර. ඒකේ තේරුම අපිට මේ කිරණය ඉතා වැඩි වශයෙන් වැටෙනවා කියන එක. ඉතින් පාරජම්බුල කිරණවලින් ආරක්ෂා වුණේ නැත්නම් ඇසේ සුදු, ග්ලූකෝමා, අන්ධබව වුණත් එන්න පුළුවන්. ඒ වගේම අක්ෂි පිළිකා ඇතිවෙන්නත් මේක හේතුවක්. අන්න ඒ නිසයි අපි අනිවාර්යයෙන්ම සන්ග්ලාසස් දැන්න ඕනේ. අව්වට ඇස් පිච්චිලා ඇස් වටේ කළුවෙන එක නතර කරන්නත්, දූවිලිවලින් ඇස් පරිස්සම් කරන්නත් අව්කණ්ණාඩිවලට පුළුවන්.

හැබැයි ඉතින් ගන්නන් වාලේ අව්කණ්ණාඩි ගත්තට වැඩක් නැහැ. සන්ග්ලාසස් ගන්නකොට බලන්න ඕන කාරණා කිහිපයක්ම තියෙනවා. හිරුඑළියේ UV-A, UV-B, UV-C කියලා පාරජම්බුල කිරණ කොටස් තුනක් තියෙනවා. මෙව්වගෙන් UV- A කියන කොටස පොළොවට වැටෙන්නත් කලියෙන් ඕසෝන් ස්ථරෙන් බ්ලොක් කරලා දානවා. හැබැයි අනිත් කොටස් දෙකම අපිට වැදෙනවා. ඉතින් කණ්ණාඩි ගන්නකොට මේ දෙක බ්ලොක් කරන්න පුළුවන්ද කියලා බලන්න ඕනේ. ප්‍රමිතිය ගැන හිතන්න.



හැබැයි අව්කණ්ණාඩි නොදැ හිටියත් බාල එව්වා නම් දන්න එපා. සාමාන්‍යයන් අපි හිරුඑළියේ යනකොට අපේ ඇහේ කණීනිකාව පොඩිවෙලා අක්ෂි කාචය ඇතුළට යන UV ප්‍රමාණය ස්වභාවිකවම අඩු කරනවා. හැබැයි බාල අව්කණ්ණාඩි දෙකක් දැම්මහම ඇස්වලට හිරුඑළිය වැටෙන්නේ නැති නිසා කණීනිකාව පොඩිවෙන්නේ නැහැ. එතකොට UV කිරණ කෙළින්ම ඇහැ ඇතුළට යනවා. ඒ කියන්නේ අව්වේ යනකොට වැටෙනවට වඩා වැඩි කිරණ ප්‍රමාණයක් ඇහැට වැටෙනවා.

සන්ග්ලාසස් ගන්නකොට මූණේ හැඩේ ගැනත් හිතන්න වෙනවා. නැත්නම් ඉතින් එළ හරකයි මී හරකයි වගේ කිසි ගැලපීමක් නැතිවෙන්න පුළුවන්. ඕවලාකාර, රවුම්, හදවත, දියමන්ති හැඩය, හතරැස්, ත්‍රිකෝණාකාර කියලා මුහුණු හැඩ කිහිපයක්ම තියෙනවා. මෙව්වගෙන් ඔයාගේ මුහුණේ හැඩේ මොකද්ද කියලා දන්නවනේ. ඒ ඒ හැඩවලට ගැලපෙන්න අව්කණ්ණාඩි හැඩ තෝරගන්න ඕනේ.

ඕවල් මුහුණ

එව්යේටර් කණ්නාඩි, කැට් අයි, සෘජුකෝණාස්‍ර කණ්ණාඩි, මුහුණට වඩා විශාල සන්ග්ලාසස්, සමනල හැඩයේ එව්වා තමයි වැඩිය හොඳ. මුහුණට වඩා විශාල රාමු තියෙනවා නම් ලස්සන වැඩි කරවනවා.

හදවත් හැඩය

එව්යේටර්, කැට් අයි, රවුම් කණ්ණාඩි, චතුරස්‍ර හැඩ හදවත් මුහුණු තියෙන අයට කැපෙනවා. හැබැයි කොයිම වෙලාවකවත් පුංචි ෆ්‍රේම් තියෙන අව්කණ්ණාඩි ගන්න එපා.

දියමන්ති හැඩය

මේ අයට ගැලපෙන්නේ පොඩි ෆ්‍රේම් තියෙන සන්ග්ලාසස්. එව්යේටර්, ඕවල් කණ්ණාඩි සහ රවුම් හැඩයේ එව්වා.

හතරැස් මුහුණ

එව්යේටර්, රවුම් හැඩය, සෘජුකෝණාස්‍ර, කැට් අයි, ඕවල් වගේ හැඩ තමයි හතරැස් මුහුණකට ගැලපෙන්නේ. ඒ වගේම රාමුවේ පළල මුහුණට සමාන එව්වා වගේම වර්ණ ෆ්‍රේම් සහිත එව්වා මේ අයගේ පෙනුම වැඩි කරවනවා.

ත්‍රිකෝණාකාර

සෘජුකෝණාස්‍ර, ඕවල්, ක්ලබ්මාස්ටර්ස්, එව්යේටර්.

රවුම් හැඩය

සෘජුකෝණාස්‍ර, හතරැස් හැඩය, එව්යේටර් තමයි රවුම් මුහුණක් තියෙන අයට ගැලපෙන්නේ.

ඒ වගේම හිරුඑළියේ ත්‍රීව්‍රතාවය එක්ක සන්ග්ලාසස්වල වීදුරුවේ පාට ගැනත් හිතන්න. නිතරම තද අව්වේ යන කෙනෙක් නම් දුඹුරු, අළු, කොළ වගේ පාට පාවිච්චි කරන්න. එතකොට සාමාන්‍ය අව්වකට නිරාවරණය වෙන කෙනෙක් නම් කහ, රත්තරං පාට, ඇම්බර්, රෝස වගේ

පාටක් තෝරගන්න. ඒ වගේම ඇහැ විතරක් වැහෙන ප්‍රමාණෙට නැතිව ඇහැ වටේම කවර් වෙන එකක් ගන්න. අව්කණ්ණාඩියේ රාමුවේ විලාසිතාව ගැනත් හිතන්න. ඒක දීර්ඝකාලයක් පවතින එකක්ද කියලා වගේම වැඩිය බර නැති සැහැල්ලු එකක්ද කියලත් බලන්න. පාට පාට ලොකු මෝස්තර තියෙන එව්වා විනෝද චාරිකාවකට, බීච් ගමනකට වගේ ඇරෙන්න සාමාන්‍ය භාවිතයට නම් ගැළපෙන්නේ නැහැ.

අව්කණ්නාඩි දෙකක් තෝරගන්න වගේම ඒක හරියට පාවිච්චි කරන්නත් දැනගන්න ඕනේ. තද හිරුඑළියකට විතරක් නෙමෙයි එළිය අඩු දවස්වලටත් අව්කණ්ණාඩි දැන්න. හැබැයි ගෘහස්ථ ස්ථානවලදියි, රෑටයි කණ්ණාඩි දැන්න යන්න එපා. විපක්ෂ නායක සජිත් ප්‍රේමදස මහත්තයා හවස්වරුවක සන්ග්ලාසස් දගෙන ක්‍රිකට් ගහන වීඩියෝවක් කාලයක් සමාජ මාධ්‍යවල උසුළු විසුළුවලට ලක්වුණා මතකයි. ඉතින් අව්කණ්ණාඩි දැන්න ඕනේ කොයිවෙලාවටද නොදැන්න ඕනේ කොයිවෙලාවටද කියන එක තෝරබේරගන්න තරම් බුද්ධිමත් වෙන එක තමන්ගේ වැඩක්. අනික කළුවරේ අව්කණ්ණාඩි දැන එකෙන් අපේ ඇස්වලටත් හානිවෙනවා.

ඉස්සර දැන් වගේ ෆෝන් තිබුණේ නැහැනේ. ඉතින් පත්තරවල 'මිතුරු හවුල' වගේ එව්වට ලියලලු යාළු මිතුරියෝ හොයාගන්නේ. ඒකට අදාළ පුද්ගලයගේ මුද්දරේක තරම් ෆොටෝ කැල්ලකුත් පළ කරනවලු. ඉතින් සමහර අය ඒ කාලේ තිබුණු බෝතල් මූඩි තරම් ලොකු සන්ග්ලාසස් එහෙම දලා ගත්තු ෆොටෝස් පත්තරේට එවනවලු. ඇස් දෙක පේන්නේ නැති නිසා එහෙම ෆොටෝ එවන අයට කවදවත් මිතුරු ලිපි එන්නේ නැහැයිලු. ඇස් කියන්නේ මනුස්සයෙක්ගේ අනන්‍යතාව පෙන්නුම් කරන ප්‍රධානම දෙයක්. ඒ නිසා අනන්‍යතාව පෙන්නන්න ඕන වෙලාවට අව්කණ්ණාඩි ගලවන්න. ඒ වගේම දන්න කියන කෙනෙක් එක්ක කතා කරද්දිත් පුළුවන් නම් අව්කණ්ණාඩි ගලවන්න. ඒතකොට දෙන්නා අතර හොඳ සංවාදයක් හදගන්න පහසුයි.

සමහරු සන්ග්ලාසස් ගන්නේ ඔලුවෙයි, ඇඳුමෙයි, බෙල්ල පිටිපස්සෙයි රඳවගෙන ඉන්න. හදිසි වෙලාවකදි ඒ වැඩේ කළාට කමක් නැහැ. හැබැයි සන්ග්ලාසස් දන්නේ ෆැෂන් එකට කියලා හිතලා එව්වා ඔලුවෙයි, බෙල්ලෙයි, ඇඳුම අස්සෙයි දගෙන ඉන්නවා නම් ඒක මහ මෝඩ වැඩක්.

ඒ වගේම ගෙදර අම්මා තාත්තා විතරක් නෙමෙයි පොඩි අයටත් අව්කණ්ණාඩි පාවිච්චිය හුරු කරන්න. පොඩි කාලේ ඉඳලම අව්කණ්ණාඩි දැම්මහම හතලිහ පැන්න හැටියේ හතලිස් ඇඳිරිය වගේ අක්ෂි ගැටලු ඇතිවෙන්නේ නැතිලු. පාසල් යන ළමයින්ට ක්‍රීඩා පිටිවලදි අව්කණ්ණාඩි අනිවාර්යය කරලා ඔස්ට්‍රේලියාව මේ ළඟදි අලුත් නීතියකුත් ගෙනවා.

තමන්ට ගැලපෙන අව්කණ්ණාඩි තෝරගන්න බැරි නම් අක්ෂි වෛද්‍යවරයෙක්ගෙන් උපදෙස් ගන්න. ඒ වගේම භාවිතා නොකරන වෙලාවට ඒක ආරක්ෂිතව අව්කණ්ණාඩි පෙට්ටියකින් අරන් තියන්න. ආයේ පාවිච්චි කරන්න කලින් මයික්‍රොෆයිබර් රෙදිවලින් පිහදන්න. සන්ග්ලාසස් දෙකක් අවුරුදු දෙකක් දැන්න කියලයි වෛද්‍යවරු නිර්දේශ කරන්නේ. හැබැයි නිතරම හිරුඑළියට නිරාවරණය වෙනවා නම් ඊට කලින් සන්ග්ලාසස් මාරු කරන්න වෙනවා. ඒ වගේම පොතු ගැලවිච්චි, ඇදවුණු, පැල්ලම් තියෙන කණ්ණාඩි පාවිච්චි කරන්නත් එපා.

මිනිස්සු සන්ග්ලාසස් දන්නේ පොෂ් වෙන්න නෙමෙයි කියලා දැන් තේරෙනවනේ. ඒ නිසා මේ අවුරුද්දේවත් සමාපේ දිහා බලපු ඒ පරණ කණ්ණාඩි කුට්ටම ගලවලා අව්කණ්ණාඩිවලට මාරුවෙමු.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ස්වයං රැකියා

පාඩම් අංක 51

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදිම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා
පාඨමාලා උපදේශිකා

ගෙදර කක්කුස්සියත් නෑ කියලා නෝනා මහත්තයාව දාලා ගිහිල්ලා

ඒවා ඇති අයට පිරිසිදුකාරක හදලා විකුණමු

බොහොම ඉස්සර අපේ රටේ ගෙවල්වල වැසිකිළි තිබිලා නැහැ. ළඟපාත තියෙන කැලෑ රොදකට වැදිලයි ඒ උදවිය ඔය කර්තව්‍යය කරලා තියෙන්නේ. ඔය විදියට මිනිස් මළපහ පරිසරයට එකතු වුණහම එව්වගෙන් කොකුපණු බීජාණු වගේම විවිධ තාලේ විෂබීජත් පරිසරයට එක්කාසු වෙනවා. එතකොට ආහාරයි ජලයයි හරහා එව්වා ශරීරගත වෙලා මිනිස්සුන්ට එක එක ජාතියේ ලෙඩ හැදෙනවා. එක්දස් නවසිය විසිගණන්වලදි කොකුපණු රෝගය නිසා ගොඩක් උදවිය ලෙඩවෙලා. ඒ වගේම සැලකිය යුතු ප්‍රමාණයක් මැරිලත් තියෙනවා. ඉතින් ඔය කාලේ ලංකාව පාලනය කරපු යටත්විජිත ආණ්ඩුව මේ වසංගතේට කෙටිකාලීන පිළියමක් විදියට රෝගීන්ට ප්‍රතිකාර කරලා දිගුකාලීන විසඳුමක් විදියට හැම ගෙදරකම වැසිකිළියක් හැදීම අනිවාර්යය කළාලු.

අලුත් නීතියෙන් පස්සේ අතලොස්සක් පිරිස කැමැත්තෙන්ම වැසිකිළි හදලා. හැබැයි ග්‍රාමීය පරිසරයවල ජීවත්වෙච්චි බහුතරයක් උදවිය මේ නීතිය දැක්කේ ලොකු අවමානයක් විදියටලු.

"මේච්චරකල් නොතිබුණු කක්කුසියක් මොකද මේ එක පාරටම ඕනෑ වුණේ? ගෙයක් ඇතුළේ ඉඳගෙන ඔය වැඩේ කළ හැකිද? ෂික් විතරක් ගඳ ගහන්නෙ නැද්ද?"

මේක ජ්‍යේෂ්ඨ කතුවරයෙක් වෙච්චි කේ.ජයතිලක මහත්මයා අපේ වැසිකිළි ඉතිහාසය අළලා ලිව්ව 'අපට වැසිකිළියක්' පොතෙන් උපුටාගත්තු කොටසක්. අපේ මිනිස්සු වැසිකිළි භාවිතේට හුරුවෙච්චි හැටියි ඔය කතාවෙන් කියැවෙන්නේ.

අපේ රටේ වැසිකිළි භාවිතා නොකරන උදවිය දැන් නම් අවමයි. හැබැයි අපේ අසල්වැසි ඉන්දියාවේ මිනිස්සුන්ගෙන් 40%ක්ම තවමත් ඔය වැඩේ කරන්නේ පඳුරුවලට මුවාවෙලා.

ප්‍රියංකා භාරතීට අවුරුදු 19යි. ඇගේ ගෙදර වැසිකිළියක් තිබුණත් ඇගේ සැමියගේ ගෙදර වැසිකිළියක් නැහැ. ඒ නිසා කසාද බැඳලා අවුරුද්දක් යන්න කලින් ප්‍රියංකා ඇගේ සැමියව දලා ගිහිල්ලා. ඔය සිද්ධිය පාදක කරගෙන 2017දී 'ටොයිලට්' කියලා චිත්‍රපටයක් හැදෙනවා. මේකේ ප්‍රධාන චරිතය කේෂව්. ගෙදරක වැසිකිළියක් හදන එක පෞරාණික සිරිත්වලට එරෙහිව යන්නක් විදියටයි ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල අදටත් සලකන්නේ. ඉතින් ඒ වගේ පරිසරයක ඉඳගෙන බිරිඳ වෙනුවෙන් කේෂව් වැසිකිළියක් හදන හැටියි මේ කතාවේ තියෙන්නේ. මේ චිත්‍රපටය බලපු ගොඩදෙනා තමන්ගේ නිවෙස්වල වැසිකිළි හදාගත්තලු.

ගෙදරක වැසිකිළියක් තියෙන එක විතරක් නෙමෙයි ඒ වැසිකිළිය පිරිසිදුවට තියාගන්න එකත් බොහොම වැදගත්. බැක්ටීරියා සහ විෂබීජ අපේ ශරීරයට ඇතුළු වෙන ප්‍රධානම මර්මස්ථානේ ඔතැනනේ. ඉතින් දවසට දෙපාරක්වත් වැසිකිළිය නැත්තම් බාත්රූම් එක පිරිසුදු කරන්න ඕනේ කියලයි වෛද්‍යවරු කියන්නේ.

ලෝකේ පරණම වැසිකිළිය හොයාගෙන තියෙන්නේ මොසපොතේමියාවෙන්. ඒක ක්‍රි.පූ. 3200 ගණන්වලදි හදපු එකක්ලු. සත්ව තෙල්, ශාක යුෂ වගේ දේවල් භාවිතා කරලා එව්වා පිරිසුදු කරලා තියෙන බවටත් සාක්ෂි තියෙනවලු.

ටොයිලට් පිරිසුදු කරන්න දැන් නම් අපි පාවිච්චි කරන්නෙ ටොයිලට් ක්ලීනර්. විංගලන්ත ජාතික හැර් පිකප් තමයි මුලින්ම අපි දැන් භාවිතා කරන ටොයිලට් ක්ලීනර් හදලා තියෙන්නේ. ඒ 1932දී.

මේ නිෂ්පාදනවලට සෘහෙන ඉල්ලුමක් තියෙන නිසා ඒද ඉඳලා මහාපරිමාණ කර්මාන්ත විදියටත් සුළු පරිමාණ ව්‍යාපාර විදියටත් ටොයිලට් ක්ලීනර් වර්ග හදනවා. ස්වයං රැකියාවක් විදියට ප්‍රමිතියෙන් යුතු ටොයිලට් ක්ලීනර් එකක් හදාගන්න හැටියි අද කියලා දෙන්නේ.

ටොයිලට් ක්ලීනර් ලීටර එකක් හදන්න මේ අමුද්‍රව්‍ය ටික සපයාගන්න. ලැබිසා 100g, (කුණු ඉවත් කිරීමට, පෙණ නැඟීමට), සෝඩියම් හයිපොක්ලෝරයිට් 50g (පැහැගැන්වීමට), HEC (Hydroxyethyl Cellulose) 8g (උකු ගතිය ගැනීමට), EDTA (Ethylenediaminetetraacetic Acid) 0.5g (කිවුල නැති කිරීමට), සුවඳ 2g, වර්ණක 0.2g. පිටකොටුවේ බංගසාල වීදිය, ඩෑම් වීදිය, සෙන්ට්‍රල් රෝඩ් වගේ තැන්වලින් මේ දේවල් ලාබෙට ගන්න පුළුවන්.

1 HECවලට වතුර ටිකෙන් ටික එකතු කරන ගමන් කැටි නොගැසෙන්න වේගයෙන් මිශ්‍ර කරන්න. පස්සේ ඒකට ලැබිසා එකතු කරලා දිය කරන්න.



2 පස්සේ මිශ්‍රණයට EDTA එකතු කරලා දිය කරන්න. සෝඩියම් හයිපොක්ලෝරයිටුත් එකතු කරන්න. අවසානයට පාට, සුවඳ දලා මිශ්‍ර කරන්න. මිශ්‍රණයේ pH අගය 10ක් වෙන්න ඕනේ.

මෙහෙම හදාගන්න ටොයිලට් ක්ලීනර් 500mlක් රුපියල් 400-500 අතර මිලකට අලෙවි කරන්න පුළුවන්. මේ ගැන තවත් විස්තර දැනගන්න 0714766819 අංකයට කතා කරන්න

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

අවසරයි

බියංකා නානායක්කාර ලියයි

103 කොටස

සෙනෙහෙලතා මැණිකේගේ ඉකිබිඳුම් හඬ ඇසුණේත් අංජනා එතැනින් නැගිට්ටේත් එකවරය. අංජනා හිතුවේ එය ඔහුගේ පෞද්ගලික ඇමතුමක් නිසා ඔහුට රිසිසේ කතා කරන්නට ඉඩ දී යන්නටය. සෙනෙහෙලතා මැණිකේගේ ඇඬුම් හඬ ළඟ හිත කලබල වූ නිසා, අංජනා ඇල්ලේපොල එතැනින් නැගිට යෑම වළක්වන්නට ඔහුට බැරිවුණේය.

"අම්මා... මොකද? ඇයි අඬන්නේ..?"

සෙනෙහෙලතා මැණිකේ අඬන්නේ මොනවටදැයි සිතාගන්නට තේනුකට නොහැකි විය. ඇය අඬන්නේ අප්පච්චිට කරදරයක් වීද කියාත් හිතෙද්දී ඔහුට පුටුවේ ඉඳ සිටින්නට අපහසු වුණේය. තේනුක බණ්ඩාර හිඳ සිටි තැනින් නැගිට දුරකතනය කන රුවාගෙනම සාලයේ එහා කොනට ඇවිද්දේය.

"අප්පච්චි ඉස්පිරිතාලෙ..."

"මං ඒ ගැන අහන්න තමා කතා කළේ. මොකක් වෙලාද..? අමාරුවක් නෑ නේද..?"

"දන්නෙ නෑ..."

"දන්නෙ නෑ... ඔයා එහෙනම් ඇඬුවෙ..? තාම අප්පච්චිව බැලුවෙ නැද්ද..?"

"නෑ දරුවෝ..."

එතෙක් ඇඬුම්බරව කතා කළ සෙනෙහෙලතා මැණිකේ සාමාන්‍ය තත්ත්වයට පැමිණි බව තේනුකට දැනුණේය. ඇය කියන කතාවේ තේරුම් ගත නොහැකි අපැහැදිලි බවක් විය.

"අම්මා... අම්මා ඉන්නෙ හොස්පිටල් එකේ නම් ඇයි අප්පච්චි බලන්න මෙච්චර වෙලා ගන්නේ..?"

"ලොකු පුතා කිසි දෙයක් කියන්නෙ නෑ. මට දුක හිතුණෙ ඒකයි. අප්පච්චි තාම හදිසි ප්‍රතිකාර ඒකකේලු. වාට්ටුවට දානකම් ඉන්න ඕනලු බලන්න..."

තේනුක තෙන්නකෝන් මදක් නිහඬ වුණේය. රෝහල් කටයුතු ගැන ඒ තරමින් නොදන්නා නිසා තවත් ප්‍රශ්න අසා වැඩක් නැත.

"මං එන්නම් අම්මා... ඉන්නකෝ."

"එපා දරුවො මේ වෙලේ මගට බහින්න. මහ වැස්සක් වහින්න ළඟයි. අහස හතරවටින් කළු කරලා..."

සෙනෙහෙලතා මැණිකේ කීවේ බොරු නොවේ. ජයවර්ධනපුර අහස අඳුරු වලාවෙන් පිරී තිබුණේය.

"ඔයා දැන් එක වතාවකුත් කොළඹ ඇවිත් ගියානේ. ඉන්නකො, මං අප්පච්චි බලලා ඔයාට කතා කරන්නම්..."

ඒ ඇමතුම අවසන් වෙද්දි ඔහු මේනක බණ්ඩාර තෙන්නකෝන්ගේ දුරකතනයට කතා කළේය. රෝහල් කොරිඩෝරයේ ඇවිද එමින් සිටි මේනක සොහොයුරාගේ ඇමතුම ගත්තේය.

"මං මේ ඔයාට කතා කරන්න හිටියෙ. මං හිතන්නේ ඔයා කාරණාව දැනගෙන වෙන්න ඕන කතා කරන්නේ..."

"ඔව්... අප්පච්චිට මොකද..?"

"හාට් ඇටෑක් එකක් ඇවිත් තියෙන්නේ. එකක් නෙවේ එක පාර දෙකක් ඇවිත් වගේ කියලයි ඩොක්ටර් කියන්නේ. දැන් ඉන්නේ අයිසීයූ එකේ මැෂින්ස්වල..."

තේනුකට එක්වරම කෘත්‍රිම ශ්වසන ආධාරක උපකරණවලට මැදිවී සිටින තෙන්නකෝන් බණ්ඩාරගේ රුව මැවී පෙනුණේය. ඔහුගේ හදවතේ ඉදිරියට ආවේ තෙන්නකෝන් බණ්ඩාර නම් ඇමතිවරයා නොව ගමේ සිටි අවදියේ හිත ළඟ හුන් අප්පච්චිය.

"මං දැන් එනවා..."

"අම්මා තාම දන්නෙ නෑ මේ තත්ත්වෙ. මට කියාගන්න විදියක් නැතුව ඉන්නෙ. අප්පච්චි අයිසීයූ කියපු ගමන් එයා කලබල වෙනවා... මේ අප්පච්චි ළඟ ඉන්න මෝඩයෙක් අම්මව හොස්පිටල් ගෙන්නලනේ, මං දන්නෙත් නැතුව..."

ජීවිතේ කිසි දවසකත් නොදැනුණු සහෝදර සුවඳක් ඒ මොහොතේ මේනක තෙන්නකෝන් වෙනුවෙන් තේනුකගේ හදවතේ දැනෙන්නට විය. මෙතුවක් කාලෙකට ඔහු හා තරඟ කරන්නට තරහකාරයෙකු සේ පැමිණි මේනක ගැන ඒ මොහොතේ වැඩිමල් සහෝදර හැඟුමක් තේනුකගේ හිතේ අලුතින් දලු දැම්මේය.

"මං ඉක්මනින් එන්නම්..."

"ඉක්මනින් එන්න වාහනේ හයියෙන් එලවන්න එපා. ඔයාට මේ පාරවල් හුරුත් නෑ. අනික පුංචි වාහනවල වේගෙන් යන්නත් හොඳ නෑ..."

තේනුක තෙන්නකෝන්ට අංජනා මතක්වූයේ ඇමතුම අවසන් වූවාට පසුවය. ගෙවෙන දිනයේ සිදුවන්නේ ඒ තරම් හොඳ නැති දේවල් බව සිතමින් ඔහු ඇඳුමක් ඇඳගන්නට කාමරේට ගියේය. ඇය ඇඳේ හාන්සි වී කල්පනාවකට වැටී සිටියෙන් ඔහු එනවා දුටුවේ නැති ගානය. අංජනා දකිත්ම මොහොතකට පෙර වූ සිදුවීම් වැල යළිත් සිහිවීමෙන් හිත තවත් බරවුණේය.

"නෝනා... මොකද කල්පනාව? ඔය කල්පනාවේ මමත් ඉන්නවා නේද..?"

ඇඳේ ඉඳ නොගෙනම ඇගේ මුහුණට නැවී ඔහු අසද්දී අංජනාගේ දෙතොළතර යන්තම් හිනාවක් ඇඳුණේය.

"ඔයා ඉස්සර වගේම හිනාවෙලා කතා කරලා ඉන්න. ඔහොම ඉන්නවා දකිද්දි මට දුකයි නෝනා. මගෙ හිත කියනවා මං ඔයාගෙ සතුට නැති කළා කියලා..."

අංජනා ඔහුගේ අතින් අල්ලාගෙනම ඇඳේ ඉඳගත්තාය. එවන් මොහොතක් අතහරින්නට ලෝබ වුවත් ඔහුට පමාවෙන්නට බැරි බව හිත මතක් කළේය.

"නෝනා... මං කොළඹ ගිහින් එන්න ඕන. ජයවර්ධනපුර හොස්පිට්ල් එකට. අප්පච්චි අසනීප වෙලා ඇඩ්මිට් කරලා..."

"ආයෙත් වහින්න වගේ... ඒත් අප්පච්චිට අසනීප නම් යන්න. ඔයාගෙ අම්මත් දුකෙන් ඇත්තේ..."

"ඔව්... මං ඔයාට ඇවිත් විස්තර කියන්නම්කෝ..."

ඇයත් සමඟ කතා කරමින්ම ඔහු කලිසමක් හා ටී ෂර්ටයක් ඇඳ ගත්තේය.

"මං වෙන දෙයක් නම් මේ වෙලාවෙ ඔයාව තනියම දලා යන්නෙ නෑ නෝනා. ඒත් අප්පච්චිට ටිකක් අමාරුයි වගේ..."

ඔහු කීවේ ඇත්තමය. එය සාමාන්‍ය ලෙඩක් අසනීපයක් වූවා නම් ඔහු නොයා ඉන්න හොඳටම ඉඩ තිබුණේය.

අංජනාට ආත්මාර්ථකාමීවන්නට සිතුණේ නැත. ඊටත් ඇය හොඳින් අම්මෙකුගේ අප්පච්චියෙකුගේ අගය දන්නීය.

"ගිහින් එන්න. ලෙඩ වුණාම දෙමාපියන්ට දරුවො දකින්න ඕන වෙනවා. හයියෙන් යන්න එපා. ආයෙත් වැස්සක් එන්නත් වගෙයි..."

ඇය ඇඳෙන් බැස ඔහු පසුපසින් පඩිපෙළ බැස ආවාය.

"මං ඉක්මනට එන්නම් නෝනා... ඔයා ටිකක් නිදගන්න දෙරවල් වහගෙන. රෑ වුණොත් කමල් එයි. එයා ගාව දෙරේ යතුරක් තියෙනවා. ඇරගෙන එයි..."

ඇගේ මුහුණ දෙස බලා සිට ඔහු හිත ඈ ළඟ තබා ගොස් ගේට්ටුව ඇරියේය. ඔහුගේ වාහනය ගේට්ටුවෙන් පිටව නොපෙනී ගිය පසු අංජනා ගේට්ටුව වසා දමා උඩුමහලට නැගුණේය.

තේනුක රෝහලට යනවිට සවස රෝගීන් බලන වෙලාවට ආසන්න විය. ඒ නිසා දෙරටු ළඟ සෑහෙන සෙනඟක් විය. රෝහල තුළට යා යුත්තේ ආරක්ෂක නිලධාරියා හරහාය. තේනුක ඔහු ළඟට කිට්ටු කළේ ඔහු ඇතුළට යන්නට දේ දැයි සැකයෙනි.

ආරක්ෂක නිලධාරියා තේනුකගේ හිසේ සිට පාදාන්තය තෙක් බැලුවේය. ඒ ගේට්ටුවෙන් කීපවරක් එළියට ඇතුළට ගිය මේනක තෙන්නකෝන් ඔහුට මතකය. මේ ඔහුම වන්නට ඇතැයි ආරක්ෂක නිලධාරියාට සිතුණි.

"යන්න සර්... තවම ඇමතිතුමා අයිසීයූ නේද..?"

තේනුකට පුදුම සිතුණි. ඒ අප්පච්චි ගැන දන්නා මිනිසුන් සිටීම ගැනත් තමන් අප්පච්චිගේ පුතෙකු බවට ඔහු හඳුනාගැනීමත් නිසාය. සොහොයුරා හා අම්මා සිටින්නේ කොතැනදැයි දැනගන්නට ඔහුට ඇමතුමක් ගත්තේය. මේනක ඔහු ඉන්නා තැන අසාගෙන එනතුරු එහිම සිටින්නැයි කීවේය. තේනුක තෙන්නකෝන් ඇමතුම අවසන් කර දුරකතනය කමිසයේ උඩ සාක්කුවට දමාගත්තේ ඉදිරි කොරිඩෝරය දෙස බලමිනි.

"ඔයා කිට්ටුවටම ඇවිත්... යමු. වෙලාවට චතුමිණී අම්මා එක්ක ඉන්නෙ. කවුරු වුණත් ගෑනු අඬද්දි මට නම් නළවන්න තේරෙන්නෙ නෑ."

මේනක බණ්ඩාර තෙන්නකෝන් ආවේ ඔහු පිටුපා සිටි දෙසිනි. ආරක්ෂක නිලධාරියා තමන් දන්නවා සේ කතා කරන්නට හේතුව මේනක දුටු සැනින් ඔහුට අවබෝධ විය. ඔහු ඇඳ සිටියේද තමන් ඇඳි ඇඳුමට සමාන ඇඳුමක් බව දකිද්දී ඔහුට යන්තම් සිනාවක්ද නැගුණි.

"අප්පච්චිට ඇත්තටම මොකද? එයා ඔහොම ලෙඩවුණ කෙනෙක් නෙවෙයිනේ..."

ඔහු පසුපසින් කොරිඩෝරය දිගේ යද්දී තේනුක කීවේය. ඔවුන් දෙදෙනා කොරිඩෝරයේ ඇවිද යමින් සිටියේ සමාන්තරවය.

"අප්පච්චි මේ පහුකරන අවදනම් පැය ගාණ පහුකරගත්තොත් බලාපොරොත්තු තියන්න පුළුවන් කිව්වා..."

තේනුකගේ හදවත් පතුලෙන් ගින්නක් ඇවිලුණා සේ දැනුණි. ඔහුට එක්වරම අංජනාගේ අප්පච්චි මතක් විය. ඔහුට දිවි හැරයන්නට හේතුවූයේද හෘදයාබාධයකි.

"මං අම්මට ටිකක් කිව්වා. ඔය අවදනම් කතන්දර කිව්වෙ නෑ. මේ වෙලාවෙ එයා හොඳින්, ඒත් තව පහසුවෙන්න මැෂින්වල අයිසීයූ ඉන්නෙ කියලා. ඒක ඇහුවා විතරයි ඔන්න ඇස් දෙකේ කඳුළු පිරුණා. ඇඬුවෙ නම් නෑ. ඩොක්ටර් කිව්වා දුක හිර කරන් ඉන්නවට වඩා එයාට දුක පිට කරන්න දෙන්න කියලා..."

චතුමිණී හා සෙනෙහෙලතා මැණිකේ ඉඳසිටි බංකුව ළඟ තේනුක නැවතුණේ වචනයක් හෝ කතා නොකරමිනි. ඔහු සෙනෙහෙලතා මැණිකේගේ උරහිසට අතක් තබා ඒ මුහුණ බැලුවේය. ඇස්වලට අලුතෙන් කඳුළු එක්වී නලියන්නට මහ වෙලාවක් ගියේ නැත. අම්මාගේ හිත සැනසෙන්නට කිසිවක් හෝ කියන්නට ඔහු ඇගේ මුහුණ ළඟට නැමුණේය. උඩ සාක්කුවේ වූ දුරකතනය රෑටා විත් බීම වැටෙද්දී චතුමිණී වහා එය අහුලා ගත්තාය.

ලබන සතියට

ඉස්සර වගේ හිනාවෙලා ඉන්න නෝනා... ඔහොම ඉන්නවා දකිද්දි මට දුකයි

කවියාය

පිටු සලකුණ

පොතක පිටු පෙරලද්දී
අතරමැදදි හමුවුණි
ඔබ තැබූ පිටු සලකුණක්

ඉතුරු පිටු කියවන්න
ඔබ යළිත් නොඑන බව
පැවසුවත් උඩුසිත මට

යටි සිතට අවනතව
පිටු සලකුණ ඉවත්
නොකළෙමි තවම මම

මාලනී රුපිකා පුංචිහේවා

සිතක පැතුම්

පොඩි කල මවගෙ සෙනෙහස ලබමින් ඇකයේ
ගෙවුයෙමි දිවිය හොඳ නොහදින් මා සසරේ
හදිසියෙ පැමිණි මගෙ දිවියට නුඹ මිතුරේ
ඇයි මේ ලෙසින් මා වියොවින් තනි කෙරුවේ

සිත තුළ නැගුණ සොව නිවුණේ කවියෙන්ය
පැතුමන් පැතුවෙ ඔබ මට හමුවන ලෙසය
එනමුත් ඔබ මගේ ලොව තුළ අද නැතය
මිරිඟුව පසුපසින් මා බොහෝ දුර ගොස්ය

ඉන්ද්‍රානි ස්වර්ණලතා
කටුපිටිය

පුතාගේ තාත්තේ

කන්ද උඩින්
සඳ පායා එනවිට
මදනළ ඇවිදින්
නුඹේ සුවඳ මට
ගෙනත් දෙනා අන්දම්
සඳට කිව්වා මං
සුබ පණිවිඩයක්
වෙන කුමක් කරන්නද මං
ඔබ වැනි රුව ඇති
පුතෙක් ලබන්නට
පින් කර ඇත සුදු මං
දරුවා ලැබෙන්නට
දින ළඟයි දැන්
ගෙදර එන්න මගෙ රන්

දයානන්ද
පොන්නම්පෙරුම

කවුරු දනී

ගැලූ කඳුළු කොපමණදැයි දෙනෙත දනී
හෙලූ සුසුම් කොපමණදැයි මහද දනී
මැවූ සිහින කොපමණදැයි මසිත දනී
මට පිටුපා ඇ ගිය බව කවුරු දනී

ධර්මදාස කහල්ල
ගම්පොළ

මතක සැමරුම්

එදා ඔබ හමුවෙලා
ඔබේ තුරුලට වෙලා
පෙම් සුවඳ වින්ද මා
සදකල් ඔබෙ වුණා

දෙමාපිය හැර දමා
ඉගෙනුමද නවතලා
ඔබේ සෙනෙහස සොයා
එදා මා ඉගිලුණා

කාලයද පියඹලා
මා මවක් වී මෙදා
දරුවන්ද ලොකු වෙලා
තවම මා තනිවෙලා

ආදරය කෝ එදා
මා අතරමං වෙලා
ආදරය කියා මා
මිරිඟුවට රැවටිලා

එච්.පී.හර්ෂනී සමන්ලතා
කඩුගන්නාව

පතිනිය

පතිනිය මමයි හිමියනි ඔබෙ අත ගත්ත
දැඟිලි බැඳුනෙ අපෙ එය කරමින් සත්ත
ජීවන ගමන යමු අරගෙන හරි පැත්ත
නැතිනම් අපේ ජීවිතයම වෙයි තිත්ත

හිමියනි කිසිදෙනෙක මා ප්‍රම්ලාවක් නොවෙමි
දස්කොන් කෙනෙක් වෙත සිනිනෙන්වත් නොයමි
හුස්මකටවත් අනෙකකු වෙත ළං නොවෙමි
ඔබෙ ගෞරවය කෙලෙසන කැළලක් නොවෙමි

යන්නට පැතුවෙ අප දෙදෙනා එකම මග
නොයනෙමි ඔබව හැර කිසිදු අතරමග
නිරුවත් නොවෙමි මා අන් පිරිමියෙක් ළඟ
නොපතමි අන් සැපයක් කුලගෙයි සිරිත් බිඳ

සී.නිලන්ති ප්‍රනාන්දු
ග්‍රීන් සොයිල් ආයතනය, දුන්කන්නාව

කවියාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.
''කවි යාය''ධරණී' කර්තෘ මණ්ඩලය, අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk ලිපිනයට ඊමේල් කරන්න

ලීසිං ඇති / නැති
ඕනෑම වාහනයක්
අත්පිට මුදලට මිලට
ගනු ලැබේ. කාර්, වෑන්,
ලොරි, බයික්.
077 - 379 74 81

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණි
බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහළ මිලක්
076 101 88 53

සංවර්ධිත බැංකු ඇබෑර්තු
★ බැංකු ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් තනතුරු කිහිපයක අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
වැටුප 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0712 564 715 | 0703 346 072
0774 024 155 | 0702 725 731
0761 125 624 | 0702 231 694

ඔබගේ සැමියා / දරුවා මත්ද්‍රව්‍යවලින් බේරා ගන්නේ කෙසේද? අදම අමතන්න
▪ සැමියාගේ/ බිරිඳගේ අයුතු සම්බන්ධතා නවතා ගත නොහැකිද?
▪ පෙම් සබඳතා බිඳ වැටී ඇත්ද?
▪ විවාහය ඉක්මන් කරගන්න
▪ දරුවා සා.පෙළ/ උ.පෙළ විභාගවලින් ඉහළින්ම සමත් කරන්නේ කෙසේද?
▪ ව්‍යාපාරය කඩා වැටුණාද?
උපන් දිනය සහ වේලාව සමඟ අමතන්න
071 031 4878
දශක 4ක් පුරාම අසරණ ජනතාව මුදාගත් ජාත්‍යන්තර කීර්තියට පත් ගුප්ත විද්‍යා විශේෂඥ, සද්ධර්ම කීර්ති ශ්‍රී ජෝර්ති විද්‍යාශූර විභාරාධිපති අති පූජ්‍ය වේරපිටියේ ඥානීස්සර වෙද හාමුදුරුවෝ පුරාණ විභාරය වේරහැන්න, වේරපිටිය.

මාගේ සැමියාව මත්ද්‍රව්‍ය උවදුරෙන් බේරා දුන් නිසා රත්නපුරයේ කුමාරි විසින් මෙම දැන්වීම පළ කරන ලදී

ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2022 / 2023 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

ක්ෂණික ඇමතුම් -0777 444908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස
- 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වෑවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැඟ හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉඳිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මඟින් ඔබ අතට ඉක්මනින් විසඳුම්
0094 37 22 48828

රැකියා ඇබෑර්තු

ගාල්ල නිවසක නැවතී සේවයට කාන්තාවක් උවමනා යි.

091 2 274 999
076 3 792 043
076 2 299 750

ගණිතය, විද්‍යාව (සිංහල මාධ්‍ය/ English Medium) 6 -11 Theory/Revision වසර 24ක් පලපුරුදු නව විෂය නිර්දේශය පිළිබඳ මනා දැනුම ඇති උපාධිධාරී ගුරුවරයෙකු නිවසට පැමිණේ. උත්තරපත්‍ර පරීක්ෂක Counselor මතක තබාගැනීමේ විශේෂ කෙටික්‍රම පරීක්ෂණ නිවසේදීම "A" සාමාර්ථය තහවුරු කරයි. දුර්වල සිසුන් පිළිබඳ විශේෂ අවධානය, Home visit බස්නාහිර පලාත තුළ online දිවයින පුරා.
076 814 29 56 / 078 907 64 06

ඔබ දෙවයට පිටුපායිද.. ? දෙවය ඔබට පිටුපායිද.. ?

- ජීවිතයේ අතීත සහ වර්ථමාන සිදුවීම් ඔබ විමතියට පත්වන අයුරින් පැවසුවහොත් ඔබට අනාගතයේ සිදුවන දෑ ගැන විශ්වාස නොකර සිටිය හැකිද ?
- වසර 45 කට වැඩි පර්යේෂණාත්මක අධ්‍යයනයන් සමග හස්ත රේඛා ශාස්ත්‍රයෙන් ඔබේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීමට හමුවන්න.

හස්ත රේඛා විශේෂඥ
එස්. කෝරලේගේ
520, වාසනා මාවත, කොට්ටාව, පන්නිපිටිය,

සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හි
පෙ.ව 9.00 සිට ප.ව 5.00 දක්වා හමුවිය හැක.

0112 783172 / 0773 775094

මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.

නැතහොත් ලිපියක් මඟින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?

මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම

* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව

* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට

*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට
ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.

වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන්
පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර
චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

මෙලොව ඉපදුණ කාටත් තමන්ගේම කියා කතාවක් ඇත. ගීතාගේ කතාවේනම් තිබුණේ වේදනාව, බය සහ කඳුළු පමණි. එදා ඇය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මදි නොකියන්නට බැටකෑවාය. නමුත් අද ඇය ලෝකයක ආදරය දිනූ තරුණියක් බවට පත්ව ඇත. බොලිවුඩයේ ත්‍රාසජනක ජවනිකා රඟ දක්වන සුරූපී නිළියන් අතර ප්‍රමුඛස්ථානයක් දිනාගත් ඇය ගීතා තන්ඩන් ය. ගින්නෙන් දැවී අලු වී ගියද නැවත ගින්නෙන්ම උපදින ෆීනික්ස් කිරිල්ලියක බඳු වූ ඇගේ කතාවයි මේ.

බඩේ දරුවෙක් ඉන්නවා කියලා දැනගෙනත් එයා මට ගෑස් සිලින්ඩරේකින් ගැහුවා

බය හිතෙන ජවනිකා රඟපාන බොලිවුඩ් නිළියන් අතර නම් දිනූ ගීතා තන්ඩන්

ගීතා තන්ඩන් දරු දෙදෙනා සමග

මහත්තයාගෙන් ගුටිකන එක පොලිසි එන්න තරම් හේතුවක්ද? කියලා මුම්බායි පොලිසිය මගෙන් ඇහුවා

ඉන්දියානු තරුණියක වූ ගීතාට මංගල සීනු හැඬවුණේ ඇයට යාන්තම් වයස අවුරුදු 15 පිරෙද්දීය. ඇගේ කැමැත්ත අකමැත්ත බල්ලාට දැමූ පවුලේ උදවිය හිතුමතේට ඈ දීග දෙන විට කසාද ජීවිතයක දිගක් පළලක් ඇය දැන සිටියේ නැත.

"මට අවුරුදු නවයක් වෙනකොට අම්මා නැතිවුණා. තාත්තා තමයි ඊටපස්සේ මාව බලාගත්තේ. මට තව අක්කලා තුන්දෙනෙක් හිටියා. ඉතින් අම්මා නැතිවුණාට පස්සේ පවුලෙන් මට ගොඩාක් වෙනස්කම් වුණා. මම පවුලට බරක් කියලා තමයි හැමෝම හිතුවේ. ඒකයි ඕන දෙයක් වෙන්න කියලා ගෙදරින් ගෙනාපු මංගල යෝජනාවට කැමතිවුණේ."

මුලින් මුලින් කොකා සුදට පෙනුණත් ඌ සුදුම සුදු නොවන බව පෙනෙන්නට ගත්තේ ඉගිලෙන විටය.

විවාහයෙන් සතියක් දෙකක් ගතවෙද්දී සැමියාගේද නියම ස්වරූපයද එළියට එන්නට පටන්ගත්තේය. දිනක් ඔහු නිවසට ආවේ හතරගාතයෙනි. එක්වරම ගීතා සමීපයට පැමිණි ඔහු ඇයව වේගයෙන් සිපගත්තාය. පසුව ඇයව ඇඳට පෙරලාගෙන ලිංගිකව හැසිරුණේය. ඒ සියල්ල තුළ තිබුණේ ආදරය නොව ඉහවහා ගිය විකෘති ආශාවන් සමුදායකි.

"එදා ඉඳන් කසාද ජීවිතේ මට වහකදුරු වගේ වුණා. හැබැයි ඒ ටික තේරුම් ගන්නකොට පෙරහර ගිහින් ඉවරයි. එයා හොඳටම බොන කෙනෙක්. බිව්වම එයාට විකෘති ආශාවන් එනවා. මං තමයි ඒකෙන් තැලුනේ. සමහර දවස්වලට මං කිසිම වැරැද්දක් නොකරත් එයා මට අතට අහුවෙන එකෙන් ගැහුවා. එහෙම ගහලා සතුටුවුණා."

බලා ඉන්නට බැරිම තැන ගීතා ගොසින් නැන්දම්මා මුණගැසුනි. නමුත් ඇයද පුතාට සුදුහුණු ගෑවා මිසක ලේලිය කී දේ තඹ දෙයිතුවකට මායිම් කළේ නැත. නමුත් නැන්දම්මා මතක ඇතුව එක් දෙයක් කළාය. ඒ ඇය හමුවීමට ලේලිය පැමිණි බව පුතාගේ කනේ තැබීමයි. එපමණක් නොව තමා හමුවට පැමිණ ඔහුගේ වැරදි කී එකට අමානුෂික දඬුවමක් දෙන ලෙසද පුතාට පැවසුවාය. දඬුවම වූයේ ගීතාව නිරුවත්කොට ඇයව පිටස්තරයෙකු දූෂණය කරන සේ දූෂණයට ලක්කිරීමයි.

"ඔය විදියට අවුරුදු පහක් හිටියා. ඇත්තටම හිටියා නෙවෙයි ඉන්න වුණා. ඒ වෙනකොටත් මං සැමියා දීපු වදත් එක්ක ගොඩාක් දුර්වල කෙනෙක්. ඔය අතරේ බඩට දරුවෙක් ආවා. මං හරිම සතුටුවුණා දරුවා ලැබුණම හරි එයා වෙනස්වෙයි කියලා. ඒත් ඒ මනුස්සයා තවත් කුරිරු වුණා. මට මතකයි දරුවා බඩේ ඉන්නකොට එයා මට ගෑස් සිලින්ඩරේකින් දමලා ගැහුවා. තවත් දවසක කඩුවකින් ඇඟ හැමතැනම තුවාල කළා. එයා ගොඩාක් සතුටුවුණේ මගේ ඔලුව බිත්තිවල හප්පලා. සමහර වෙලාවට එයා පස් හය වතාවක් මගේ ඔලුව බිත්තියේ හප්පලා සතුටුවුණා."

පසුව දරුවන් දෙදෙනෙකුට මව වූ ගීතාට එකී ජීවිතය ගැන තිබුණේ කම්පාවකි. විටෙක ඇයට සියදිවි නසාගන්නට පවා සිත්විය. එවැනි තීරණයකට සිත ඇයව තල්ලු කරන හැම මොහොතකම දරුවන් කෙරේ උපන් ස්නේහය විසින් ඇය යළි යළිත් ආපස්සට ඇද්දය. අවසානයේ වෙනත් විසඳුමක් නැති තැන ඇය මුම්බායි පොලිසිය වෙත ගියේ නීතියේ පිළිසරණක් හෝ පැතීමටය. නමුත් පොලිසියෙන් ඇයට ලැබුණේ අස්වැසෙන පිළිතුරක් නම් නොවේ.

"මහත්තයාගෙන් ගුටිකන එක පොලිසි එන්න තරම් හේතුවක්ද? ඒක සාමාන්‍ය දෙයක්නේ. ඕනම නම් ඔයා ඔයාගේ අම්මලාගේ ගෙදර ගිහින් ටික දවසක් එහේ ඉඳලා එන්න. එතකොට ඔය ප්‍රශ්නය අකාමකා ගිහින් තියේවි."

ඇගේ අවසන් බලාපොරොත්තුවත් ඒ විදියට සුන්වී ගියේය. නිවසට ආ ගීතාට තවත් එහි වෙසෙන්නට එකදු හේතුවක් හෝ තිබුණේ නැත. ඒ නිසා ඇය දරුවන් දෙදෙනාද රැගෙන සැමියාගේ නිවසින් පිටව යාමට තීරණය කළාය. නමුත් ගීතාට යන එන මං නැති බැව් දන්නා සැමියාත් ඔහුගේ පවුලේ උදවියත් ඇයට අභියෝගය කළහ. ඒ හැකි නම් තනිව ජීවත් වී පෙන්වන ලෙසයි.

"ඒක ඇත්තටම මට අභියෝගයක් වුණා. ඒත් ඒ බවක් මං එයාලට පෙන්නුවේ නෑ. හැබැයි මං හිතාගත්තා මං කවුද කියලා ඒ අයට ඔප්පු කරලම පෙන්නනවා කියලා. ඊටපස්සේ මං ගිහින් මුම්බායිවල පොඩි කාමර කෑල්ලක් ගත්තා. මට උවමනා වුණා රැකියාවක් කරන්න. ඒත් මං ඉගෙනගත්තේ නැති කෙනෙක් නිසා කවුරුත් රැකියාවක් දෙන්න කැමතිවුණේ නෑ. ඔය අතරේ මට හොඳට සල්ලි හොයන්න පුළුවන් කියලා ගණිකාවක් වෙන්න යෝජනා කරපු අයත් හිටියා. ඒ මිනිස්සුන්ට මං කිව්වා දරුවෝ බඩගින්නේ මැරුණත් තවත් පිරිමියෙක් ළඟ වහලියක් වෙන්න මං ලෑස්ති නෑ කියලා."

මේ අතරතුරේ අහම්බෙන් හමුවූ ගීතාගේ පැරණි මිතුරියක් ඇයට අපූරු යෝජනාවක් කළාය. ඒ බොලිවුඩ් චිත්‍රපටවල ත්‍රාසජනක ජවනිකා රඟපාන නිළියකට රඟපාන්නට යන ලෙසයි. ගණිකාවකට අඳින්නට අකමැති වූ ගීතා නිළියකට අඳින්නට එකපයින් කැමති විය. ඇරත් සැමියාගෙන් ගුටි කකා සිටි ඇයට ත්‍රාසජනක ජවනිකා යන්න අරුමයක්ද නොවන්නට ඇත. ඒ අනුව ඇය අධ්‍යක්ෂවරයෙක් හමුවීමට ගියාය. එහිදී රඟපාන්නට අවස්ථාවක්ද හිමිවිය. නමුත් කරුමයක මහත. මුල්ම රඟත කිරීමේදීම අනතුරකට ලක්ව රෝහල්ගතවීමට ඇයට සිදුවිය.

"ඒත් මං ආයෙත් චිත්‍රපටවල ත්‍රාසජනක ජවනිකා කරන්න ගියා. මට ඕනතරම් වැඩ ලැබුණා. ඒ විතරක් නෙවෙයි මට හොඳ ගෙවීමකුත් ලැබුණා. ඒ මුදල්වලින් දරුවන්ට ඉගැන්වුවා. මමත් මං වෙනුවෙන් ගොඩක් දේවල් කරගත්තා. බිංදුවටම වැටිලා හිටපු මං නැගිට්ටේ එහෙමයි."

එලෙසින් නැගිටගත් ඇය අවසන නැවතුනේ බොලිවුඩ් සිනමාවේ ප්‍රසිද්ධම ත්‍රාසජනක නිළියක බවට පත්වෙමිනි. එපමණක් නොව ඇයව තම චිත්‍රපට සඳහා දැයක කරගන්නට බොලිවුඩයේ අධ්‍යක්ෂවරුන් අතර තරඟයක් පවා නිර්මාණය විය.

"මේ ලෝකේ තමන් වෙනුවෙන් හඬක් නඟාගන්න බැරි ගොඩාක් කාන්තාවෝ ඉන්නවා. මං හිතනවා මගේ කතාව බැලුවොත් ඒ අයට උත්ප්‍රේරණයක් වෙයි කියලා. ජීවිතයට ඕනතරම් අභියෝග එනවා. ඒ අභියෝගවලට මුහුණදෙන ගමන් ජීවත්වෙන එක තමයි ජීවිතය කියන්නේ. දැන් මගේ ඉලක්කය බොලිවුඩයේ පළමු කාන්තා සටන් අධ්‍යක්ෂවරිය වෙන එක. මං දන්නවා මට ඒක කරන්න පුළුවන්."

මේ හිත හයිය ගැහැනිය අද සිනාමුසු මුහුණින් කියන තවත් අපූරු කතාවක් තිබේ.

"මගේ සැමියාගේ පවුලේ අයට මං එක අභියෝගයක් කළා. ඒ ගැහැනියකගේ හයිය මං ඔප්පු කරලා පෙන්නනවා කියලා. එදා ඒ කියපු විදියටම මං ඒ හැමෝටම ඒක ඔප්පු කරලා පෙන්නුවා."

■ රුවන් එස්.සෙනවිරත්න

MOBILE

TRIPLE BUDDY

UNLIMITED DATA

SELFCARE APP එක හරහා හෝ
#170# අමතා ඇක්ටිවේට් කරගන්න.

ඇප් 3ටම

රු.444කට

(බදු ඇතුළත් වේ.)

දින 30ක් පුරාවට

TRC/M/PRO/20/07 කොන්දේසි සහිතයි.

www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොදයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.